asked the Minister of Agriculture & Lands: (*a*) Is he aware that (i) private contractors were allowed during the previous Government's term of office to fell trees and remove timber in such manner that mahogany, teak, satinwood, halmilla, and jak plantations developed at State expense were destroyed; (ii) persons were allowed with the collusion of Forest Department officials to sell about 50 trees to private saw mills for every hundred trees supplied to Government; (iii) contractors who had cleared forests in the Kurunegala and Kegalle Districts have been intercepted while transporting timber illegally and have been prosecuted by police; (iv) young plantations have been destroyed due to the felling of trees by contractors? (*b*) Does the law permit a timber saw mill owner to be given the contract to supply timber? (c) Was Ratnayake and Mirihella Co. Ltd., in which the former Deputy Minister of Trade and his nephew were shareholders, given such a contract during the previous regime?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එම්. ඒ. අබ්දුල් මජීඩ් මහතා (වැඩබලන කෘෂිකර්ම හා ඉඩම් ඇමතිතුමා)**

*(ஜனாப் எம். ஏ. அப்துல் மஜீத்—பதில் விவசாய, காணி அமைச்சர்)*

(Mr. M. A. Abdul Majeed—Acting Minister of Agriculture & Lands)

(a) (i) No. (ii) No. (iii) No contracts had been given for clearing of forests in Kurunegala and Kegalle Districts but service contracts had been given for thinning and removal or marked trees from jak-mahogany plantations. There have been no reported cases where service contractors had been prosecuted by the police for transporting timber illegally. In the following 27 instances, contractors have been fined the amount specified against their names for either damaging other trees within the plantation not meant to be felled or felling trees which had not been marked by the Forest Department.

| *Name of Job Work Agreement Holder* | *Levy in Rs.* |
|---|---|
| Messrs. Peter Amarasinghe ... .. | 1,268.60 |
| Messrs. Peter Amarasinghe .. .. | 144.00 |
| Messrs. Peter Amarasinghe .. .. | 272.20 |
| Messrs. Peter Aamarasinghe .. .. | 100.00 |
| Messrs. D. M. A. Dissanayake .. .. | 465.00 |
| Messrs. D. M. A. Dissanayake .. .. | 457.50 |
| Messrs. D. M. A. Dissanayake .. .. | 222.00 |
| Messrs. D. M. A. Dissanayake ... .. | 33.22 |
| Messrs. D. M. A. Dissanayake .. .. | 250.00 |
| Messrs. P. B. Herath .. .. | 100.00 |
| Messrs. P. B. Herath .. .. | 50.00 |
| Messrs. M. W. Somapala .. .. | 200.00 |
| Messrs. M. W. Somapala .. .. | 280.00 |
| Messrs. M. W. Somapala .. .. | 200.00 |
| Messrs. M. W. Somapala .. ... | 50.00 |
| Messrs. D. G. Rajapakse .. .. | 100.00 |
| Messrs. M. W. M. Bandarathileke .. .. | 555.00 |
| Messrs. M. W. M. Bandarathileke .. .. | 50.00 |
| Messrs. M. W. M. Bandaratileke .. .. | 192.00 |
| Messrs. M. W. M. Bandarathileke .. .. | 90.00 |
| Messrs. M. W. M. Bandarathileke .. .. | 21.00 |
| Messrs. M. W. M. Bandarathileke .. .. | 321.60 |
| Messrs. M. W. M. Bandarathileke .. .. | 87.53 |
| Messrs. M. W. M. Bandarathileke .. .. | 245.00 |
| Messrs. M. W. M. Bandarathileke .. .. | 801.00 |
| Messrs. M. W. M. Bandarathileke .. .. | 150.00 |
| Messrs. M. W. M. Bandaratileke .. .. | 200.00 |

(iv) No young plantation has been destroyed as a whole but where the number of young plants damaged was considered excessive by the Forest Department suitable action has been taken against the Job Work Agreement holder. (b) No. (c) Ratnayake & Mirihella Co. Ltd. were not engaged as service contractors for felling and removal of thinnings from jak-mahogany plantations but it is reported that Mr. M. W. M. Bandarathileke, one of the 6 service contractors engaged in this work, was the son-in-law of the former Deputy Minister of Trade, Mr. P. R. Ratnayake.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

There are about 11,900 acres of jak-mahogany plantations in the North Western Province. These had been planted by the Forest Department during the last 50 years. According to scientific forest management, certain selected trees have to be removed in the form of thinning. The trees selected for thinning are generally marked by officers of the Forest Department. Felling and removal of such trees is carried out by the STC through the agency of service contractors. The forest plantations are blocked out into areas known as compartments and short-term Job Work Agreements are signed by this corporation for removal of selected trees to the corporation saw mills and depots from the compartments.

During the course of felling and removal of selected trees, a certain amount of felling damage is bound to occur. If the damage to other trees is considered to be excessive, the Forest Department imposes certain levies which are collected by the Regional Manager, State Timber Corporation, from service contractors.

There were 27 reported cases which I have already listed where service contractors had either felled trees carelessly or felled trees which had not been marked for thinning but had been taken into stock for supply through the corporation depots.

There have been no cases reported to this corporation where service contractors engaged in these thinning operations were prosecuted by the police for transporting timber illegally.

All service contractors have to give an undertaking before they are given work that they do not own or operate a saw mill.

No service contract has been given to Ratnayake & Mirihella Co. Ltd. However, Mr. M. W. M. Bandarathileke who had been a service contractor from 1971 to 1977 is reported to be the son-in-law of the former Deputy Minister of Trade, Mr. P. R. Ratnayake.

**ජේ. එල් සිරිසේන මහතා (සමාජ සේවා නියෝජ්‍ය ඇමතිතුමා)**

*(திரு. ஜே எல். சிறிசேன—சமூக சேவை கள் பிரதி அமைச்சர்)*

(Mr. J. L. Sirisena—Deputy Minister of Social Services)

බිංගිරිය ඡන්ද කොට්ඨාශයේ පනිරෙන් ඩාවේ තේක්ක කැලයක් තිබෙනවා. මේ කැලය බාරව සිටින "ෆේපාරස්ට් ඔපිසර්" නම් නිළධාරි මහත්මයා දිනපතාම වාගේ මෙම කැලයෙන් තේක්ක ගස් කපාගෙන යනවා. වන්ඩින් පිරිසකුත් ලෑස්ති කර ගෙන, ගමේ මිනිසුන්ට ඒ පළාතටවත් එන්නට නොදී, මේ ක්‍රියාව දිගටම කර ගෙන යනවා. මා මේ ගැන කුරුණෑගල ප්‍රාදේශිය කැලෑ නිළධාරි මහත්මයාටත් දැනුම් දුන් නමුත් එතුමාත් තවම මේ ගැන කිසිම පියවරක් ගෙන නැහැ. තව ටික දවසක් මේ විධියට ගියොත්, වටේ තිබෙන තේක්ක පේලි දෙනතුනක් හැර අක්කර හාරපන්සියයක මුළු තේක්ක කැලයම අවසාන වෙයි. ගරු ඇමතිතුමා මේ ගැන නිසි පියවරක් ගන්නවාද?

**එම්. ඒ. අබ්දුල් මජීඩ් මහතා**

*(ஜனாப் எம். ஏ. அப்துல் மஜீத்)*

(Mr. M. A. Abdul Majeed)

If only the hon. Deputy Minister had brought it to our notice we would have definitely taken action. If the hon. Deputy Minister sends this to us in writing I will certainly take action on the complaint.

**සී. ආර්. බෙලිගම්මන මහතා**

*(திரு. சி. ஆர். பெலிகம்மன)*

(Mr. C. R. Beligammana)

Will the Hon. Acting Minister note that Mr. Bandarathileke is a shareholder of Ratnayake & Mirihella Co. Ltd. and that he is also a son-in-law of Mr. P. R. Ratnayake, *ex*-Junior Minister, the former Member of Parliament for Mawanella?



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එම්. ඒ. අබ්දුල් මජීඩ් මහතා**
*(ஜனாப் எம். ஏ. அப்துல் மஜீத்)*
(Mr. M. A. Abdul Majeed)

That fact I have mentioned. But that does not serve any purpose to check whether he is there.

**සී. ආර්. බෙලිගම්මන මහතා**
*(திரு. சி. ஆர். பெலிகம்மன)*
(Mr. C. R. Beligammana)

You will have to be guided by the information we provide.

**එම්. ඒ. අබ්දුල් මජීඩ් මහතා**
*(ஜனாப் எம். ஏ. அப்துல் மஜீத்)*
(Mr. M. A. Abdul Majeed)

All right.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Question No. 12.

**එම්. ඒ. අබ්දුල් මජීඩ් මහතා**
*(ஜனாப் எம். ஏ. அப்துல் மஜீத்)*
(Mr. M. A. Abdul Majeed)

I want two weeks' time to answer this Question.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*

*Question ordered to stand down.*

## විශ්‍රාම වැටුප් : එල්. සී. වීරසේකර මහත්මිය

**ஓய்வூதியம் : திருமதி எல். சி. வீரசேகர**

PENSION : MRS. L. C. WEERASEKERA

47/78

**13. ඇල්බට් ද සිල්වා මහතා (ගාල්ල)**
*(திரு. அல்பட் த சில்வா—காலி)*
(Mr. Albert de Silva—Galle)

අධ්‍යාපන ඇමතිතුමා සහ උසස් අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) (i) ගා/රිච්මන්ඩ් මහා විද්‍යාලයේ උප ගුරුවරයකු වශයෙන් සේවය කළ ගාල්ලේ ඉහල ගෙවත්තෙ, වැකුණගොඩ පාරේ ඇල්. සී. වීරසේකර මිය, 1972. 12. 31 වැනි දින විශ්‍රාම ගිය බවත්; (ii) ඇය රෝගාතුරවී 1974. 6. 25 වැනි දින මිය ගිය බවත්; (iii) ඇයට හිමි විශ්‍රාම වැටුප් ලබා ගැනීම සඳහා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ලියුම් ගණනාවක් ම යවා ඇතත්, මේ තාක් විශ්‍රාම වැටුප් ගෙවා නොමැති බවත්; (iv) 1977. 9. 13 වැනි දින අංක පීඑන් (එන්) 92666/පී දරණ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරයාගේ ලිපියෙන්, ඇයගේ ලිපි ගොනුව 1977. 3. 30 වැනි දින අධ්‍යාපන අමාත්‍යාංශයේ විගණකාධිපතිට යවා ඇති බව දන්වා ඇතත්, මෙතෙක් මේ සම්බන්ධයෙන් කිසිවක් කර නැති බවත් එතුමා දන්නවාද? (ආ) මිය ගිය වීරසේකර මහත්මියගේ පුරුෂයාට හා දරුවන්ට එම විශ්‍රාම වැටුප් වහාම ලබා දීමට එතුමා ක්‍රියා කරනවාද? (ඉ) නො එසේ නම්, ඒ මන්ද?

*கல்வி அமைச்சரும் உயர்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா: (அ) (i) கா/றிச்மன்ட் மகாவித்தியாலயத்தில் உதவி ஆசிரியையாகச் சேவை செய்த காலி, இஹலகேவத்தே, வெகுணுகொட றோட்டைச் சேர்ந்த திருமதி எல். சி. வீரசேகர 1972.12.31 ஆம் தேதி இளைப்பாறியதையும், (ii) இவர் நோய்வாய்ப்பட்டு 1974.06.25 ஆம் தேதி இறந்துபோனதையும்; (iii) இவருக்குரிய ஓய்வூதியப் பணத்தைப் பெற்றுக்கொள்வதற்காக ஓய்வூதியப் பணிப்பாளருக்குப் பல கடிதங்கள் அனுப்பப்பட்டபோதிலும் இதுவரை ஓய்வூதியப் பணத்தைக் கொடுக்கவில்லையென்பதையும்; (iv) 1977.09.13 ஆந் தேதி பிஎன் (என்) 92666/பி இலக்கத்தைக் கொண்ட ஓய்வூதியப் பணிப்பாளரின் கடிதத்தில் இவருடைய கடிதக் கோவையை 1977.03.30 ஆம் தேதி கல்வி அமைச்சின் கணக்குப் பரிசோதகருக்கு அனுப்பியிருப்பதாகத் தெரிவிக்கப்பட்டபோதிலும் இதுவரை இதுபற்றி எதுவும் நடைபெறவில்லையென்பதையும் அவர் அறிவாரா? (ஆ) இறந்துபோன திருமதி வீரசேகரவின் கணவருக்கும் இவருடைய பிள்ளைகளுக்கும் குறித்த ஓய்வூதியப் பணத்தைப் பெற்றுக்கொடுக்க அவர் நடவடிக்கை எடுப்பாரா? (இ) இன்றேல் ஏன்?*

asked the Minister of Education and Minister of Higher Education: (*a*) Is he aware that (i) Mrs. L. C. Weerasekera of Wekunagoda Road, Ihalagewatte, Galle, who was an Assistant Teacher at Richmond College, Galle, retired on 31.12.72;

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(ii) she died on 25.06.1974; (iii) her pension has not yet been paid despite several reminders to the Director of Pensions; (iv) although it has been stated in the letter PN (N) 92666/P of the Director of Pensions dated 13.9.1977 that her file has been sent on 30.03.1977 to the Chief Accountant of the Ministry of Education, no action has yet been taken in this connection? (b) Will he take immediate action to see that the pension is paid to Mrs. Weerasekera's husband and children? (c) If not, why?

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
*(திரு. எம். வின்சன்ற் பெரேரா)*
(Mr. M. Vincent Perera)

(අ) (i) ප්‍රශ්නය අසා ඇත්තේ 1972. 01. 01 දින සිට විශ්‍රාම ගිය එල්. ඩී. වීරසේකර මහත්මිය ගැන නම් පිළිතුර "ඔව්" ය. (ii) ඔව්. (iii) ඇයගේ මරණයෙන් පසු විශ්‍රාම වැටුපක් ගෙවීම පැන නොනගී. කෙසේ වෙතත් ඇගේ යැපෙන්නන්ට ගෙවිය යුතු මරණ පරිතෝෂිකය 1978 මාර්තු 20 වැනි දින විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් අනුමත කර ඇත. (iv) විගණනයෙන් පසු ලිපි ගොනුව 1977 සැප්තැම්බර් මස 19 වැනි දින සහකාර විගණකාධිපති විසින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ආපසු යවා ඇත. (ආ) ඉහත (අ) (iii) අනුව පැන නොනගී. (ඉ) පැන නොනගී.

**ඇල්බට් ද සිල්වා මහතා**
*(திரு. அல்பட் த சில்வா)*
(Mr. Albert de Silva)

දැන් මුදල් ගෙවා තිබෙනවාද?

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
*(திரு. எம். வின்சன்ற் பெரேரா)*
(Mr. M. Vincent Perera)

ගෙවීම අනුමත කර තිබෙනවා.

**ඇල්බට් ද සිල්වා මහතා**
*(திரு. அல்பட் த சில்வா)*
(Mr. Albert de Silva)

දැන් අවුරුදු 5 කටත් වැඩිය කල් ගත වී තිබෙනවා.

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
*(திரு. எம். வின்சன்ற் பெரேரா)*
(Mr. M. Vincent Perera)

ගෙවීම අනුමත කර තිබෙන්නේ මාර්තු මස 20 වැනිදායි. මිළඟට මුදල් ගෙවීමට කටයුතු කරනවා.

## පොල්ගහවෙල මැතිවරණ කොට්ඨාශයේ ප්‍රාදේශීය සංවර්ධන යෝජනාක්‍රම
*பொல்கஹவெலத் தொகுதி பிரதேச அபிவிருத்தித் திட்டங்கள்*
**DIVISIONAL DEVELOPMENT PROJECT SCHEMES, POLGAHAWELA ELECTORATE**

237/77

5. **ආර්. එම්. පුංචි බණ්ඩාර මහතා** (මොණරාගල—සුනිල් රංජන් ජයකොඩි මහතා—පොල්ගහවෙල—වෙනුවට)
*(திரு ஆர். எம். புஞ்சி பண்டார—மொனராகலை—திரு. சுனில் ரஞ்சன் ஜயக்கொடி—பொல்கஹவெல—சார்பாக)*
(Mr. R. M. Punchi Bandara—Moneragala—on behalf of Mr. Sunil Ranjan Jayakody—Polgahawela)

සැලසුම් ක්‍රියාත්මක කිරීමේ නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) වත්මන් රජය බලයට පත්වීමට පෙර පොල්ගහවෙල මැතිවරණ කොට්ඨාශයේ ප්‍රාදේශීය සංවර්ධන යෝජනා ක්‍රම කීයක් යෝජනා කොට තිබුණේද? (ආ) එයින් යෝජනා ක්‍රම කීයක් ආරම්භ කොට තිබුණේද? (ඉ) එසේ ආරම්භ කරන ලද යෝජනා ක්‍රමවලින් දැනට කීයක් ක්‍රියාත්මක වෙනවාද? ඒ මොනවාද? (ඊ) එසේ ක්‍රියාත්මක නොවන්නේ නම්, ඒ මොනවාද? (උ) ඒවා ක්‍රියාත්මක නොවන්නේ මන්ද? (ඌ) ඒවා ක්‍රියාත්මක කරන්නේ නම්, ඒ සඳහා කිසියම් වැඩ පිළිවෙළක් ආරම්භ කරනවාද? එසේ නම්, ඒ කවදා සිටද?

*அமைப்புத்திட்டச் செயற்படுத்தல் பிரதி அமைச்சரைக் கேட்ட வினா: (அ) தற்போதைய அரசாங்கம் பதவிக்கு வருவதற்கு முன் பொல்கஹவெல தேர்தல் தொகுதியில் பிரதேச அபிவிருத்தித்திட்டங்கள் எத்தனை திட்டமிடப்பட்டிருந்தன? (ஆ) அத்திட்டங்களில் எத்தனை ஆரம்பிக்கப்பட்டிருந்தன? (இ) அவ்வாறு ஆரம்பிக்கப்பட்ட திட்-*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. එම්. පුංචි බණ්ඩාර මහතා]

டங்களில் தற்போது எத்தனை இயங்கிக்கொண்டுள்ளன ? அவை என்ன ? (ஈ) அவ்வாறு இயங்காமல் இருந்தால் அவை என்ன ? (உ) ஏன் அவைகள் இயங்காமலிருக்கின்றன ? (ஊ) அவைகளை இயக்குவதானால் அதற்காக ஏதாவதொரு திட்டத்தை ஆரம்பிப்பாரா ? ஆம் எனில், எப்பொழுது ?

asked the Deputy Minister of Plan Implementation: (*a*) How many Divisional Development Project schemes were proposed for the Polgahawela Electorate before the present Government came to power? (*b*) Of these schemes, how many were inaugurated? (*c*) of the schemes that were inaugurated, how many are in operation at present and what are they? (*d*) If there are schemes that are not in operation, what are they? (*e*) Why are these schemes not in operation? (*f*) If they are to be implemented, will some scheme be drawn up? If so, from when?

ඩී. බී. වෙලගෙදර මහතා
(திரு. டீ. பி. வெலகெதர)
(Mr. D. B. Welagedera)

(අ) 19යි. (ආ) 12 යි. (ඉ) 10 යි. (i) පොතුහැර කළුගල් කර්මාන්තය, (ii) කළුගමුව මැහුම් කර්මාන්තය, (iii) ගල්ලැහැර කොහු කර්මාන්තය, (iv) දඹගොල්ල සමූහ ගොවිපොළ, (v) පොල්ගහවෙල වැලි ගොඩ දැමීම, (vi) බටගොල්ල සමූහ ගොවිපොළ, (vii) රත්මල්ගොඩ ගඩොල් කර්මාන්තය, (viii) ඉදිකිරීම් ඒකකය, (ix) කෘෂිකාර්මික වෘත්තීය ඒකකය, (x) මී මැසි පාලනය—ලෝකා හෙට්ටිය. (ඊ) (1) පොල්ගහවෙල කුකුළන් ඇති කිරීමේ යෝජනා ක්‍රමය. (2) පොල්ගහවෙල ගල්බඩගම කොහු කර්මාන්තය. (උ) (1) පොල්ගහවෙල කුකුළන් ඇති කිරීමේ යෝජනා ක්‍රමය. කුකුල් කෑම මිළ අධික වීම නිසා යෝජනා ක්‍රමය ලාභදායිව පවත්වාගෙන යාම අපහසු වූ හෙයින් මෙම යෝජනා ක්‍රමය වසා දමන ලදී. (2) පොල්ගහවෙල ගල්බඩගම කොහු කර්මාන්තය. අමු ද්‍රව්‍ය මිළ අධිකවීම හා අලෙවි ප්‍රශ්න මතු වීම නිසා යෝජනා ක්‍රමය ලාභදායීව පවත්වාගෙන යාම අපහසු වූ හෙයින්, වසා දමන ලදී. (ඌ) මෙසේ පාඩු වීම නිසා මෙම යෝජනා ක්‍රම දෙක වසා දමන ලදී. ඒවා නැවත විවෘත කිරීමට බලාපොරොත්තු වනු නොලැබේ.

## දේශපාලන හේතු උඩ සේවයෙන් පහ කරන ලද හමුදා නිලධාරීන් සහ සෙසු උදවිය

அரசியல் காரணங்களுக்காக வேலை நீக்கஞ் செய்யப்பட்ட படையினர்

## ARMED PERSONNEL DISMISSED FOR POLITICAL REASONS

240/77

6. ආර් එම්. පුංචි බණ්ඩාර මහතා—සුනිල් රංජන් ජයකොඩි මහතා—වෙනුවට)
(திரு. ஆர். எம். புஞ்சி பண்டார—திரு. சுனில் ரஞ்சன் ஜயக்கொடி சார்பாக)
(Mr. R. M. Punchi Bandara—on behalf of Mr. Sunil Ranjan Jayakody)

රාජ්‍ය ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) පසුගිය ආණ්ඩු කාලය තුළදී ත්‍රිවිධ හමුදාවන් හි, දේශපාලන හේතුන් මත (නිලධාරීන් හා සෙසු නිලයන් දරණ) කී දෙනෙකුගේ සේවා/රාජකාරි අත්හිටුවා තිබෙනවාද? (ආ) දේශපාලන හේතුන් මත කී දෙනෙක් සේවයෙන් පහ කර තිබෙනවාද? (ඉ) එසේ දේශපාලන හේතුන් මත පහකර ඇත්නම් හා අත්හිටුවා ඇත්නම්, ඒ අය නැවත සේවයට බඳවා ගන්නවාද? (ඊ) නො එසේ නම්, ඒ මන්ද? (උ) සේවයට බඳවා ගන්නවා නම්, එසේ බඳවා ගන්නේ කවදා සිටද?

பாதுகாப்பு பிரதி அமைச்சரைக் கேட்ட வினா: (அ) கடந்த அரசாங்கத்தின்போது முப்படைகளில், அரசியல் காரணங்களுக்காக (உத்தியோகத்தர்களினதும் ஏனைய பதவி வகிப்பவர்களினதும்) எத்தனை பேர்களின் சேவை இடைநிறுத்தப்பட்டுள்ளது ? (ஆ) அரசியல் காரணங்களுக்காக எத்தனை பேர் சேவையிலிருந்து நீக்கப்பட்டனர் ? (இ) அவ்வாறு அரசியல் காரணங்களுக்காக நீக்கப்பட்டிருந்தால், அல்லது இடை நிறுத்தப்பட்டிருந்தால் இவர்கள் மீண்டும் சேவையில் சேர்த்துக் கொள்ளப்படுவார்களா ? (ஈ) இன்றேல்,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ஏன்? (உ) சேவையில் சேர்த்துக்கொள்ளப் படுவார்களாயின் எப்போது தொடக்கம் சேர்த்துக்கொள்ளப்படுவார்கள்?

asked the Deputy Minister of Defence: (a) How many persons in the armed forces (officers and other ranks) were suspended from service due do to political reasons during the previous regime? (b) How many were dismissed due to political reasons? (c) If persons have been suspended or dismissed from service due to political reasons, will they be re-employed? (d) If not, why? (e) If they are to be re-employed, when will it be done?

**ටී. බී. වේරපිටිය මහතා (රාජ්‍ය ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා)**

*(திரு. ரீ. பி. வேரப்பிட்டிய—பாதுகாப்பு பிரதி அமைச்சர்)*

(Mr. T. B. Werapitiya—Deputy Minister of Defence)

(අ) කිසිවකු නොමැත. (ආ) කිසිවකු නොමැත. (ඉ) (අ) හා (ආ) පිළිතුරු හේතුකොටගෙන පැන නොනඟී. (ඊ) පැන නොනඟී. (උ) පැන නොනඟී.

**ගාමිණි අතුකෝරල මහතා (නිවිතිගල)**

*(திரு. காமினி அத்துகோறளை—நிவித்திகல)*

(Mr. Gamini Atukorale—Nivitigala)

නියෝජ්‍ය ඇමතිතුමා දන්නවාද, පසුගිය රජය පැවති කාල පරිච්ඡේදය තුළ ත්‍රිවිධ හමුදාවේ ඇතැම් උසස් නිලධාරීන් ඇතැම් දේශපාලන පක්ෂවල සංවිධායකයන් හැටියට කටයුතු කළ බව?

**ටී. බී. වේරපිටිය මහතා**

*(திரு. ரீ. பி. வேரபிற்றிய)*

(Mr. T. B. Werapitiya)

මා දන්නේ නැහැ. ඒ ගැන සොයා බලා උත්තර දෙන්නම්.

**ගාමිණි අතුකෝරල මහතා**

*(திரு. காமினி அத்துகோறளை)*

(Mr. Gamini Atukorale)

අනුරුද්ධ රත්වත්තේ මහතා?



**ටී. බී. වේරපිටිය මහතා**

*(திரு. ரீ. பி. வேரபிற்றிய)*

(Mr. T. B. Werapitiya)

ඒ ගැනත් සොයා බලා පසුව උත්තර දෙන්නම්.

## නැවත සේවයට ගැනීම: ලාන්ස් කෝප්රල් එස්. පී. ඉලේසිංහ මහතා

### மீண்டும் வேலைக்கமர்த்தல்: லான்ஸ் கோபரல் எஸ். பி. இலேசிங்க

### REINSTATEMENT: LANCE CORPORAL S. P. ILESINGHE

278/77

7. **ආර්. එම්. පුංචි බණ්ඩාර මහතා (සුනිල් රංජන් ජයකොඩි මහතා වෙනුවට)**

*(திரு. ஆர். எம். புஞ்சி பண்டார—திரு. சுனில் ரஞ்சன் ஜயக்கொடி சார்பாக)*

(Mr. R. M. Punchi Bandara—on behalf of Mr. Sunil Ranjan Jayakody)

රාජ්‍ය ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) පළමුවන ගැමුණු හේවා බල ඇණියේ ලාන්ස් කෝප්රල්වරයෙකු ලෙස (40169) සේවය කළ සරත් පී. ඉලේසිංහ මහතා 1970. 06. 06 දින අනිවාර්ය නිවාඩු යවන ලද්දේද? එසේ නම් ඊට හේතු මොනවාද? (ආ) 1971. 04. 10 දින මේජර් ඇල්. වී. ප්‍රනාන්දු මහතා විසින් ඉලේසිංහ මහතා අත්අඩංගුවට ගන්නා ලද්දේද? එසේ නම්, අත්අඩංගුවට ගනානා ලද්දේ කාගේ පැමිණිල්ලක් අනුවද? (ඉ) අත් අඩංගුවට ගැනීමෙන් පසු ඉලේසිංහ මහතාට වැටුප් ගෙවන ලද්දේද? එසේ නම්, කවදා වනතෙක් ද? (ඊ) වැටුප් ගෙවීම නතර කළේ නම්, ඊට හේතු මොනවාද? (උ) සරත් පී. ඉලේසිංහ මහතා නවම යුද හමුදාවේ නිල නොලත් නිලධාරියෙක්ද? මොහුට විරුද්ධව විනය විභාගයක් පවත්වා ඇත්ද? නොඑසේ නම්, ඒ මන්ද? (ඌ) මොහු විසින් 1970 සිට 1977 දෙසැම්බර් 15 දින දක්වා ලිපි 9 ක් ඒවා ඇති බව දන්නවාද? එම ලිපි ගැන මේ දක්වා ගෙන ඇති ක්‍රියාමාර්ගය කුමක් ද? (එ) මෙම ලිපි වලින් ඉල්ලා ඇති අන්දමට ඒ මහතාගේ සේවය නැවත ලබා දීමටත්, අහිමිවූ උසස්වීම් හා වැටුප් යළි ලබාදීමටත් එතුමා කටයුතු කරනවාද? (ඒ) එසේ නම්, ඒ කවදාද? නො එසේ නම්, ඒ මන්ද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. එම්. පුංචි බණ්ඩාර මහතා]

*பாதுகாப்பு பிரதி அமைச்சரைக் கேட்ட வினா: (அ) முதலாம் கைமுனு அணியைச் சேர்ந்த லான்ஸ் கோபரல் சேவை புரிந்த திரு. சரத் பி. இலேசிங்க (40169) 1970-06-06 ஆந் தேதி கட்டாய விடுமுறையில் அனுப்பப் பட்டாரா? ஆமெனில். அப்படிச் செய்யக் காரணமென்ன? (ஆ) 1971-04-10 ஆந் தேதி மேஜர். எல். ரி. பெர்னாந்து அவர்களால் திரு. இலேசிங்க கைது செய்யப்பட்டாரா? ஆமெனில், அவ்விதம் கைது செய்தது எவரது முறைப்பாட்டின் பேரில்? (இ) கைது செய்யப்பட்ட பின்னர் திரு. இலேசிங்காவுக்கு சம்பளம் வழங்கப்பட்டதா? ஆமெனில், எத் தேதி வரை? (ஈ) சம்பளம் வழங்குவது நிறுத்தப்பட்டதெனில், அதற்கு காரணம் யாது? (உ) திரு. சரத் பி. இலேசிங்க தற்பொழுதும் இராணுவப் படையில் ஆணை பெறாத உத்தியோகத்தரா? இவருக்கெதிராக ஒழுக்காற்று விசாரணை நடத்தப்பட்டதா? இன்றேல், ஏன்? (ஊ) இவர் 1970 இலிருந்து 1977 டிசெம்பர் 15 ஆந் தேதி வரை 9 கடிதங்கள் அவருக்கு அனுப்பியுள்ளதை அவர் அறிவாரா? அக்கடிதங்கள் சம்பந்தமாக இது வரை எடுத்துள்ள நடவடிக்கை யாது? (எ) இக்கடிதங்களில் கோரப்பட்டுள்ள விதத்தில் இவரது சேவையை மீண்டும் பெற்றுக் கொடுக்கவும் இழந்த பதவி உயர்வும் சம்பளத்தையும் மீண்டும் பெற்றுக் கொடுக்கவும் அவர் நடவடிக்கை எடுப்பாரா? (ஏ) ஆமெனில், எப்பொழுது? இன்றேல் ஏன்?*

asked the Deputy Minister of Defence: (*a*) Was Lance Corporal Sarath P. Ilesinghe (40169) of the First Gemunu Watch sent on compulsory leave on 1970.06.06? If so, why? (*b*) Was Mr. Ilesinghe arrested by Major L. T. Fernando on 1971.04.10; if so, on whose complaint was he arrested? (*c*) Was Mr. Ilesinghe paid for the period subsequent to arrest? If so, till what date was he paid? (*d*) if payment of salary was stopped, what was the reason for doing so? (*e*) Is Mr. Sarath P. Ilesinghe still a non-commissioned officer in the Army? Has a disciplinary inquiry been held against him? If not, why? (*f*) Has Mr. Ilesinghe addressed 9 letters between 1970 and 15.12.1977? What action has been taken on them? (*g*) Will he take action to grant him reinstatement, promotions that were denied him and back pay? If so, when; if not, why?

**ටී. බී. වේරපිටිය මහතා**
*(திரு. டீ. பி. வேரப்பிற்றிய)*
**(Mr. T. B. Werapitiya)**

(අ) ඔව්, යම් යම් රහසිගත තොරතුරු ලැබීම හේතුකොට ගෙන මොහු අනිවාර්ය නිවාඩු පිට යවනු ලැබිණ. (ආ) නැත. මොහු කැරලිකාර සැකකරුවකු බවට ලත් රහසිගත තොරතුරු හේතුකොටගෙන 1971. 04. 10 වෙනි දින මොහු අත් අඩංගුවට ගනු ලැබිණ. (ඉ) ඔව්. 1971. 04. 11 වෙනි දින සිට 1971. 08. 31 වෙනි දින තෙක් වැටුප් ගෙවන ලදී. (ඊ) මොහුගේ සේවා නියුක්ත කාල සීමාව (මොහු අත් අඩංගුවේ පසුවෙද්දී) 1971. 10. 06 වෙනි දින අවසන් වීමට නියමිතව තිබුණි. එසේ හෙයින්, රෙගුලාසිමාලාවේ නියමයන් ප්‍රකාර මොහුගේ "ගෙවීම්වලින් නිදහස් සහතිකය" ලැබෙන තෙක් 1971. 09. 01 දින සිට මොහුගේ වැටුප් තාවකාලිකව නතර කරනු ලැබින. (උ) නැත. මොහුගේ මුල් සේවා නියුක්ති කාලසීමාව 1971.10.06 වෙනි දින අවසන් වීමත් සමඟම මොහුගේ අධිකාර නොලත් නිලධාරී තනතුර අහිමි වන්නට විය. යුද හමුදාව විසින් මොහුට විරුද්ධව විනයානුකූල පරීක්ෂණයක් පවත්වනු නොලැබුවේ මොහු සම්බන්ධයෙන් පොලිසිය විසින් විමර්ෂණ කට යුතු මෙහෙයවනු ලැබූ නිසාය. (ඌ) මොහු විසින් එවනු ලැබ ඇත්තේ එක් ලිපියක් පමණි. මෙයද ලැබී ඇත්තේ 1977 දෙසැම්බර් මාසයේදීය. දේශපාලනමය වශයෙන් පලිගැනීමට තමා ලක් වූවායි යන පැමිණිල්ල විභාග වෙමින් පවතී. (එ) හා (ඒ) මොහු යලි සේවයෙහි පිහිටුවනු ලබන්නේද යන්න සලකා බැලිය හැක්කේ මොහු දේශපාලනමය වශයෙන් පලිගැනීමට ලක්වීද යන්න පිළිබඳව පැවැත්වෙන පරීක්ෂණ කටයුතු නිම වීමෙන් පසුව පමණි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
14 වන ප්‍රශ්නය?

**එම්. ඩී. එච්. ජයවර්ධන මහතා (වැවිලි කර්මාන්ත ඇමතිතුමා)**
*(திரு. எம். டீ. எச். ஜயவர்த்தன—பெருந் தோட்டத் தொழில் அமைச்சர்)*
(Mr. M. D. H. Jayawardena—Minister of Plantation Industries)

මෙම ප්‍රශ්නයට සම්පූර්ණ පිළිතුරු සැපයීම සඳහා අදාල තොරතුරු වතු කීපයකින් ලබා ගැනීමට තිබෙන නිසා ඒ සඳහා සති හයක් කල් දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

*வினவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*

*Question ordered to stand down.*

## මැයි දිනය:
## ගරු අගමැතිතුමාගේ ප්‍රකාශය

*மே தினம்: கௌரவ பிரதம அமைச்சரது அறிக்கை*

## MAY DAY: STATEMENT BY THE HON. PRIME MINISTER

අ. භා. 2.12

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
(Mr. R. Premadasa)

ගරු කථානායකතුමනි, මෙම අවස්ථාවේදී මැයි දින වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කරන්න මම බලාපොරොත්තු වෙනවා. මැයි දිනය පොදු ජනතාවට, වැඩ කරන ජනතාවට, ගොවි කම්කරු ජනතාවට පමණක් නොව හැම ක්ෂේත්‍රයකම වැඩ කරන ජනතාවට සිය රට වෙනුවෙන් කැපවීමක්, අධිෂ්ඨානයක්, ධෛර්යයක් හා උනන්දුවක් ඇති කර ගැනීම පිණිස ජාතික මට්ටමෙන් කැප වෙන දිනයක් හැටියට පවත්වන්නයි, අපේ රජය බලාපොරොත්තු වෙන්නේ.

අපේ රජය මිනිස් ශ්‍රමය ඉතා අගේ කොට සලකනවා. මිනිසුන්ගේ දහඩිය මහන්සියට අළුත් වටිනාකමක් දෙන්න අපේ රජය කැප වී සිටිනවා. මේ කාරණය ගැන සියළුම කොටස්වල වැඩ කරන ජනතාවට කිසිම මතභේදයක් නැතුව එකඟ වෙන්න පුළුවන් බව කවුරුත් පිළිගන්නවා. ගොවි කම්කරුවන්ට පමණක් නොව ලේඛකයන්, කලාකාරයන්, කලාශිල්පීන් ආදීකොට ඇති හැම ක්ෂේත්‍රයකම ජනතාවට, වැඩ කරන ජනතාවට, අධිෂ්ඨානයක් හා කැප වීමක් පිළිබඳ දිනයක් හැටියට මැයි දිනය සකසන්නට—ඒ කියන්නේ එක්සත් ජාතික පක්ෂයේ මේ රජය මෙවර මැයි දිනය මුල් කර ගෙන එවැනි වැඩ පිළිවෙලක ආරම්භයක් ඇති කරන්න බලාපොරොත්තු වෙනවා.

මෙය නව වැඩපිළිවෙලක්. බව තමුන්නාන්සේට පෙනී යනවා ඇති. අපි අද ජීවත් වන්නේ වහල් යුගයක නොවෙයි; මේ රටේ පොදු ජනතාව රටේ පාලනයේ හවුල්කාරයන් හැටියට ජීවත් වෙන ජන සම්මතවාදී යුගයකයි. රටේ පාලකයන් රටේ පොදු ජනතාවයි. ඒ නිසා මේ අනුව අලුත් වැඩ පිළිවෙලක් ඇති කරන්නට ඕනෑය කියා අපි කල්පනා කළා. පසුගිය කාලයේදී මැයි දිනය පාවිච්චි කළේ කෝපය හා වෛරය වගා කරන්නට බව අපට පෙනී ගොස් තිබෙනවා. අපහාස උපහාස වලින් ජන හදවත් කලත්තන්නටයි, එම දිනය පාවිච්චි කළේ. ඇතැම් අවස්ථාවලදී උද්වේගකාරී ක්‍රියාවල් නිසා ප්‍රකෝපකාරී තත්ත්වයන් ඇති වී දේපොලවලට හානි සිදු වුණා. ජීවිතවලට පවා හානි සිදු වුණ අවස්ථා පසුගිය යුගයේ ඇති වුණා. වර්ෂ කීපයකට උඩදී කොළඹ නගරයේ ගිය පෙළපාලි අතරේ ඇති වුණ ප්‍රකෝපකාරී ක්‍රියාවන් නිසා ජීවිත හානි පවා සිදු වුණ බව තමුන්නාන්සේලාට මතක ඇති. ඩාලි පාරේ එක සිද්ධියක් ගැන මතක ඇති. ඒ වගේම මරදාන පාරේ සිද්ධීන් දෙකක් ගැන මතක ඇති. හිටපු මන්ත්‍රිවරයෙකුගේ රියැදුරු මහත්මයෙක් ජීවිතක්ෂයට පත් වුණා. මෙන්න මෙවැනි අත්දැකීම් අපට තිබෙන නිසා මේ සම්බන්ධයෙන් නව වැඩ පිළිවෙලක් ඇති කළ යුතු බව අපි කල්පනා කළා.

අනුන්ට බණ කියන්න කලින් අපිම යම් ආදර්ශයක් දිය යුතුය කියා අපි කල්පනා කළා. ඒ නිසා එක්සත් ජාතික

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ප්‍රේමදාස මහතා]

පක්ෂයේ වෘත්තීය සමිති මේ පිළිබඳව යම් තීරණයක් ගත්තා. එම තීරණය රජයට දැනුම් දී තිබෙනවා. එම තීරණය අපේ පක්ෂයත් අනුමත කර තිබෙනවා. ඒ වගේම රජයත් පිළිගෙන තිබෙනවා. මොකක්ද මේ තීරණය? මා කලින් කිව්ව ආකාරයට අපේ පක්ෂයට සම්බන්ධ වෘත්තීය සමිති පමණක් නොව ජනසම්මතවාදී ආකල්පය පිළිගන්නා මුළු රටම රට හැදීමේ ව්‍යාපාරයට සහභාගි කරවා ගන්න අපි අදහස් කරනවා. හැම ක්ෂේත්‍රයකම බුද්ධිය, ශ්‍රමය හා උනන්දුව කැප කරන ජනතාව ඒකරාශී කරන රට ගොඩනැගීමේ මහා වැඩ පිළිවෙළේ අධිෂ්ඨානය ඇති කර ගන්නා දිනයක් හැටියට මේ මැයි දිනය පාවිච්චි කරන්නට අපි බලාපොරොත්තු වෙනවා. ඒ අනුව මා කියන්න කැමතියි, එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ වෘත්තීය සමිතිත්, ජනසම්මතවාදී වැඩ පිළිවෙළ පිළිගන්නා සෙසු වෘත්තීය සමිති ගණනාවකුත් එකට එකතු වී ගෝල්ෆේස් පිටියේදී සංදර්ශන සහිතව මහා කැපවීමේ දිනයක් හැටියට මේවර මැයි දිනය පවත්වන්නට බලාපොරොත්තු වෙනවා. කාගේවත් හිත් රිදවන්නේ නැතිව, කාටවත් අපහාස උපහාස නොකර, කාගේත් අවධානය පොදුජන සුභ සිද්ධිය සඳහා යොමු කරවන ජාතික අවස්ථාවක් මේ මැයි දිනයේදී ඇති කරන්නට අපි උත්සාහ කරනවා. ගොවි කම්කරු ජනතාව පමණක් නොව හැම ක්ෂේත්‍රයකම ජනතාව ඒ මහා ජාතික ව්‍යායාමයට සහභාගි කරවා ගැනීමට අපි අදහස් කරනවා. අපි පෙළපාලි පවත්වන්නට බලාපොරොත්තු වන්නේ නැත්තෙ ඒ නිසයි.

එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ වෘත්තීය සමිති කෑ කෝ ගසමින් එක් තැනක සිට තවත් තැනකට පෙළපාලි යන්නට බලාපොරොත්තු වෙන්නෙ නැහැ. මුළු මැයි දිනයම ගෝල්ෆේස් පිටියේ පැවැත්වෙනවා. නොයෙකුත් සංදර්ශන පවත්වනවා. ඒ වාගේම නොයෙක් නොයෙක් අංශවල කාර්යයන්වල නිරත වී සිටින ජනතාව තමන්ගේ අධිෂ්ඨානය පිළිබිඹු කරන ආකෘතීන් සකස් කර තිබෙන්නට පුළුවනි. නොයෙකුත් ගැයුම් වැයුම් දර්ශන පැවැත්වෙනවා ඇති. ජාති භේද, ආගම් භේද, පක්ෂ භේද ආදී භේදයන්ගෙන් තොරව මුළු රටේම ජනතාව එකම පරමාර්ථයක් ඇති කරගෙන, මේ රටේ පාලකයන් අපිය, අපි අපේ රට හදාගන්න ඕනෑය, අපි මේ රටේ රජවරුය, සියලුම වැසියන් එකට එකතු වී, හැම ක්ෂේත්‍රයකම සිටින ජනතාව එකට එකතු වී මේ රට ගොඩනැංවීමේ වැඩ පිළිවෙල ඇති කරන්න ඕනෑය කියන හැඟීමෙන් යුතුව මේ මැයි දිනය පවත්වන්නට අපි බලාපොරොත්තු වෙනවා. අපට දැන ගන්නට ලැබී තිබෙන තොරතුරු අනුව රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය, සමූපකාර අංශය සහ පළාත් පාලන අංශය ආදී සෑම අංශයක්ම මේකට සහභාගි වෙනවා. මැයි 1 වැනිදා පවත්වන්නට යන මේ මහා ජාතික ව්‍යායාමය මා සිතන හැටියට ඓතිහාසික අවස්ථාවක් බවට පත් වෙනවා ඇති. අපේ ගුවන් හමුදාවත් පාබල හමුදාවලුත් නාවුක හමුදාවත් වැඩ කරන උදවියත් මෙදින නොයෙකුත් සන්දර්ශනවලට සහභාගි වෙනවා. අපෙ මේ වැඩ පිළිවෙල ගැන දැනගන්නට ලැබී වෙනත් රටවලින් පවා නොයෙක් අන්දමේ කලාකරුවන්, වෘත්තීය සමිති නියෝජිතවරුන් මෙහි පැමිණ මෙම උත්සවයකට සහභාගි වන බවත් මා කියන්නට සතුටුයි. සියරට මෙන්ම පිටරටවලත් නොයෙකුත් අංශවල දක්ෂකම් ඇති උදවිය එදාට කිසිම ගාස්තුවක් අය නොකොට තමන්ගේ ව්‍යායාමයන් අපේ රටේ පොදු ජනතාවට ප්‍රදර්ශනය කරන්නට බලාපොරොත්තු වෙනවා. මුළු රටේම ජනතාවගේ හැඟීම් එකට කලතා, අපේ මේ මව් රට අපි හදා ගන්නට ඕනෑය, වාදභේදයෙන් තොරව ගොඩ නඟන්නට ඕනෑය යන හැඟීමට කැප වෙන්නට ඒ සියළු දෙනාම සූදානමින් පසු වෙනවා. මෙදා මැයි දිනය සම්බන්ධයෙන් එක්සත් ජාතික පක්ෂය ආරම්භ කරන්නට යන අළුත් වැඩ පිළිවෙළ එයයි.

ඒ සමඟම, වෙනත් නොයෙකුත් දේශපාලන පක්ෂ, "අපි එහෙම නොවෙයි, පෙළපාලි පැවැත්වීමෙන් වෙනදා කරන විධියටම මෙවරත් අපේ වැඩ පිළිවෙළ ගෙන යනවා" ය කියනවා නම් අපි ඒකට

මැයි දිනය: ගරු අගමැතිතුමාගේ ප්‍රකාශය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අවකාශය දෙන බව මා ප්‍රකාශ කරන්නට සතුටුයි. ඕනෑම තැනක සිට තවත් තැනකට පෙළපාළි යන්නට පුළුවනි.

ආනන්ද දසනායක මහතා (කොත්මලේ)
(திரு. ஆனந்த தஸநாயக்க—கொத்மலை)
(Mr. Ananda Dassanayake—Kotmale)

පෙළපාලි යෑම නවත්වා තිබෙන එකයි ප්‍රශ්නය.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

අවසරය දෙනවාය කිව්වාම නවත්වන වාය කියනවා. "ඇයි අපට අවසර නොදෙන්නෙ?" කියා ඊයේ එතුමා අසා තිබුණා. මා දුන් අවසර දෙන බව කිව්වාම ඒක කනගාටුවට හේතු වුණා. බලා පොරොත්තු වුණේ වෙන එකක්.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ලිඛිත වශයෙන් ලැබුණේ නැහැ.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

ලිඛිතව දෙනවාට වඩා වටිනවා නේද මා මේ සභාව ඉදිරියේ වාචිකව දෙන එක?

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා (කර්මාන්ත හා විද්‍යා කටයුතු නියෝජ්‍ය ඇමතිතුමා)
...
(திரு. என். டென்சில் பெர்னாண்டோ—கைத்தொழில், விஞ்ஞான அலுவல்கள் பிரதி அமைச்சர்)
(Mr. N. Denzil Fernando—Deputy Minister of Industries & Scientific Affairs)

ඒක හැන්සාඩ් වාර්තාවේ පළ වෙයි.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

කොත්මලේ මන්ත්‍රීතුමා ලිඛිත දේවල් බොහොමයක් ගැන විශ්වාසය තබා තිබෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ 1970 මැතිවරණ ප්‍රකාශනය ලිඛිත එකක් නේද? ඒක කියවා බලන්නත් ලැජ්ජයි නේද? ඒකෙ තිබුණු පොරොන්දු ඔක්කොම කඩකළා නේද?

ගරු කථානායකතුමනි, සාමාන්‍ය අවස්ථාවල පෙළපාලි පැවැත්වීම අඩ නතර කර තිබෙනවා. ඒක අපේ පොදු ප්‍රතිපත්තියක්. නමුත් මැයි දිනය විශිෂ්ඨ දිනයක් හැටියට සලකා වැඩ කරන ජනතාවගේ ලෙයින් ගොඩනැගුණු දිනයක් හැටියට සලකා අප එම අවසරය දුන්නා. චිකාගෝ නුවර ඇති වූ සිද්ධිය පදනම් කරගෙන මෙම දිනය ඇති වුණේ. ඇමෙරිකාවට කොපමණ බැන්නත් ආදර්ශයක් අර ගන්නෙ ඒ රටෙන් තමයි. අපි අද වෙනත් ජාතියකට යටත් පිරිසක් නොවෙයි. අපි මයි අද මේ රටේ රජවරු.

අපේ රටේ පොදු ජනතාව තමයි, අද මේ රටේ රජවරු. අපි සෑමදාම, "දියව්, කපව්, කොටව්, මරව් කිය කියා ජීවත් වෙනවාද? නැත්නම් අප සියළු දෙනාම එකට එකතු වී අපේ රට හදා ගනිමු" යන හැඟීම වර්ධනය කරනවාද කවුද ආණ්ඩුව හදන්නෙ? මේ රටේ ජනතාව නේද? එක් දිනයක සියලු දෙනාම පෝලියට ගොස් කතිරයක් ගහල නේද ආණ්ඩුවක් හදන්නෙ? ජනතාවට පුළුවන් නම් ආණ්ඩුව හදන්න ඒ ආණ්ඩුව තුලින් රට හදන්න ජනතාවට අවස්ථාවක් දෙන්න ඕනෑය කියා අප කල්පනා කළේ ඒ නිසයි. අර වැඩවසම් කාලයේදී මෙන් රදළයින්ට කත් ඇද ඇද ඔවුන්ගේ අනුකම්පාව පිට කරේ තිබුන ලේන්සුව අතට අරගෙන දෙකට නැමී පෙත්සම් දුන් යුගය නොවෙයි මේක. මේක බ්‍රිතාන්‍ය පාලනයට යටත් වූ යුගයකුත් නොවෙයි. අපි ඒ යුගයේදී පෙළපාළි ගියා. "බ්‍රිතාන්‍ය රජය භංගවේවා" ය කිව්වා. "තොපි මේ රට අත්හැර පළයව්"; "Quit Ceylon" ය කියා අපි කෑගැසුවා. "පැය අටේ වැඩ දියවු" කියා අපි කෑගැසුවා. අපේ අයිතිවාසිකම් දෙන්නැයි කෑගැසුවා. ඒ විධියට අප කෑගැසූ යුගයකුත් තිබුණා. මම එය නැතැයි කියන්නෙ නැහැ මේ මන්ත්‍රී මණ්ඩලය තුළම තමයි, නොයෙක් යෝජනා ඉදිරිපත් කර ඒ අයිතිවාසිකම් ලබා ගත්තේ. අද ජනතාවට පුළුවන් ආණ්ඩුව හසුරුවන්න. ඒ නිසා අර ස්වාමි සේවක පිළිබඳ යුගය අවසාන විය යුතුයි. අපි සියලු දෙනාම එක්වත් තත්ත්වයකින් යුක්ත විය යුතුයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ප්‍රේමදාස මහතා]

There must be oneness in this attempt, Sir. මෙතන අපි මැති ඇමතිවරු හැටියට හිටියත් වෙනත් තරාතිරමක හිටියත් ඒකෙ වෙනසක් නැහැ. පාර පවිත්‍ර කරන මනුෂ්‍යයාගේත් අපේත් වෙනසක් නැහැ. අපි දෙගොල්ලොම කරන්නෙ එක විධියේ වැදගත් රාජකාරියක්. මානසික වහල් භාවය තවමත් අපේ රටේ තිබෙනවා. දේශපාලන වශයෙන නිදහස්ව සිටියත් තවමත් කල්පනා කරන්නේ වහල් මානසික තත්ත්වයකිනුයි. අරයට යටත් විය යුතුය. මෙයාට යටත් විය යුතුය. ඇමතිවරයාට යටත් විය යුතුය, අගමැතිට යටත් විය යුතුය කියන ඔය විධියේ හැඟීමක් තිබෙනවා. අපි සියළු දෙනාම එක්වන් පිරිසක්ය කියන හැඟීම තවමත් වර්ධනය වී නැහැ. ඇයි, නිදහස ලබාගන්නා විට අපට කිසිම අභියෝගයක් තිබුණේ නැහැ. කිසිම පරිත්‍යාගයක් කරන්න අපට සිද්ධ වුණේ නැහැ. ලෙහෙසියෙන් අපට ඒ නිදහස ලැබුණ නිසා.

ඒ නිසා කථානායකතුමනි, අපේ රජය මේ පෙළපාළි පිළිබඳව එක්තරා විධියකට කල්පනා කළා. අපටත් පුළුවනි, බොහෝම දිග පෙළපාළි යන්න මන්ත්‍රීන් 141 දෙනෙක් සිටින ආණ්ඩුවකට මගේ හිතේ එළිවෙනතුරු හෝ පෙළපාළි පවත්වන්නට බැරිකමක් නැහැ. තමුන්නාන්සේලාගේ නුවරඑළිය-මස්කෙළියේ දෙවන මන්ත්‍රීතුමා (අනුර බණ්ඩාරනායක මහතා) සෑම තැනම කිව්වා, මේ තරම් ඉක්මනින් ජනතාවගේ අප්‍රසාදයට ලක් වූ පක්ෂයක් ඉතිහාසයේ කවදාවත් පහළ වී නැත කියා නමුත් බටහිර කොළඹ ඡන්දගණන් කර බලන විට හොඳට පෙනී ගියා කවුද අප්‍රසාදයට ලක් වී තිබෙන්නේ කියා. 77 ජූලි මාසෙ ගත්තට වඩා හත්සිය ගණනක් අඩුයි.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)
ආණ්ඩුවටත් අඩුයි.

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
(Mr. R. Premadasa)

තමුන්නාන්සේට ඒ ගණන් සෑදු පෙන්වන්න මම බලාපොරොත්තු වන්නෙ නැහැ. මම පෙන්නුම් කරන්න හදන්නේ, තමුන්නාන්සේලා හැම තැනම කිව්වත් අප්‍රසාදයට අපි පත් වී සිටිනවාය කියා, අප්‍රසාදයට පත් වී සිටින්නේ අපි නොවේ තමුන්නාන්සේලාය කියා මම කියන්න කැමතියි. ඒ නිසා තමුන්නාන්සේලාගේ ඒ කීමෙන් අපට ප්‍රශ්නයක් නැහැ. තමුන්නාන්සේලාගේ වරදිනුයි, තමුන්නාන්සේලා අප්‍රසාදයට පත් වුණේ. තමුන්නාන්සේලා ඉක්මනින්ම අතීතය අමතක කරන්නු පැදුවා.

මම කලින් කිව්වා වාගේ අපටත් පුළුවන් බොහෝම දිග පෙළපාළි පවත්වන්න. නමුත් අපි කල්පනා කළා, ඒ ව්‍යායාමය කිසිම ප්‍රයෝජනයක් නැති ව්‍යායාමයක් කියා. හොඳයි තමුන්නාන්සේලාට ඕනෑ නම් මේ පෙළපාළි පවත්වන්න අපි ඒකට අවසර දෙනවා. ඒ ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ගමනාගමන මණ්ඩලයේ බස්රථ කිසිම පක්ෂයකට දෙන්නෙ නැහැ.

**මන්ත්‍රීවරු**
*(அங்கத்தினர்)*
Members)
බොහෝම හොඳයි.

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
(Mr. R. Premadasa)

වෙනෙකක් නිසා නොවෙයි. වාහනවලට අලාභහානි වුණාම ඊට පස්සෙ මාස දෙක තුනක් යන තුරු මහජනයාට ගමනාගමනයට වාහන නැතුව යනවා. අපි ලොරිවලට අවසර දෙන්නේ නැහැ. ඇයි අපේ ආහාර ද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා ලොරි වුවමනා වෙනවා. තමුන්නාන්සේලා දන්නවා, අද අපට ඓතිහාසික අස්වැන්නක් ලැබී තිබෙන බව. ඒ මොකද, අපි බලයට පැමිණි යොත් සෑම අවස්ථාවකම අපට හොඳට වර්ෂාව ලැබෙනවා. මේ වරත් අපට හොඳට වර්ෂාව ලැබුණා. නමුත් තමුන්නාන්සේලාගේ හත් අවුරුදු කාලය තුළ කොයිතරම් අස්වැන්න බැස්සද ?

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)
ඔය විධියට කියා සුදු හුණු ගාන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
(Mr. R. Pemadasa)

සුදු හුණු ගාන්න ඕනෑ නැහැ. අපි ඡන්ද යකට ගියානෙ. හුණු ගැවුණු හැටි දැක්කනෙ. අපට මේ වර ඓතිහාසික අස්වැන්නක් ලැබී තිබෙනවා. ඒවා ප්‍රවාහනය කරන්න වාහන නැහැ. ඇත පිටිසර ගම්බද පළාත් වල නිෂ්පාදනය කෙරෙන එළවළු හා වෙනත් ආහාර ද්‍රව්‍ය ප්‍රවාහනය කරන්නට බැරුව බොහෝම අමාරුවෙන් සිටිනවා, දැන් තිබෙන ලොරිවලට බඩු පටවන්නෙ කොහොමද? තමුන්නාන්සේලාගේ හත් අවුරුදු කාලය තුළ දී ලොරි ගෙන්නුවේ නැහැ. ඔක්කොම දැන් තිබෙන්නෙ කසි කබල් ලොරි. ඒවායේ බඩු පැටවීමෙන් මහ අනතුරුවලට භාජන වෙන්න පුළුවනි. ඇයි අර කසි කබල් බෝට්ටු පෙළපාලියක් තමුන්නාන්සේලා පැවැත්තුවේ, පසුගිය මැයි දිනයේ. මම ඒකයි කියන්නේ තමුන් නාන්සේලා අමතක කර තිබෙන බව. ගෝල්පේස් එකට පෙන්වන්න ගෙනැවිත් අනතුරට භාජන වූ හැටි, ඒ නිසා අපි කල්පනා කළා, මහජන ආරක්ෂාවට මූල් තැන දිය යුතුය කියා. ඒත් අපේ ගමනා ගමන ඇමතිතුමා නියමකර තිබෙනවා මෙද, මැයි දිනයේදී වෙනදාට වඩා බස් ධාවනය හා දුම්රිය ධාවනය උපරිම තත්ත්වයෙන් පවත්වාගෙන යන්නය කියා. අයින් කර තිබුණු බස් රථ 350 කට වැඩි ගණනක් අද ප්‍රවාහන ඇමතිතුමා ගමනා ගමන කටයුතු සඳහා සකස් කර යොදවා තිබෙනවා. එපමණක් නොවෙයි, අළුතෙන් දුම්රිය ගෙන්වීමටත්, බස් රථ ගෙන්වීම ටත් මුදල් වෙන්කරගන දැන් එතුමා ක්‍රියා කරගෙන යනවා.

ගරු කථානායකතුමනි, පසුගිය රජය කාලයේ මැයි දින පෙළපාලිවලට "විශේෂ" බස් රථ කියා විශේෂ ගණන්වලට බස් රථ වෙන්කර දුන්නේ පුදුම විධියකටයි. ලොකුම තොගය ඒ අයගේ පක්ෂයට ; අපට දුන්නේ ඉතාමත්ම සුළු සංඛ්‍යාවක්. (බාධා කිරීමක්) නැහැ. අපි එහෙමවත් බස් රථ දෙන්නේ නැහැ. කොත්මලේ මන්ත්‍රීතුමා (ආනන්ද දසනායක මහතා) ඊයේ මෙහෙම කියා තිබෙනවා ; "අපි ටවුන් හෝල් එක ඉල්ලු වම මාස 6 කට පෙර සිට ඒකත් වෙන් කර ගෙනයි කියනවා". එහෙම වෙන්න ඇති. එය කවුරුත් හෝ වෙන්කර ගෙන ඇති. එයට කරන්ට දෙයක් නැහැ. මාස 6 කට පෙර තමුන්නාන්සේලා ඕවා ඔක්කොම මතක නැති කරලයි සිටියේ.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

ගරු අගමැතිතුමා මට පිකක් ඉඩ දෙනවා නම්—

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
(Mr. R. Pemadasa)

මම කථා කර අවසන් වුණාම තමුන් නාන්සේට අවශ්‍යවෙයි කියා මා හිතන්නේ නැහැ. කථා කරන්න. ඒ නිසා විකක් ඉව සන්න. මැයි දිනයක් අවසන් වූ හැටියේ අප කරන්නේ ඊළඟ මැයි දිනයට සූදානම් වීමයි. අපේ වෘත්තීය සමිති කටයුතු කරන්නේ එහෙමයි. නමුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සිදුවුණේ කුමක් ද? ඔවුන් මැතිවරණයට මුහුණ දුන්නේ පරදිනවා කියා හිතාගෙන නොවෙයි. නමුත් ඡන්දය දුන් දාට පසුවදා එළිවෙලා බලන විට පැරදිලා ඊට පසුව හැම දෙයක්ම එපා වුණා. මැයි දිනෙත් එපා වුණා. ඔක්කොම එපා වුණා. එනිසා ඉල්ලුම් පතක් ඉදිරිපත් කරන් නත් බැරි වුණා. අනෙක් උදවිය ඉල්ලුම් පත් ඉදිරිපත් කර තිබෙනවා, ඒ ඒ ස්ථාන මැයි දින රැස්වීම් පැවැත්වීම සඳහා යොදා ගැනීමට. නමුත් කොත්මලේ ගරු මන්ත්‍රීතුමා මොකක්ද කියන්නේ? "අපි ටවුන් හෝල් එක ඉල්ලුවහාම කියනවා. මාස 6 කට පෙර සිට ඒකත් වෙන් කරගෙනලු. මොකක්ද වෘත්තීය සමිති සංවිධානයකින්. ඊට පසු අපි හයිඩ් පාක් එක ඉල්ලුවා. ඒකත් වෙන් කර ගෙනලු. ඊට පසුව අපි හැව්ලොක් පාක් එක ඉල්ලුවා. ඒකත් වෙන් කරගෙනලු. මෙතැන විශාල අසාධාරණයක් තිබෙන බව මහජනයාට පෙනෙන්නේ නැද්ද?" එතුමා මෙයින් පෙන්වන්න උත්සාහ ගන්නේ අප ඉඩ දුන්නේ නැහැ කියායි. හොඳයි අපි හැව්ලොක් පිටිය දෙන්නම්. මොකද කියන්නේ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)
හොඳයි.

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
(Mr. R. Pemadasa)
කථානායකතුමනි, තමුන්නාන්සේ ඉදිරියේ මා කියනවා එය දෙනවා කියා. එය ලොකු පිට්ටනියක්. එතුමන්ලා වෙනදා පෙළපාලිය පටන් ගන්නා පිට්ටනිය. එනිසා අපි හැව්ලොක් පාක් එක දෙනවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට මැයි දින උත්සව සඳහා. එනිසයි මා කිව්වේ ඒ මන්ත්‍රීතුමාට අවශ්‍ය වන්නේ නැත කියා ඒ ගැන කථා කරන්නට. නමුත් ඔහොම දුන්නෙ නැහැ අපට.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)
ටවුන් හෝල් එක දුන්නා.

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
(Mr. R. Pemadasa)
අපි ඉල්ලුවේ "ගෝල්ෆේස්" පිට්ටනිය. ටවුන් හෝල් එකේ අපට ඉල්ලන්න දෙයක් තිබුණේ නැහැ. එය තිබුණේ අපේ පාලනය යටතේ, පවුසි එහා පැත්තට පනින්න ඉස්සරවෙලා. කථානායකතුමනි කොත්මලේ මන්ත්‍රීතුමා ඉල්ලූ මොනවාද දුන් අප නොදුන්නේ ?

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)
පෙළපාලි යාම.

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
(Mr. R. Pemadasa)
පෙළපාලි යන්න ඉඩ දෙනවා.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)
වාහන.

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
(Mr. R. Pemadasa)
වාහන කාටවත් දෙන්නේ නැහැ. අපි පෙළපාලි යන්නෙත් නැහැ. තමුන්නාන්සේලා කොතැන සිටද පෙළපාලිය පටන් ගන්නේ ?

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)
හැව්ලොක් ටවුන් එකේ සිට.

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
(Mr. R. Pemadasa)
හැව්ලොක් ටවුන් එකේ නොවැ රැස්වීම පැවැත්වෙන්නේ. ඉතින් එතැන පෙළපාලියකුත් පවත්වන්නට පුළුවන්ද ?

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)
ටවුන් හෝල් එක ළඟ සිට ?

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு ஆர். பிரேமதாச)*
(Mr. R. Pemadasa)
එතැන වෙනත් පක්ෂයක් රැස්වීමක් පැවැත්වීමට වෙන්කර ගත තිබෙන නිසා ඉඩ දෙන්න බැහැ. ටවුන් හෝල්, හයිඩ් පාක්, ගෝල් ෆේස්, හැව්ලොක් පාක්, ආදිය රැස්වීම් සඳහා වෙන්කර තිබෙනවා. ලංකා සමසමාජ පක්ෂය සිය පෙළපාලිය පටන්ගන්නේ කැම්බල් පාක් එකෙන්. එනිසා එතැනත් දෙන්නට බැහැ. වෙන තැනක් සොයා ගන්න. අපි පොලීසියට නියම කරනවා සාකච්ඡා කර මේ ගැන සාධාරණ ලෙස කටයුතු කරන්නය කියා. නමුත් තමුන්නාන්සේ ඉල්ලූ විධියට හැව්ලොක් පාක් එක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට දෙනවා. මැයි දින රැස්වීම පැවැත්වීමට.

මේ හැම කොට්ඨාශයකටම මේ මැයි දින උත්සවය පවත්වන්නට සුදුසු ස්ථාන ලබා දීමට කටයුතු කරන ලෙස දැනටමත් පොලීසියට නියෝග දීලයි තිබෙන්නේ නමුත් මා විශේෂයක් කළා ශ්‍රී ලංකා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිදහස් පක්ෂයට, කොත්මලේ මන්ත්‍රීතුමා ඊයේ මේ ප්‍රශ්නය මතු කළ නිසා, එතුමා ඊයේ ප්‍රකාශය කර තිබෙනවා අපි හැම තැනක්ම "බ්ලොක්" කරගෙන "බුක්" කරගෙන තිබෙනවාය කියා. ඔන්න මා දැන් එතුමා ඉල්ලූ තැන දුන්නා. හැම තැනම "බුක්" කර තිබෙනවාය කියා එතුමා සඳහන් කර තිබෙනවා. ඔන්න, එතුමා ඉල්ලා ඇති තැනම අපි එතුමාට දෙනවා; ගැම්ලොක් පිටියම දෙනවා.

අපට ප්‍රතිපත්තිමය වශයෙන් දේශපාලන වාද භේද ඇති කරගෙන ජනතාව ඉදිරියට ගොස් ඒවා විසඳා ගන්නට මාර්ගයක් තිබෙනවා. එහෙත් මැයි දිනය පටු දේශපාලන පරමාර්ථයන් මුදුන් පත් කර ගැනීමට නොව පොදු ජාතික ව්‍යායාමය කට පාවිච්චි කරන්නට අප කල්පනා කරන්නට ඕනෑ. එහෙම කල්පනා කරලා තමයි, එක්සත් ජාතික පක්ෂයේ වෘත්තිය සමිතිත්, වෙනත් ජන සම්මතවාදී වෘත්තීය සමිතිත් මේ අවස්ථාව පවත්වන්නේ. එහෙම කල්පනා කර තිබෙන නිසා තමයි, එක්සත් ජාතික පක්ෂයේ මැයි දින උත්සව ගෝල්ෆේස් පිට්ටනියේ පමණක් නොව දිවයිනේ වෙනත් නගර කීපයකම පවත්වන්නට කටයුතු සලස්වන්නේ. විශාල සේනාවක් අප බලාපොරොත්තු වන නිසා ඒ විධියට දිස්ත්‍රික්ක කීපයක ප්‍රධාන නගරවලත් අප අපේ රැස්වීම් පවත්වනවා. එතකොට සියලුම දෙනා කොළඹට රැස්වන්නේ නැහැ. පිට පළාත්වලටත් ඒ අවස්ථාව ලබා දෙන හැටියට අප දැනටමත් උපදෙස් දී තිබෙනවා.

මේ මැයි දිනයේදී අප පෙන්වන්නට බලාපොරොත්තු වන්නේ අපේ දේශපාලන පක්ෂයේ බලය හෝ අපේ පිරිස් වල බලය හෝ නොවෙයි. අධිෂ්ඨානය හා කැප වීමේ උදාරත්වය පෙන්වීම සඳහා අප ඒ අවස්ථාව යොදා ගන්නවා. ඒ මිස පුහු ආටෝපය සඳහා අප ඒ අවස්ථාව යොදා ගන්නේ නැහැ. රට හැදීමේ වැඩ පිළිවෙල ගැන පෙන්වා දීමට අප ඒ අවස්ථාව යොදා ගන්නවා. අවුරුදු හයක අපේ පාලන කාලය අවසන් වන විට, පසු ගිය ජූලි මාසයේ 21 වැනිදා ඡන්දය දෙන්නට ගිය අවස්ථාවේදී මේ රට තිබුණු තත්ත්වයට වඩා උසස්, සශ්‍රීක, ව්‍යසනා වන්ත රටක මේ රටේ ජනතාව ජීවත් කර වීම සඳහා ඒ ජනතාවගේ සහයෝගය ලබා ගෙන, ඔවුන්ගේ අදහස් අනුව මේ රට හැදීමේ කටයුත්ත ඉෂ්ට කිරීමට අප පොරොන්දුවක් දී තිබෙනවා. ඒ නිසා මේ ආණ්ඩුව පිහිටු වීමෙන් පසුව ඇති වන පළමුවැනි මැයි දිනයේදීම ශ්‍රමයට, බුද්ධියට, උනන්දුවට මුල් තැන දෙන්නටත්, වාද භේද අමතක කර පොදු පරමාර්ථය කට ජනතාව යොමු කරවීමටත් එය අවස්ථාවක් කර ගන්නට අප කල්පනා කළා. මට මේ ප්‍රකාශය කිරීමට අවස්ථාව සලස්වා දීම ගැන ගරු කථානායකතුමාට ස්තුති වන්ත වෙනවා.

## පාසල් සංවර්ධනය සඳහා සෑම මන්ත්‍රී කොට්ඨාශයකම නියමු ක්‍රමයක්

*பாடசாலைகளின் முன்னேற்றத்துக்காக ஒவ்வொரு தேர்தல் தொகுதியிலும் பரீட்சார்த்த செயல் திட்டம்*

## PILOT PROJECT IN EVERY ELECTORATE FOR THE DEVELOPMENT OF SCHOOLS

**කල් තබන ලද මිචාදය නව දුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාල ප්‍රශ්නය— [ජනවාරි 4]**

"කොළඹ සහ ඒ අවට පාසැල්වල සංවර්ධන කටයුතු සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් විශාල මුදල් සම්භාරයක් වෙන් කරනු ලබන අතර පිට පළාත්වල පාසැල් සඳහා එපමණ මුදලක් වෙන් නොකිරීම නිසා බදුල්ල වැනි දුර බැහැර පළාත්වල පාසැල් තවමත් නොදියුණු තත්ත්වයක පවතින බැවින් පිටපළාත්වල වෙසෙන දරුවන්ට එයින් විශාල අසාධාරණයක් සිදු වී ඇති හෙයින්, මුදල් වෙන් කිරීමේදී කොළඹ ප්‍රදේශයේ පාසැල්වලට වඩා විශේෂයෙන්ම බදුල්ල වැනි නොදියුණු පළාත්වල පාසැල්වලට විශේෂත්වයක් හා ප්‍රමුඛත්වයක් දැක්විය යුතු යයි ද; නියමු ක්‍රමයක් වශයෙන් සෑම මැතිවරණ කොට්ඨාශයකින් ම එක් පිරිමි පාසැලක් හා එක් ගැහැණු පාසැලක් තෝරා ගෙන ඒවා පළමුවැනි ශ්‍රේණියේ පාසැල් ලෙස වර්ග කොට සංවර්ධනය කළ යුතු යයි ද මෙම ජාතික රාජ්‍ය සභාව අදහස් කරයි." [ඩී. වින්සන්ට් ඩයස් මහතා]

*ஒத்திப்போடப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது. [4 ஜனவரி]*

*"கொழும்பிலும் அதனை அடுத்துள்ள பிரதேசங்களிலும் உள்ள பாடசாலைகளின் முன்னேற்றத்திற்காக கல்வி அமைச்சு மிகப் பெருந் தொகையான பணத்தை ஒதுக்கியுள்ளதாலும், அதே அளவிலான தொகை வெளியிடங்களில் உள்ள*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

பாடசாலைகளுக்கு ஒதுக்கப்படாமையினாலும், பதுளை போன்ற ஒதுக்குப்புறங்களிலுள்ள பாடசாலைகள் இன்னமும் முன்னேற்றமடையாமல் இருப்பதனால் ஒதுக்குப்புறங்களில் வாழும் பிள்ளைகளுக்குப் பெரும் அநீதி விளைவிக்கப்படுகின்றமையினாலும், பணம் ஒதுக்கப்படும்போது கொழும்புப் பிராந்தியத்திலுள்ள பாடசாலைகளிலும் பார்க்க முன்னேற்றமடையாத பகுதிகளிலுள்ள பாடசாலைகளில், குறிப்பாக பதுளைப் பிராந்தியத்திலுள்ள பாடசாலைகளில், விசேட கவனம் செலுத்தியும் முன்னுரிமையும் கொடுக்கப்பட வேண்டுமெனவும், ஒவ்வோர் தேர்தற்றொகுதியிலும் இருந்து ஓர் ஆண்கள் பாடசாலையையும், ஒரு மகளிர் பாடசாலையையும் தெரிவு செய்து அவற்றை I ஆந் தரப் பாடசாலையாகத் தரப்படுத்தி பரீட்சார்த்த செயற்றிட்டத்திற்கு முன்னேற்ற வேண்டுமென இப்பேரவை கருதுகிறது—[திரு. டீ. வின்சன்ற் டயஸ்].

*Order read for resuming Adjourned Debate on Question [4th January.]*

" That, since as a result of a stupendous sum of money being allocated by the Ministry of Education for the development of schools in Colombo and its suburbs, and such an equal amount of money not being set apart for the schools in outstation areas, the schools in the remote areas such as Badulla still remain underdeveloped thereby causing a grave injustice to the children living in peripheral areas, this Assembly is of opinion that in the allocation of funds special consideration and priority should be given to the schools in such underdeveloped areas, particularly the schools in the Badulla region, rather than to the schools in the Colombo region ; and that a Boys' School and a Girls' School be selected from every electorate and they be graded as Grade I schools and developed as pilot projects. " [*Mr. D. Vincent Dias.*]

ප්‍රශ්නය යළි සභාභිමුඛ කරන ලදී.

*வினா மீண்டும் எடுத்தியம்பப்பெற்றது.*

*Question again proposed.*

අ. භා. 2. 50

**ආනන්ද දසනායක මහතා**

*(திரு. ஆனந்த தஸநாயக்க)*

(Mr. Ananda Dassanayake)

ගරු කථානායකතුමනි, එදා මෙම යෝජනාව යටතේ කථා කරමින් සිට නැවැත්ව ස්ථානය මට මතකයි. ඒ ඒ ඡන්ද කොට්ඨාශවල එක උසස් පාසල බැගින්වත් පිහිටුවිය යුතුය කියන අදහස අනුව මා කථා කරගෙන ගියා. මා නියෝජනය කරන කොට්ඨාශයේ පාසල්වල ගුරුවරුන් විශාල පිරිසක් මාරු කර යැවීම නිසා ගුරු හිඟයක් ඇති වී තිබෙන බවත් මා කිව්වා; විශේෂයෙන්ම හැම ප්‍රදේශයකම විශේෂඥ ගුරුවරුන් වශයෙන් සිටි අය මාරු කර යවා තිබෙනවා. සමහරවිට මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම් අනුව අපේ ප්‍රදේශයේත් එවැනි ගුරුවරුන් තිස් ගණනක් පමණ ගිහිල්ලා තිබෙනවා. එදා ගරු අගමැතිතුමා නුවරඑළියේ දිස්ත්‍රික් සම්බන්ධිකරණ කාරකසභා රැස්වීමේදී කිවේ කොත්මලේට පමණක් නොව මුළු නුවරඑළිය දිස්ත්‍රික්කයටම විශේෂඥ ගුරු හිඟයක් තිබෙන බවයි. අධ්‍යාපනය දියුණු කරන්නට නම් ගුරු හිඟය නැති කරනවා වාගේම විද්‍යාලවල තත්ත්වය උසස් කරන්නටත් ඕනෑ.

මා නියෝජනය කරන ප්‍රදේශයේ තිබෙන හැඳුණුවැව මධ්‍ය මහා විද්‍යාලය ඒ ප්‍රදේශයේ උසස් අධ්‍යාපන ආයතනය බවට පත් කිරීම හොඳටම ප්‍රමාණවත් වෙනවා. ඒකට ඕනෑ කරන්නේ ගුරුවරුන් අංග සම්පූර්ණ විද්‍යාගාරයක් හා කාර්මික අංශයක් පමණයි. අමුතුවෙන් ගොඩනැගිලි ඇදිය අවශ්‍ය නැහැ. අපි අපේ ළමයින් රාජකීය විද්‍යාලයට ඇතුළත් කර ගන්න උත්සාහ කරන්නෙ, ආනන්ද විද්‍යාලයට ඇතුළත් කර ගන්නට උත්සාහ කරන්නෙ ඒවායේ හොඳ විශේෂඥ ගුරු මණ්ඩල ඇති නිසයි. ඒ විද්‍යාලයකට තම දරුවා ඇතුළත් කර ගත්තොත් ස්වීරව ඔහු දක්ෂයකු වශයෙන් දියුණු කර ගන්න පුළුවන්ය යන හැඟීමක් හැම දෙමව්පියන් තුළම වගේ කා වැදී තිබෙනවා. දෙමව්පියන් බලාපොරොත්තු වෙන්නෙ තම දරුවන් උසස් පාසල්වලට යවා දක්ෂ ලෙස විභාගවලින් සමර්ථ කරවාගෙන සමහරවිට විශ්ව විද්‍යාල අධ්‍යාපනයකුත් ලබා දී සමාජයේ උසස් පුද්ගලයන් බවට පත් කිරීමටයි. නගරබද පාසල්වලට ළමයින් ඇදී යාම නතර කරන්නට නම්, බදුල්ල මහජන මන්ත්‍රීතුමා අදහස් කරන්නා වගේ, අඩු වශයෙන් සෑම ඡන්ද කොට්ඨාශයකින්ම අඩු වශයෙන් මහා විද්‍යාල එකක් හෝ දෙකක් තෝරා ගෙන, නැත්නම් මධ්‍ය මහා විද්‍යාල තිබෙන ස්ථානවල නම් එයින් එකක් තෝරාගෙන අංග සම්පූර්ණ උසස් විද්‍යාල වශයෙන් ඒවා දියුණු කළ යුතු බවයි, මමත් අදහස් කරන්නෙ.

රාජකීය විද්‍යාලයේ නැත්නම් ආනන්ද විද්‍යාලයේ තිබෙන පහසුකම් ඡන්ද කොට්ඨාශ 5 ක් 6 ක් වෙනුවෙන් පිහිටුවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙන මධ්‍ය මහා විද්‍යාලවලත් ඇත්තෙ නැහැ. ලුම්බිණී විද්‍යාලය වැනි කොළඹ සාමාන්‍ය විද්‍යාලවල තිබෙන පහසුකම් ගම්බද මධ්‍ය මහා විද්‍යාලවලවත් ඇත්තෙ නැහැ. හැබැයි ගොඩනැගිලි නම් අඩුපාඩු නැතිව තිබෙනවා. ඩෙස්ක් බංකු ටික නැහැ. අවශ්‍ය උපකරණ නැහැ. විශේෂඥ ගුරුවරුන් නැහැ. විද්‍යාගාර නැහැ. කාර්මික අංශ නැහැ. මේ කරුණු හරිහැටි සපයා දෙනවා නම් ඒ විද්‍යාල උසස් තත්ත්වයට පත් කරන්නට පුළුවන්. අධ්‍යාපන ඇමතිතුමා හෝ නියෝජ්‍ය ඇමතිතුමා හෝ මේ සභාවේ සිටින බවක් පෙනෙන්න නැහැ. ඒ නිසා පාර්ලිමේන්තු සහ ක්‍රීඩා කටයුතු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා, මේ කරුණු අධ්‍යාපන ඇමතිතුමාට මතක් කරන්න කියා.

මුළු ලංකාවෙම තිබෙන්නෙ මධ්‍ය මහා විද්‍යාල 52 ක් තරමයි. නිදහස් අධ්‍යාපනයේ පියා හැටියට සලකන සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමාට කරන ගෞරවයක් වශයෙන් මෙම මධ්‍ය මහා විද්‍යාල කොළඹ උසස්ම විද්‍යාලවල තත්ත්වයට දියුණු කිරීමට පියවර ගත යුතුයි. එතුමාගේ පරමාර්ථය වුණෙත් එයයි.

මහා විද්‍යාල රාශියක් රටපුරා තිබෙනවා. මගේ ආසනයේත් මහා විද්‍යාල 7 ක් පමණ තිබෙනවා. ඒවා කෙරෙහිත් මීට වඩා සැලකිල්ලක් දැක්විය යුතුයි. රාජකීය විද්‍යාලය, ආනන්ද විද්‍යාලය, නාලන්ද විද්‍යාලය, සෙන්ට් ජෝසප් විද්‍යාලය, සෙන්ට් ඇන්තනීස් විද්‍යාලය වැනි උසස් විද්‍යාලවලට කවුරුත් කැමති වෙන්නෙ ඒවා අංග සම්පූර්ණ නිසයි. ගම්බද පාසැල්වල ක්‍රීඩා අතින් දියුණුවක් ඇත්තෙ නැහැ. ඒ පාසල්වල ක්‍රීඩා දියුණු කරන්න කවුරුවත් උනන්දුවක් දක්වන්නෙත් නැහැ. ගම්බද විද්‍යාලවල ක්‍රිකට්, පුට් බෝල් වැනි ක්‍රීඩා පුහුණු කරන්නෙ නැහැ. කොළඹ උසස් විද්‍යාලයකට ආවාම නගරබද උසස් විද්‍යාලයකට ආවාම මේ සෑම අංශයකම අධ්‍යාපනයක් ලබා ගන්න පුළුවන්. ඒ නිසා එම්මි විදහල්වලට තම දූ දරුවන් එවන්නට දෙමව්පියන් උත්සාහ ගැනීම පුදුමයක් නොවෙයි. දැනට නම් වර්තමාන ක්‍රීඩා ඇමතිතුමා ගම්බද විද්‍යාලවල ක්‍රීඩා කට යුතු නගා සිටුවීමට ක්‍රියා කරගෙන යනවා. ප්‍රාදේශිය මට්ටමින් ක්‍රීඩා දියුණු කිරීමේ කටයුතු දැනට වඩා ටිකක් වේගයෙන් කරනවා නම් හොඳයි. අපේ ප්‍රදේශයේ මධ්‍ය මහා විද්‍යාලවලට හොඳ ක්‍රීඩා පිටි ලබා දෙනවා නම් හොඳයි.

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
*(திரு. எம். வின்சன்ற் பெரேரா)*
(Mr. M. Vincent Perera)

ඉල්ලන්න එපායැ, දෙන්න. අඬන්න එපායැ, කිරි එරෙන්න.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

තමුන්නාන්සේ දෙන බව මා දන්නෙ නැහැ. දෙන බව දන්නවා. නම් ඉල්ලනවා. මා හිතන විධියට ගම්බද විද්‍යාලවලත් ක්‍රීඩා දියුණු කළොත් කොළඹ විද්‍යාලවලට ම ළමයින් ඇතුළත් කිරීමට උත්සාහ කිරීම අඩු වෙනවා ඇති. එමෙන්ම ආර්ථික වශයෙනුත් රටට ලාභයක් වෙනවා. දෙපාර්තමේන්තුවටත් ලාභයි; ජනතාවටත් ලාභයි.. මා හිතන විධියට ඒ විද්‍යාල දියුණු කිරීමේ පදනම වන්නට ඕනෑ එයයි. පළමුවෙන්ම මධ්‍ය මහා විද්‍යාල පණස් අදක දියුණු කරන්න. ඒවාට අංග සම්පූර්ණ විද්‍යාගාර, වර්ක් ෂොප්ස්, කාර්මික අංශ, විශේෂඥ ගුරුවරු, ක්‍රීඩා අංශ ආදිය සපයන්නට ඕනෑ. ක්‍රිකට්, කොළඹට හෝ මහනුවරට සීමා කර බැහැ. එය ජනප්‍රිය ක්‍රීඩාවක් හැටියට මුළු ලංකාවම පිළිගෙන තිබෙනවා. ජාතික ක්‍රීඩාවක් තත්ත්වයට පත් වී තිබෙනවා. ඒ නිසා හැම විද්‍යාලයකම ක්‍රිකට් ක්‍රීඩාව පවතින තත්ත්වයට එය දියුණු කරන්න ඕනෑ. එබඳු තත්ත්වයක් ඇති වුණොත් හැම කෙනෙක්ම කොළඹට කඩා පනින්නේ නැතිව ළමයින් කොළඹ විද්‍යාලවලටම ඇතුළත් කිරීමට ගන්නා උත්සාහය අඩු වෙනවා ඇති. ළමයෙක් කොළඹ විද්‍යාලයකට ඇතුළත් කළාම මාසයකට රුපියල් පන්සියක හයසීයක වියදමක් දරන්න වෙනවා. මාසයකට රුපියල් 525 ක් ගෙවන්න කියා ගෙදරට බිල යනවා. සමහර අයට එය ගෙවාගන්නත් බැහැ. එහෙත් ඉඩමක් විකුණා හෝ එය ගෙවීමට දෙමව්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආනන්ද දසනායක මහතා]

පියන් පෙළඹෙනවා. [බාධා කිරීමක්] මගේ ළමයින් ඉන්නේ ගම්බද පාසල්වලමයි කොළඹට එවන්න මම උත්සාහ කළේ නැහැ.

ගරු කථානායකතුමනි, මේ යෝජනාව ඉතාම වැදගත්. මා විශේෂයෙන්ම ඉල්ලන ක්‍රීඩා අමාත්‍යාංශයෙන් කෙරෙන්නට ඕනෑ විශේෂම දෙය තමයි, මධ්‍ය මහා විද්‍යාලවල ක්‍රීඩා අංශ සියයට සියයකින් දියුණු කිරීම. මධ්‍ය මහා විද්‍යාලත් කොළඹ රාජකීය, ආනන්ද, නාලන්ද, සාන්ත ජෝෂප් ආදී විද්‍යාලවල තත්ත්වයට නංවන්නට ඕනෑ. එසේ වන විට ලංකාවේ හැම තැනකම සමාන තත්ත්වයක් පෙන්නුම් කෙරෙනවා. එවිට කොළඹට එන්න වුවමනාවක් නැහැ. ගම්බද විද්‍යාල පහළ තත්ත්වයක තිබීමට පළමුවැනි හේතුව ක්‍රීඩා දියුණුව අඩුකමයි. ඒ නිසා මධ්‍ය මහා විද්‍යාල ක්‍රීඩාවලින්, විශේෂඥ ගුරුවරුන්ගෙන් උපකරණවලින්, විද්‍යාගාරවලින් හා කාර්මික අංශයන්ගෙන් දියුණු කළොත් එයින් විශාල සේවයක් සිදු වෙනවා කියා මා ප්‍රකාශ කරන්න කැමතියි.

මේ සම්බන්ධව කථා කිරීමට අපට අවස්ථාව සලසමින් මේ යෝජනාව මේ ගරු සභාවට ඉදිරිපත් කළ බදුල්ල ගරු මන්ත්‍රීතුමාට (ඩී. වින්සන්ට් ඩයස් මහතා) මගේ ස්තුතිය පුද කරමින් මේ යෝජනාවට මගේ කැමැත්ත මා ප්‍රකාශ කරනවා.

**පී. ගනේෂලිංගම් මහතා (පඩිරිප්පු)**
(திரு. பி. கணேசலிங்கம்)—(பட்டிருப்பு)
(Mr. P. Ganeshalingam—Paddirippu)

மாண்புமிகு சபாநாயகர் அவர்களே, இந்தப் பிரேரணையின் முக்கியத்துவத்தை நாம் எடுத்துப் பார்க்க வேண்டும். இந்த ஆண்டு கல்வி அமைச்சுக்கு ஒதுக்கீடு செய்துள்ள நிதியில் 75 சதவிகிதமான நிதி கொழும்பு நகரிலுள்ள பாடசாலைகளுக்கு ஒதுக்கீடு செய்யப்பட்டிருக்கிறது. இதேபோன்று மாவட்ட அடிப்படையிலும் எடுத்துப் பார்த்தால் கல்வி அமைச்சிலும் கல்வித்திணைக்களத்திலுமுள்ள அதிகாரிகள் நினைக்கிறார்கள் நகரப் புறங்களில் இருக்கும் மாணவ மாணவிகள் மட்டும்தான் கல்வி பயில வேண்டும், கிராமப் புறங்களில் உள்ள மாணவ மாணவிகளுக்கு இந்த வசதிகள் அளிக்கப்படக்கூடாதென்று. அண்மையிற்கூட எனது தொகுதியிலே ஒரு மகாவித்தியாலயத்திற்கு விஞ்ஞான ஆசிரியர் இல்லை என்று நான் கேட்டபோது கல்வி அதிகாரி "மட்டக்களப்பு மாநகரத்திலுள்ள பாடசாலைகளுக்கே விஞ்ஞான ஆசிரியர்கள் பற்றாக்குறையாக இருக்கும்போது இப்படியான மகாவித்தியாலயங்களுக்கு விஞ்ஞான பாடங்கள் படிப்பிப்பதற்கு எப்படி ஆசிரியர் தர முடியும்" என்று கேட்டார். அப்போது மட்டக்களப்பில் உள்ள அர்ச் மைக்கல் கல்லூரியில் எத்தனை ஆசிரியர்கள் இருக்கிறார்கள் என்று நான் அந்த அதிகாரியிடம் கேட்டபோது பத்து ஆசிரியர்கள் இருக்கிறார்கள் என்று கூறினார்.

கல்வி அமைச்சு கொழும்பை எப்படி முக்கியமாகக் கணிக்கிறதோ அதேபோன்று கல்வித் திணைக்களத்தில் கடமைபுரியும் மாவட்ட உயர் அதிகாரிகள் அத்தனைபேரும் மாவட்டங்களில் இருக்கும் மாநகரப் பாடசாலைகளைத்தான் கவனிக்கிறார்கள். அவர்கள் கிராமப் புறங்களில் இருக்கும் பாடசாலைகளைப் பற்றிச் சிந்திப்பது கிடையாது. முன்னிலைக் கல்வியைப் புதிய முறையிற் கற்கவேண்டிய முதலாம் வகுப்பு மாணவ மாணவிகள் கிராமங்களில் தரையில் இருந்து படிக்கிறார்கள் அங்கே, எமது பகுதிகளிலே அனேக பாடசாலைகளில் பிள்ளைகளுக்கு வேண்டிய தளபாடங்கள் கிடையாது, றோயல் கல்லூரி போன்று ஏனைய பாடசாலைகளைத் தரமுயர்த்தவேண்டுமென்று நாங்கள் கேட்கும் நேரத்தில் கிராமப்புறங்களில் ஆட்டு மந்தைகளைப்போல சிறிய குடிசையில் தரையில் இருந்து எமது வருங்காலச் சந்ததிகள் கல்வி பயிலுகிறார்கள். இந்த நிலை மாறவேண்டும்.

உதாரணமாக, தம்பலவத்தை கனிஷ்ட பாடசாலையில் எட்டாம் வகுப்புவரை கல்வி பயிற்றப்படுகின்றது. கணிதமோ விஞ்ஞானமோ கற்பிக்க எந்த ஓர் ஆசிரியரும் அங்கு கிடையா. கல்வித் திணைக்களத்திலே என்ன கோரிக்கை விடுத்தாலும்கூட அவற்றிற்குப் பதிலே கிடைக்கக்கூடிய நிலை இல்லை. கல்வி அமைச்சில் யார் யார் என்ன வேலை செய்கிறார்கள் என்று அறிய முடியாமல் இருக்கிறது. மாவட்ட கல்வி அலுவலகத்தில் எந்த ஒரு பாடசாலைக்கும் அதிபர் தேவை

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

என்று கேட்டாற்கூட அவர்கள் சொல்கிறார்கள் கல்வித் திணைக்களத்திலிருந்து தங்களுக்கு அறிவித்தல் வந்திருக்கிறது Performing Principals நியமிக்க முடியாதென்று. ஆனால், அதே நேரத்தில் மட்டக்களப்பு மாவட்டத்தில் உள்ள அனேக பாடசாலைகளில் Performing Principals கடமை பார்க்கிறார்கள். அப்படிக் கடமைபார்த்துக் கொண்டு வருகின்ற அவர்கள்கூட சில சமயங்களில் முன்னறிவித்தல் இன்றி வேறு இடங்களுக்கு மாற்றப்படுகிறார்கள். பல பாடசாலைகளில் எந்தவிதமான அதிபரும் இல்லை. பல பாடசாலைகளில் நான்காந்தர அதிபர்கள் கடமை ஏற்பதால் நிர்வாகம் மேலும் மோசம் அடைகின்றது. இந்த நிலைமை மட்டக்களப்புப் பகுதியிலேயுள்ள பல பாடசாலைகளிலே இன்று காணப்படுகின்றது.

நான் சென்று பார்த்த பல பாடசாலைகளிலே இந்த நிலைமையைக் காணக்கூடியதாகவிருக்கிறது. அங்கே ஆசிரியர்கள் பற்றாக்குறை பெருமளவில் இருக்கின்றது. எந்த ஒரு பாடசாலைக்குச் சென்றாலும் அங்கே விஞ்ஞானம் கணிதம் கற்பிப்பதற்கு ஆசிரியர்கள் இல்லை. ஆசிரியர்கள் நியமிக்கப்பட்டிருக்கிறார்கள்; ஆனால் ஜீ. ஸீ. ஈ. சாதாரண தரப் பரீட்சையிலே சித்தியெய்தியவர்கள்தான் விஞ்ஞானம் கற்பிப்பதற்கு அங்கே ஆசிரியர்களாக நியமிக்கப்பட்டிருக்கிறார்கள். எனவேதான் இத்தகைய பிரேரணை மிகவும் முக்கியம் வாய்ந்த ஒரு பிரேரணை என்று நான் கருதுகிறேன்.

கொழும்பிலும் ஏனைய மாநகரங்களிலுமுள்ள பாடசாலைகளைப் போன்று கிராமப்புறங்களிலேயுள்ள பாடசாலைகளும் முன்னேற்றமடையவேண்டும். அதற்காக, ஒவ்வொரு தொகுதியிலும் குறைந்தது இரண்டு பாடசாலைகளாவது முன்னோடிப் பாடசாலைகளாக அமையவேண்டுமென்றும், ஆசிரியர்களின் பற்றாக்குறையைத் தீர்ப்பது மட்டுமல்லாமல் நடைமுறை ரீதியாக, பாடசாலைகளிலேயுள்ள இடவசதிகள், கட்டட வசதிகள், உபகரண வசதிகள் ஆகிய எல்லாவற்றையுமே அதிகரிக்க அமைச்சு நடவடிக்கையெடுக்க வேண்டுமென்றும் கேட்டுக்கொண்டு எனக்குப் பேசுவதற்குச் சந்தர்ப்பமளித்த கௌரவ சபாநாயகரவர்களுக்கு நன்றி தெரிவித்து எனது உரையை முடித்துக்கொள்ளுகிறேன்.

**එච්. ජී. පී. නෙල්සන් මහතා (පොළොන්නරුව)**

*(திரு. எச். ஜீ. பி. நெல்சன்—பொலன்னறுவை)*

(Mr. H. G. P. Nelson—Polonnaruwa)

ගරු කථානායකතුමනි, අධ්‍යාපනය සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති මේ යෝජනාවට මගේ ත් විශේෂ අවධානය යොමු වී තිබෙනවා. 1965-70 කාලය තුළ, එවකට පැවති ඩඩ්ලි සේනානායක මැතිතුමාගේ ආණ්ඩුව මගින් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දරුවන්ගේ යහපත පිණිස ප්‍රථමයෙන්ම රාජකීය මධ්‍ය මහා විද්‍යාලය ආරම්භ කළා. එම විද්‍යාලයට, ඔක්ස්පර්ඩ් විශ්ව විද්‍යාලයකට යැවීමට පවා දක්ෂ සිසුන් බිහි කිරීමට හැකි තත්ත්වයක් තිබුණා. එහෙත් පසුගිය රජය පැවති කාලය තුළ මෙම විද්‍යාලය ත්‍රස්තවාදීන් රඳවා තැබීමේ කඳවුරක් බවට පත් කර තිබුණු නිසා එම විද්‍යාලයේ උපකරණ සම්පූර්ණයෙන්ම වාගේ විනාශ කර දමා තිබෙනවා. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් එහි අධ්‍යාපන තත්ත්වය සම්පූර්ණයෙන්ම විනාශ වී ඇති නිසා එම විද්‍යාලය යථා තත්ත්වයට පත් කිරීමට, ප්‍රතිසංස්කරණය කිරීමට රුපියල් ලක්ෂ පහක පමණ මුදලක් වියදම් කිරීමට සිදු වී තිබෙනවා. මේ සම්බන්ධයෙන් ගරු අධ්‍යාපන ඇමතිතුමා සමග පෞද්ගලික වශයෙන් මා සාකච්ඡා කර කරුණු ඉදිරිපත් කළා. දැන් එම විද්‍යාලයේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අවශ්‍ය මුදල් වෙන් කර ඇති බව මෙහිදී හෙළිදරව් කරන්න කැමතියි.

පොළොන්නරුව දිස්ත්‍රික්කය විශේෂයෙන්ම කෘෂිකාර්මික ප්‍රදේශයක් වශයෙන් සලකන නමුත් පසුගිය දිනවල එම ප්‍රදේශයේ පැවති ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ නිවාසාන්තර මලල ක්‍රීඩා උත්සවයට සහභාගි වුණු මට පෙනී ගියා, දියුණුවෙමින් පවතින නගරවල විද්‍යාලවල ශිෂ්‍ය ශිෂ්‍යාවන් සමග තියුණු තරඟයක් කරන්නට පුළුවන් අන්දමේ දක්ෂකම් ඒ ගම්බද ශිෂ්‍ය ශිෂ්‍යාවන්ටත් ඇති බව. ගරු කථානායකතුමනි, එම මලල ක්‍රීඩා තරඟයේ දී ආචාර පෙළපාලියට සහභාගි වුණු තූර්ය වාදක කණ්ඩායමට අවශ්‍ය බෑන්ඩ් ආදී උපකරණ නොමැති බව මට පෙනී ගියා. ඒ අය බෑන්ඩ් එක වෙනුවට පාවිච්චි කළේ බෙරයක් හෝ රබානක්. නගරවල ඇති විද්‍යාලවල තූර්ය



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පාසල් සංවර්ධනය සඳහා සෑම මන්ත්‍රී කොට්ඨාශයකම නියමු ක්‍රමයක්

[එච්. ජී. පී. නෙල්සන් මහතා]

වාදක කණ්ඩායම්වලට සපයා ඇති තූර්ය වාදක කට්ටල් අපේ කොට්ඨාශයේ විද්‍යාලවලටත් ලබා දීම පිළිබඳව මා ගරු අධ්‍යාපන ඇමතිතුමා සමග අදත් සාකච්ඡා කළා. ඒ අනුව අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් මට පොරොන්දු වුණා, තූර්ය වාදන කට්ටල් තුනක් නොපමාව දීමට කටයුතු යොදනවාය කියා.

ගරු කථානායකතුමනි, ගම්බද ඇති පාසැල්වල අධ්‍යාපන තත්ත්වය දියුණු වන විට නගරබද පාසැල්වල දැනට පවතින තදබදය විශාල වශයෙන් අඩු වෙනවා. එහෙත් මෑතක සිට නගරබද පාසැල්වල අධ්‍යාපන මට්ටමත් ක්‍රමයෙන් අඩුවේගන එන බව පෙනෙන්නට තිබෙනවා. කෙසේ වෙතත් මට පෙර කථා කළ මන්ත්‍රීතුමා සඳහන් කළා වාගේම අපේ ප්‍රදේශවල පාසැල්වලත් විශාල වශයෙන් විද්‍යා ගුරුවරුන්ගේ හිඟයක් පවතිනවා. මේ පිළිබඳවත් මා ගරු අධ්‍යාපන ඇමතිතුමාට කරුණු ඉදිරිපත් කළා. එතුමා පොරොන්දු වුණා. විද්‍යා පුහුණු ගුරුවරුන් කණ්ඩායමක් ඒ ප්‍රදේශවලටත් යවන්නට කටයුතු කරන බවට. මේ අන්දමට අවශ්‍ය දක්ෂ ගුරුවරුන් ඒ ප්‍රදේශවලටත් යවා ගැනීමට හැකි වුණොත් රාජකීය, ආනන්ද වැනි විද්‍යාලවල සිසුන්ට මෙන් අපේ ප්‍රදේශවල අහිංසක සිසුන්ටත් උසස් අධ්‍යාපනය, විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබා ගන්නට හැකි වෙනවාට කිසිම අනුමානයක් නැහැ. ඇත්තවශයෙන්ම අපේ ප්‍රදේශවල අහිංසක ශිෂ්‍යයන් ඉතාමත්ම දක්ෂයි; ඒවාගේම කීකරුයි; නිහතමානියි. මා දන්නා පරිදි පලුගස්දමන මහා විද්‍යාලයෙන් ශිෂ්‍යයන් දහ දෙනෙකු පමණ මෙවර විශ්ව විද්‍යාලයට ඇතුළත් වීම සඳහා තේරී පත් වී තිබෙනවා. අවශ්‍ය උපකරණ නැතත්, අවශ්‍ය ගුරුවරුන් නැතත් තමන්ගේ පෞද්ගලික දක්ෂතාව, උත්සාහය උඩ ඒ දරුවන්ට එම අවස්ථාව ලැබී තිබෙනවා. එම නිසා නගරබද උසස් පාසැල්වලට මෙන් දක්ෂ ගුරුවරුන් හා අවශ්‍ය උපකරණ ඒ ගම්බද විද්‍යාලවලටත් ලබා දෙන්නට හැකි වුණොත් දක්ෂ ඉංජිනේරුවන්, වෛද්‍යවරුන් එම ප්‍රදේශවලිනුත් බිහි කරන්නට පුළුවන් වන බව මතක් කරමින් මේ කරුණුවලට ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන මෙන් ඉල්ලමින් මේ අවස්ථාව ලබා දීම ගැන තමුන්නාන්සේටද ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**වීරවන්නි සමරවීර මහතා** (වියළුව)

*(திரு. வீரவன்னி சமரவீர—வியலுவ)*

(Mr. Weerawanni Samaraweera—Wiyaluwa)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන ඇමතිතුමාගේ අවධානය යොමු කරවීම පිණිස බදුල්ලේ මහජන මන්ත්‍රීතුමා (ඩී. වින්සන්ට් ඩයස් මහතා) විසින් ගෙන එන ලද, දින ගණනක් විවාද වුණු, මේ යෝජනාව ගැන මටත් වචන ස්වල්පයක් කථා කරන්නට ඉඩ ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. මා හිතන හැටියට මේ ගැන කීමට අවශ්‍ය සියලුම කරුණු දැනටමත් කියා අවසානයි. එසේ වුණත් ඌව ප්‍රදේශය වාගේ දියුණුවෙන් අඩු දිස්ත්‍රික්කයක අධ්‍යාපනය ගැන කථා කරන විට, අනිකුත් දෙපාර්තමේන්තුවල ඇති අඩුපාඩුකම් වාගේම මෙම දෙපාර්තමේන්තුව ගැනත් යමක් කියන්න සිදු වී තිබෙනවා. පසුගිය මාස හත අටක කාලය මුළුල්ලේම අප අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අඩුපාඩු ගැන ගරු අධ්‍යාපන ඇමතිතුමාට කරුණු ඉදිරිපත් කළා. මේ අඩුපාඩුකම් දවසකින් දෙකකින් ඇති වුණු ඒවා හෝ, අපේ රජය බලයට පත් වුණාට පසුව ඇති වුණු ඒවා හෝ නොවන බව අප දන්නවා. කාලාන්තරයක් තිස්සේ බලයට පත් වුණු හැම රජයක් යටතේම මේ අඩුපාඩුකම් ගොඩ ගැසුණා. එහෙත්, කාලාන්තරයක් තිස්සේම මේ අඩුපාඩුකම් ගැන අධ්‍යාපන අමාත්‍යාංශයේත් අධ්‍යාපන දෙපාතර්මේන්තුවේත් අවධානය යොමු වුණේ අමාත්‍යාංශය වටපිටාවේ ඇති පාසල් සම්බන්ධයෙන් පමණයි. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ අවධානයට යොමු වුණේ ඒ අයට පැයකින් දෙකකින් වාහනයකින් ගොස් ආපසු එන්නට පුළුවන් තරම් දුර ප්‍රමාණයේ තිබෙන, සියලු සැප පහසුකම් ඇති පාසැල් පමණයි. එවැනි පාසල්වල පමණක් අඩුපාඩුකම් සම්පූර්ණ කිරීම අධ්‍යාපන දෙපාතර්මේන්තුවේ නිලධාරීන්ගේ සිරිතක් වී තිබෙනවා. නිලධාරීන්ගේ දූදරුවන් යන පාසල්, ඒ අයගේ හිතවතුන්ගේ ළමයින් ඉගෙන ගන්නා පාසල් එම නිලධාරීනගෙ අවධානයට ලක් වුණා. මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කණගාටුදායක තත්ත්වය දන් දීර්ඝ කාලයක් මුළුල්ලේ පවතිනවා. මේ විධියේ යෝජනාවක් මෙම ගරු සභාවට ඉදිරිපත් කර මන්ත්‍රීවරුන් විශාල සංඛ්‍යාවක් මෙබඳු කරුණු ඉදිරිපත් කරන්නට හේතු වුණේත් මේ තත්ත්වය නිසා යයි මා විශ්වාස කරනවා.

බදුලු දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ මෙම අඩුපාඩුකම් පටන් ගන්නේ අධ්‍යාපන කාර්යාලයෙන්මයි. එහි අධ්‍යාපන නිලධාරි මහතාට තම සේවය හරි හැටි ඉටු කිරීම සඳහා නිසි විධියේ වාහනයක් නැහැ. ඔහුට තිබෙන්නේ සම්පූර්ණයෙන්ම අබලන් වී ගිය වාහනයක්. හැතැප්ම 20 ක 30 ක ගමනක් ඒ වාහනයෙන් යනවා නම්, යන තැනක නතර වීමට මිස ආපසු එන්නට බලාගෙන නම් යන්න පුළුවන් කමක් නැහැ. තමන්ට මුහුණ පාන්නට සිදු වී තිබෙන අඩුපාඩුකම් ගැන ගුරුවරුන් මෙම අධ්‍යාපන කාර්යාලයට නිතර පැමිණ කා ගහනවා. ළමයින්ට ඉගැන්වීමට රට හුණු කෑල්ලක් පවා සමහර පාසල්වල නැහැ. ගුරුවරුන් අධ්‍යාපන කාර්යාලයට පැමිණ මේ ගැන විමසූ විට එහි නිලධාරීන් කියන්නේ කොළඹ කාර්යාලයෙන් ඒවා සපයා නැති බවයි. ළමයින් ක්‍රීඩා කිරීමට පිට්ටනි නැහැ. ළමයින් ස්වෝත්සාහයෙන් වත් කන්දක් උඩ හෝ පුංචි පිට්ටනියක් හදා ගත්තත් එයින් ප්‍රයෝජන ගන්නට අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ ලැබෙන්නේ නැහැ. ළමයින්ට සෙල්ලම් කරන්නට බෝලයක් පවා එම පාසල්වලට ලැබෙන්නේ නැහැ. අධ්‍යාපන කාර්යාලයේ නිලධාරීන් හැම විටම කියන්නේ ඒවා කොළඹ කාර්යාලයෙන් ලැබී නැති බවයි.

ගුරුවරුන්ගේ හිඟය මේ ප්‍රදේශවල ඉතාමත් තදින් බල පානවා. බණ්ඩාරවෙල දිස්ත්‍රික්කයේ ගුරුවරුන් දහසකගේ පමණ අඩුවක් තිබෙනවා. විදුහල්පතිවරුන් හිඟයි. ඒ ගැන විමසූ විට අධ්‍යාපන කාර්යාලයේ නිලධාරීන් කියන්නේ අමාත්‍යාංශය විසින් මාරු කර යවන ලද විදුහල්පතිවරුන් හා ගුරුවරුන් වෙනුවට වෙනත් අය එවා නැති බවයි. පසුගිය කාලයේදී අධ්‍යාපනයේ සම්පූර්ණ සෝදා පාළුවක් සිදු වුණා. පසුගිය ආණ්ඩුව පාසල් ළමයිනුත් ගුරුවරුනුත් රා අරක්කු පොවාගෙන කුණුහරප පෙළපාළිවල ගෙන ගියා මිස අධ්‍යාපනය ගැන සැලකීමක් කළේ නැහැ. අහිංසක තරුණියන් ලොරිවල දමාගෙන දූෂණය කළා. මේ රටේ ඇති වී තිබෙන අධ්‍යාපන පිරිහීමට පසුගිය ආණ්ඩුව සම්පූර්ණයෙන්ම වගකියන්නට ඕනෑ. විශ්වවිද්‍යාල අධ්‍යාපනය පසුගිය කාලයේදී අන්තයටම පිරිහුණා. පාසල් තුළට දේශපාලනය ආවා. ඒවායේ අධ්‍යාපනය අන්තයටම පිරිහුණා. සමහර පාසල්වල අවශ්‍ය තරම් ඩෙස් බංකු නැහැ. ගුරුවරුන්ට මේස, පුටු නැහැ. වැසිකිළි නැහැ, බොන්න වතුර නැහැ. එහෙත්, පසුගිය ආණ්ඩුවේ සිටි උදවිය ජාතික අධ්‍යාපනයක් ගැන නම් ලොකුවට කෑ ගැහුවා. අධ්‍යාපනය පිළිබඳ නොයෙක් විධියේ අලුත් පනත් මෙම ගරු සභාව තුළ සම්මත වුණා. එහෙත්, ඒවායින් මොනම කෙහෙල්මලක්වත් ගම්බද පාසල්වලට ගියේ නැහැ.

රජයක් ඕනෑකමක් හා අවබෝධයක් ඇතුව වැඩ කරන්නට ඕනෑ. රාජකීය විද්‍යාලය, ආනන්ද විද්‍යාලය, සාන්ත තෝමස් විද්‍යාලය ගැන පමණක් නොවෙයි. ඒ උසස් පාසල්වලට සැපයෙන සහායන්ගෙන් සියයට සියයක් හෝ ගම්බද දුප්පත් දරුවන් ඉගෙනීම ලබන පාසල්වලටත් ලැබෙන්නම ඕනෑ. ඒ දරුවන් වෙනුවෙන් පැවැත්වෙන්නෙ එකම විභාගයක් නම්, එකම විෂයයන් නම්, ඒ අයත් පාලනය වන්නේ එකම අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නම්, එකම දෙපාර්තමේන්තුවෙන් නම්, ඒ අහිංසක දුප්පත් දරුවන්ටත් නියම විධියේ පහසුකම් ලැබෙන්නට ඕනෑ. එහෙත් අද ඒ ළමයින්ට සිදු වී තිබෙන්නේ කිසිම පහසුකමක් නැතිව, නගරබද උසස් පාසල්වල සියලු පහසුකම් ඇති දරුවන් සමග තරග කරන්නයි. ඒකයි, කණගාටුදායක තත්ත්වය. එම නිසා ගරු අධ්‍යාපන ඇමතුමාගේ අවධානයට යොමු විය යුතුයි, ගම්බද පළාත්වල පවතින කණගාටුදායක අධ්‍යාපන තත්ත්වය. මෙතුමාගේ ක්‍රියා පිළිවෙළ යටතේ ඉදිරියේදී එම තත්ත්වය මගහැරේවිය කියා මම විශ්වාස කරනවා. මේ සභාවේ සියළුම මන්ත්‍රීවරු කරුණු කියා සිටියේ තමතමන්ගේ ආසන මට්ටමින්, දිස්ත්‍රික්ක මට්ටමින් අධ්‍යාපන අංශයෙහි පවතින අඩුපාඩුකම් ගැනයි. මේ කාල සීමාව තුළදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරවන්නි සමරවීර මහතා]

බෙදීම් හා විශේෂ සැලකීම් නැතුව පොදුවේ හැම විද්‍යාලයකටම හැම පළාතකටම අධ්‍යාපන පහසුකම් ලැබී ඒ ඒ විද්‍යාලවල පවතින අඩුපාඩුකම් සපුරාගන්න අවස්ථාව සලසා දීම සඳහා ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ අවධානය යොමු වේවායි අවසාන වශයෙන් පතමින් මා නිහඬ වෙනවා.

අ. භා. 3.18

**දයාරත්න වලගම්බාහු මහතා** (මිහින්තලේ)

(திரு. தயாரத்ன வலகம்பாகு—மிஹிந்தலை)

(Mr. Dayaratne Walagambahu—Mihintale)

බදුල්ලේ ගරු මන්ත්‍රීතුමා (වින්සන්ට් ඩයස් මහතා) විසින් අධ්‍යාපනය විමධ්‍යගත කිරීමට අදාලව ඉදිරිපත් කර ඇති යෝජනාව යටතේ වචන ස්වල්පයක් කතා කරන්න මම බලාපොරොත්තු වෙනවා. අනුරාධපුර දිස්ත්‍රික්කය වැනි දිස්ත්‍රික්කවල ඉතා දක්ෂ දරුවන් වෙසෙන බව කියන්න ඕනෑ. එවැනි දිස්ත්‍රික්කයක පවතින අඩුපාඩුකම් ගැන විශේෂයෙන් මතක් කර දෙන්නම ඕනෑ. අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් වියදම් කරන්න බලාපොරොත්තු වෙන මුදල්වලින් සෑහෙන ප්‍රමාණයක් ගම්බද ප්‍රදේශවල අධ්‍යාපන දියුණුව සඳහා වැය කළ යුතුය යන අදහස වියළුව ගරු මන්ත්‍රීතුමා (වීරවන්නි සමරවීර මහතා) විසින් ඉදිරිපත් කරන්න යෙදුණා. මමත් ඒ අදහස අනුමත කරනවා. කොළඹ, මහනුවර සහ යාපනය වැනි ප්‍රදේශවල පිහිටි පාසල්වලට ලක්ෂ ගණන් වියදම් කරනවා. නිය වර්ෂයේ ලක්ෂ 50, 60 වියදම් කරපු පාසල් කොළඹ තියෙන බව අපි දන්නවා. එදා එක විද්‍යාලයක් සඳහා එතරම් මුදලක් වැය වී තිබෙනවාය කිව්වොත් එය බොරු නොවෙයි. නමුත් දුෂ්කර ප්‍රදේශවල පිහිටි එක පාසලකට රුපියල් 50 ක් වත් වැය කර නැහැ, අධ්‍යාපන අමාත්‍යාංශයෙන්. එම තත්ත්වයම අපටත් මේ රජය යටතේ ඇතිවෙලා තියෙනවා. විමධ්‍යගත අයවැයෙන් පමණයි, අපේ ප්‍රදේශයේ පාසල්වලට වියදම් කරන්න වෙලා තියෙන්නේ. එම නිසා අප තුළ ලොකු බියක් තියෙනවා, මේ කාල සීමාව තුළදීත් අපේ පාසල්වල තත්ත්වය එලෙසින්ම පවතීද යන්න ගැන.

කොළඹ පිහිටි ආනන්ද, නාලන්ද රෝයල් ඇති විද්‍යාලවල තත්ත්වයට අපේ ප්‍රදේශවල ඇති විද්‍යාල පත් කරනවාය කියා අපි කෑ ගහනවා; කතා කරනවා; කරුණු ඉදිරිපත් කරනවා. නමුත් කණගාටුයි කියන්න, දුෂ්කර ප්‍රදේශවල ළමුන්ට ඉඳගන්න බංකුවක් ඇත්තේ නැහැ; පුටුවක් ඇත්තේ නැහැ. ගුරුවරුන්ට ලියන්න රටහුණු කෑල්ලක් ඇත්තේ නැහැ; ගුරුවරුන්ට වාසය කරන්න ගුරු නිවාස ඇත්තේ නැහැ. ඒ වාගේම අපේ පාසල්වලට විශේෂඥ ගුරුවරු ඇත්තේම නැහැ. විශේෂයෙන් මගේ මිහින්තලේ ආසනයේ පාසල් 61 කින් 10 ක පමණයි, එක ඉංග්‍රීසි ගුරුවරයා බැගින් ඉන්නේ. පාසල් 51ක ඉංග්‍රීසි ගුරුවරු ඇත්තේම නැහැ. මගේ දනුමේ හැටියට මැදවච්චියේ විද්‍යාල 6ක් පමණ වසා තිබෙනවා, ගුරුවරු නැතුව. අපේ අධ්‍යාපන ඇමතිතුමාත් යම් යම් නිලධාරීන්ගේ මුලාකිරීමකට යටත් වෙලාද කියා සොයා බලන්න වටිනවා. කථානායකතුමනි, කොහොමද, මේ ඉස්කෝලවල අපේ ආණ්ඩුව ආපු ගමන්, ඒ කියන්නේ—හිටපු ගමන්, ගුරුවරු නැති වුණේ කියන එකයි, ප්‍රශ්නය. සමහරවිට ගුරුවරුන්ගෙන් සාමාන්‍ය ප්‍රමාණයක් මාරු වෙන්න ඇති. මේ ගැන අධ්‍යාපන ඇමතිතුමා නොදැන ගත්තත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරුන්ට සහ අධ්‍යක්ෂවරුන්ට වගකීමක් තිබුණා. එතුමාට මේ පිළිබඳව හරි උපදෙස් දෙන්න; හරි පිළිතුරු දෙන්න. "කවුරු ඉල්ලා සිටියත් මේ විදියට මාරු වීම් කරන්න බැහැ; එහෙම කළොත් මේ පාසල වසා දමන්න සිදු වෙනවා" යනුවෙන් නොගැලපෙන මාරුවීමක් කරන අවස්ථාවේදී ඒ අයට උපදෙස් දෙන්න තිබුණා. එවැනි උපදෙස් අධ්‍යාපන ඇමතිතුමාට දී නැති නිසයි, එවැනි වැඩ කෙරී තිබෙන්නේ.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගුරුවරු 1,700 ගණනක් අඩුයි. ළමයි එක්දස් ගණනක් ඉන්න සමහර විද්‍යාලවල ගුරුවරු තුන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දෙනයි ඉන්නේ. දැන් මාස අටක් වෙන්න ආවා. අපි මොනවාද කරන්නේ? අධ්‍යාපන ප්‍රශ්නය මාස ගණන්, අවුරුදු ගණන් සැලසුම් හද හදා තියාගෙන ඉන්න පුළුවන් ප්‍රශ්ණයක් නොවෙයි. අපි මාසයක් ප්‍රමාද වෙන විට ලක්ෂ ගණන්, කෝටි ගණන් පාසැල් දරුවන්ද මාසයක් පස්සට යනවා. සැලසුම් ගහන්න අවුරුදු ගණනක් කල් යෙදුවොත් සිදු වන්නේද, මා මුලින් කීවාක් මෙන් අපේ දරුවන්ගේ දක්ෂතාවයන්ද එතරම්ම කාල සීමාවක් ආපස්සට යාමයි. එම නිසා අපි බලාපොරොත්තු වෙනවා, අපේ රජයෙන් කියාපු හැටියට කොළඹ රෝයල්, ආනන්ද, නාලන්ද සහ මහනුවර ධර්මරාජ වැනි විද්‍යාලවල තත්ත්වයට ගම්බද ප්‍රදේශවල පිහිටි පාසල් දියුණු කරාවිය කියා. අපි විශේෂ වශයෙන් කල්පනා කළ යුත්තේ මුළු ලංකාවේම නොදියුණු ගම්වල තියෙන දුප්පතුන්ගේ දරුවන් යන පාසැල් ගැනයි. අපිට වැඩි පුර ඡන්දය දුන්නේ යමක් කමක් නැති, ඉන්න හිටින්න තැනක් නැති, හරි ආදායමක් නැති දුප්පත් ජනතාවයි. ඔවුන්ගේ දරුවන්ගේ අනාගත අභිවෘද්ධිය තකා, අපි කවුරුත් එකතු වෙලා අධ්‍යාපන අමාත්‍යාංශයේ යම් යම් වැරදි සිදු වෙනවා නම් ඒවා හදාගන්න ඕනෑ. වැරදි කරන නිලධාරීන්, රජයේ වැඩ පිළිවෙලවල් කඩාකප්පල් කර රජය අප්‍රසාදයට පත් කරන්න උත්සාහ කරන නිලධාරීන් ඉන්නවා නම් ඔවුන් ගෙදර යවා හෝ අපේ දුප්පත් දරුවන්ගේ අධ්‍යාපනයේ දියුණුව තකා විශේෂ වැඩ කොටසක් කරන්න අපට භාග්‍යය උදා වේවායි මා ප්‍රාර්ථනා කරනවා. එසේම අධ්‍යාපන අමාත්‍යාංශය විමධ්‍යගත කිරීමෙන් හෝ ඒ ඒ ප්‍රදේශවල අධ්‍යාපන කාර්යාලවලට වැඩි බලතල දී මෙන් හෝ අපේ දුප්පත් දරුවන්ගේ අනාගත දියුණුව සඳහා විශාල වැඩ කොටසක් කරන්න අපට අවස්ථාව ලැබේවායි ප්‍රාර්ථනා කරන අතර මේ අවස්ථාව මට ලබා දීම ගැන කථානායකතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

අ. භා. 3.23

**ආරියරත්න ජයතිලක මහතා** (දිවුලපිටිය)

*(திரு ஆரியரத்ன ஜயதிலக்க—திவுலப்பிட்டிய)*

(Mr. Ariyaratne Jayatillake—Divulapitiya)

කථානායකතුමනි, රටේ ඉතාමත් වැදගත් ප්‍රශ්නයක් හැටියට සැලකෙන අධ්‍යාපන ප්‍රශ්නය අධ්‍යාපන ඇමතිතුමාගේත්, පොදුවේ රජයේත් අවධානයට යොමු කෙරෙන අයුරින් මේ යෝජනාව ඉදිරිපත් කිරීම ගැන පළමු කොටම බදුල්ලේ මන්ත්‍රීතුමාට (ඩී. වින්සන්ට් ඩයස් මහතා) මා ස්තුතිවන්ත වෙනවා. මේ යෝජනාව යටතේ මන්ත්‍රීවරුන් බොහෝ දෙනෙක් අධ්‍යාපනය පිළිබඳව අදහස් රාශියක් ප්‍රකාශ කළා. අප හැම කෙනෙකුම මේ අවස්ථාවේදී බලන්නේ ග්‍රාමීය වශයෙන් හෝ වේවා නාගරික වශයෙන් හෝ වේවා දැනට තිබෙන අධ්‍යාපන තත්ත්වය උසස් කර ගැනීමටයයි මා කල්පනා කරනවා. මන්ත්‍රීවරුන්ගේ කථාවලට ඇහුම්කන් දෙන විට අපට පෙනී යනවා, සෑම මන්ත්‍රීවරයකුම ඉල්ලා සිටින්නේ තමාගේ ඡන්ද කොට්ඨාශයේ අධ්‍යාපන තත්ත්වය කොළඹ රාජකීය විද්‍යාලය, ආනන්ද විද්‍යාලය, නැත්නම් මහනුවර ධර්මරාජ විද්‍යාලය මගින් ලබා දෙන අධ්‍යාපන තත්ත්වයට දියුණු කරන්නය කියා බව.

මේ අවස්ථාවේදී විශේෂයෙන් අප මතක තබා ගන්න ඕනෑ. 1944 දී සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා ඉදිරිපත් කළ අධ්‍යාපන සංශෝධනය යටතේ—නිදහස් අධ්‍යාපන ක්‍රමය යටතේ—ප්‍රාදේශීය වශයෙන් පටිටමින් මධ්‍ය මහා විද්‍යාල ආරම්භ කිරීම මගින් බලාපොරොත්තු වුණේ, කොළඹ රාජකීය විද්‍යාලය, ආනන්ද විද්‍යාලය වැනි උසස් විද්‍යාලවල තත්ත්වයට එම මධ්‍ය මහා විද්‍යාලත් පත් කරන්නය කියා. එවැනි අදහසක්, ප්‍රයත්නයක් එතුමා ගෙන ගිය බව අපට පැහැදිලිව පෙනෙනවා. ඒ බලාපොරොත්තුවෙන් එතුමා ග්‍රාමීය ප්‍රදේශවල මධ්‍ය මහා විද්‍යාල රාශියක් ඇති කර එම ප්‍රදේශවල ළමුන්ට උසස් අධ්‍යා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආරියරත්න ජයතිලක මහතා]

පනයක් ලබා දෙන්න කටයුතු කළා. එහෙත් අභාග්‍යකට මෙන් කාලයක් ගත වන විට, එම මධ්‍ය මහා විද්‍යාලවලින්, බලාපොරොත්තු වූ ප්‍රයෝජන, සේවය නොලැබෙන බවක් පෙනී ගියා.

එම නිසා මා බලාපොරොත්තු වෙනවා ලංකාව පුරා උසස් අධ්‍යාපන ආයතන, උසස් විද්‍යාල ඇති කිරීමට පළමුව උසස් අධ්‍යාපනය යන්නෙන් අප අදහස් කරන්නේ මොකක්දැයි තීරණය කළ යුතු බව පෙන්වා දෙන්න. කොළඹ රාජකීය විද්‍යාලය, ආනන්ද විද්‍යාලය වැනි විද්‍යාලවලින් යම්කිසි තත්ත්වයක උසස් අධ්‍යාපනයක් එම දරුවන්ට ලැබෙනවා. එම අධ්‍යාපනය තුළින් ලැබී ඇති ප්‍රතිඵල හා විපාකත් පිළිබඳව මේ අවස්ථාවේදී කල්පනා කර බැලීම කාලෝචිතයයි මා අදහස් කරනවා. අකමැත්තෙන් වුණත් අද අපට පිළිගන්න සිදු වී තිබෙනවා, මේ අධ්‍යාපන ක්‍රමය දේශීය ඌරුවට, ජාතික බලාපොරොත්තුවලට 100% ක් ම නොගැළපෙන අධ්‍යාපන ක්‍රමයක් බව. අධ්‍යාපනය, නැත්නම් උසස් අධ්‍යාපනය යනුවෙන් අදහස් කරන්නේ විද්‍යා අධ්‍යාපනය නැත්නම් තාක්ෂණික අධ්‍යාපනය පමණක්ම නොවෙයි. 100% ක් ජාති මමත්වයක් ඇති, ජාත්‍යාලයක් ඇති පුරවැසියන් බිහි කිරීමත් අධ්‍යාපනයෙන් බලාපොරොත්තු වෙනවා. වර්තමාන ලෝකයේ නවීන විද්‍යාව පිළිබඳ උගත්කමක් ඇති, නූතන තාක්ෂණික ක්‍රම පිළිබඳ දැනීමක් ඇති, දියුණු වන ලෝකයේ වෙනත් ඕනෑම ජාතියකට අයත් පුද්ගලයන් සමඟ තරඟ කිරීමට තරම් කුශලතා, දක්ෂතා ඇති පුරවැසියන් බිහි කරන අතරම අපේ ජාතික බලාපොරොත්තු සහ ජාතික සංස්කෘතිය හා සභ්‍යත්වය තව තවත් දියුණු කෙරෙන ආකාරයේ අධ්‍යාපනයකුයි, අප බලාපොරොත්තු වන්නේ.

අප හැම කෙනෙකුම කියා සිටිනවා, අපේ ගම්බද පළාත්වලටත් උසස් අධ්‍යාපන පහසුකම්, උසස් විද්‍යාල ලබා දෙන්නය කියා. උසස් අධ්‍යාපනය, අපේ ප්‍රදේශවලටත් ලබා දෙන්න යනුවෙන් අද නාගරිකයේ බොහෝ විට දකින්න ලැබෙන විධියේ සංස්කෘතියක්, සභ්‍යත්වයක් බෝ කරන අධ්‍යාපන ක්‍රමයක් අපේ ප්‍රදේශවලත් ඇති කරන්න අප ඉල්ලා සිටිනවායයි යමකු කල්පනා කරනවා නම් අප ඒ ගැන කණගාටු වෙනවා. එබඳු ඊනියා උසස් අධ්‍යාපනයකින් නම් රටට ඒ තරම් සේවයක් සිදු වන්නේ නැහැ. මගේ කල්පනාවේ හැටියට නම් අද හුඟ දෙනෙකු අධ්‍යාපනය ගැන කල්පනා කරන්නේ මෙය කණපිට පෙරළාගෙනයි. සැහෙන සංශෝධන ඇති නොකර විදේශ අධ්‍යාපන ක්‍රම ඒ වූ ආකාරයෙන්ම කරපින්නාගෙන, ඒවා අපේ රටට ආරෝපණය කරන්න උත්සාහයක් ගෙන ගොස් තිබෙනවා, ශත වර්ෂයකට අධික කාලයක් තිස්සේ. ඒ ආකාරයෙනුයි, උසස් විද්‍යාල විශ්ව විද්‍යාල මඟින් එම අධ්‍යාපන ක්‍රමයේ මල් පල ගන්වා තිබෙන්නේ විශ්ව විද්‍යාල මඟින් අප බලාපොරොත්තු වුණේ ජාතික දියුණුව, සංස්කෘතික දියුණුව ඇති කරන අතරතුරම ආර්ථික දියුණුවකුත් ඇති කරන උසස් අධ්‍යාපනයක් ලබා දීමයි. නමුත් අභාග්‍යයකට මෙන් 1971 දී වුණ සිද්ධීන්ගෙන්, ඊට පසුව ඇති වුණ සිද්ධීන්ගෙන් අපට පෙනී යන්නේ මෙම අධ්‍යාපන ක්‍රමයෙන් ජාතියේ බලාපොරොත්තු සම්පූර්ණයෙන්ම සියයට සියයක්ම ඉටු වී නැති බවයි. එහෙම නම් අපේ රටේ දියුණුවට අත්‍යවශ්‍ය, ඒ වගේම ඉතාම වැදගත් ප්‍රශ්නයක් හැටියට සැලකෙන, මේ අධ්‍යාපන ක්‍රමය ගැන අමුතුවෙන්ම කල්පනා කර බැලීමට, එහි වෙනසක් ඇති කිරීමට, දැන් කාලය පැමිණ තිබෙනවා.

ගරු කථානායකතුමනි, තාමුන්නාන්සේත් මා සමඟ එකඟ වෙනවා ඇති, 1944 කන්නන්ගර වාර්තාවෙන් පසුව මේ රටේ අධ්‍යාපනය සම්බන්ධයෙන් සොයා බැලීමට නියම කොමිෂන් සභාවක් පත් කර නැති බවට. මේ ගරු සභාවේ මෙවැනි විවාදයකදී අධ්‍යාපනය ගැන කතා කර අවසානයක් කරන්න පුළුවන්කමක් නැහැ. අධ්‍යාපනය ඒ තරම් ගැඹුරු දෙයක්. අධ්‍යාපනය ගැන මේ වගේ විවාදයකදී කරුණු ඉදිරිපත් කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පාසල් සංවර්ධනය සඳහා සෑම මන්ත්‍රී කොට්ඨාශයකම නියමු ක්‍රමයක්

සෑහීමට පත් වෙන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා අධ්‍යාපනය කොයි විධියට සකස් විය යුතුද, අධ්‍යාපන ප්‍රතිපත්තිය කොයි ආකාරයට සකස් විය යුතුද, අධ්‍යාපනයේ හරය කුමක් විය යුතුද, කියන ප්‍රශ්න ගැන කල්පනා කර බලා, අධ්‍යාපනය සම්බන්ධ අමුතුම් හැඩගැස්මක් මේ ආණ්ඩුව කාලයේදී ඇති කිරීම සඳහා කොමිෂන් සභාවක් පත් කිරීම ඉතාමත් කාලෝචිතය කියා මා කියන්න කැමතියි.

ගරු කථානායකතුමනි, මේ රටේ අස් සක් මුල්ලක් නැර සිටින දරුවන්ට අධ්‍යාපනය ලබා ගැනීමට තිබෙන පහසුකම් එක හා සමාන විය යුතු බව මම පිළිගන්නවා. ඇත්ත වශයෙන්ම අද නගරයේ දරුවන්ටත් ගමේ දරුවන්ටත් අධ්‍යාපනය ලබා ගැනීමට තිබෙන පහසුකම් අතර විශාල වෙනසක් තිබෙනවා, විශාල පරතරයක් තිබෙනවා, අහසට පොළොව වගේ පරතරයක් තිබෙනවා. කොළඹ එක්තරා විද්‍යාලයකට ගොඩනැගිලි සෑදීම සඳහා පසුගිය වර්ෂයේදී පමණක් රුපියල් 50 ලක්ෂයක මුදලක් වෙන් කර දී තිබෙන බව මා දන්නවා. ලංකාවේ කිසිම ආයතනයකට අධ්‍යාපන කටයුතු සඳහා එක වර්ෂයකට ඒ තරම් විශාල මුදලක් වෙන් කර දී ඇතැයි කියා මා විශ්වාස කරන්නේ නැහැ. ඒ නිසා නැහැ. ඒ නිසා අධ්‍යාපනය සඳහා මුදල් වෙන් කර දීමේදී ග්‍රාමීය අධ්‍යාපන තත්ත්වය දියුණු කිරීම කෙරෙහි වැඩි සැලකිල්ලක් දැක්විය යුතු බව ගරු ඇමතිතුමාටත් අධ්‍යාපන අමාත්‍යාංශයටත් මතක් කර දෙන්න කැමතියි.

ඒ වගේම තවත් කාරණයක් මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාට මතක් කර දෙන්න කැමතියි. නාගරික පිළිවෙළට හැඩගැසුනු අධ්‍යාපන ක්‍රමයක් අපේ ගම් වලට ගෙන ගොස් ගම්වල තිබෙන නිර්මලත්වය පළුදු වීමට ඉඩ හරිනවාද, එහෙම නැත්නම් ජාතියේ තිබෙන සභ්‍යත්වය, සංස්කෘතිය ගැන සලකා ඒවායේ වටිනාකම ගැන කල්පනා කර බලා අධ්‍යාපන පෙරළිය ගමෙන් පටන් ගෙන නගරයට ව්‍යාප්ත කිරීමට ඉඩහරිනවාද කියන ප්‍රශ්නය මුලින්ම නිරාකරණය කර ගත යුතුව තිබෙනවා. නාගරික අධ්‍යාපනයට වඩා ග්‍රාමීය අධ්‍යාපනය ඉතාමත්ම උසස් තත්ත්වයක පැවති කාලයක් තිබුණා. සිංහල සභ්‍යත්වයේ තිබෙන වටිනාකම, සංස්කෘතියේ තිබෙන වටිනාකම, විද්‍යා අංශයෙන් ගමේ ශිෂ්‍යයන්ට තිබෙන සහජ දක්ෂතාවයන් ගැන අද කල්පනා කරන්නේ නැහැ. ඒවායේ වටිනාකම් ගැන වගකිවයුත්තන් වැඩි සැලකිල්ලක් දක්වන්නේ නැහැ. ඒ නිසා අධ්‍යාපන පෙරළියක් ඇති කරනවා නම් එය ග්‍රාමීය මට්ටමෙන් පටන් ගත යුතුයි. ගමේ තිබෙන සභ්‍යත්වය ගැන කල්පනා කර, ගමේ අධ්‍යාපන තත්ත්වය උසස් තත්ත්වයකට පරිවර්තනය කර එම තත්ත්වය නගරයටත් ව්‍යාප්ත කළ යුතුව තිබෙනවා. අධ්‍යාපන පෙරළිය ගමෙන් පටන් ගෙන එය මුළු රට පුරාම පතුරුවා හැරීම හොඳ බව මේ අවස්ථාවේදී විශේෂයෙන් මතක් කර දෙන්න ඕනෑ.

අවසාන වශයෙන් නැවත වරක් බදුල්ලේ ගරු මන්ත්‍රීතුමාට මාගේ අවංක ස්තුතිය පුද කරන්න කැමතියි. ගැමි ප්‍රදේශවල ජීවත්වෙන අහිංසක දරුවන්ගේ අධ්‍යාපන කටයුතු දියුණු කිරීම කෙරෙහි මේ ගරු සභාවේත්, ගරු ඇමතිතුමාගේත් අවධානය යොමු කරවීම පිණිස මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීමෙන්, ග්‍රාමීය අධ්‍යාපනය දියුණු කරවීමට යම් උත්සාහයක් දැරීම ගැන එතුමාට ස්තුති කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා** (කොලොන්නාව)

*(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி—கொலன்னாவ)*

(Mr. Weerasinghe Mallimaratchchi—Kolonnawa)

ගරු කථානායකතුමනි, බදුල්ලේ ගරු මන්ත්‍රීතුමා විසින් මෙම ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රීවරුන් කීප දෙනෙක්ම කතා කරන්න යෙදුනා. මා සිතන හැටියට අද මුළු රටේම අවධානය යොමු වී තිබෙන ප්‍රශ්නයක් ගැනයි, මෙම යෝජනාව. තම තමන්ගේ කොට්ඨාශවල අධ්‍යාපනය සහ පාසැල් සම්බන්ධව ඇසුවොත් මේ ගරු සභාවේ එකම ගරු මන්ත්‍රීවරයකුවත් සෑහීමට පත් වේය කියා මා සිතන්නේ නැහැ. තම තමන්ගේ ප්‍රදේශවල පාසැල්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පාසල් සංවර්ධනය සඳහා සෑම මන්ත්‍රී කොට්ඨාශයකම නියමු ක්‍රමයක්

[විරසිංහ මල්ලිමාරච්චි මහතා]

වල අඩු පාඩුකම් සම්බන්ධව සෑම ගරු මන්ත්‍රීවරයකුටම පැය ගණනාවක් තුළ නොව දින කීපයක් තුළ කථා කරන්නට පුළුවනි. සමහර ගරු මන්ත්‍රීවරුන් කථා කරමින් අධ්‍යාපනය සම්බන්ධව විශේෂ සැලකිල්ලක් දක්වන්නේ කොළඹට පමණය කිව්වා. නමුත් මා කියන්නට ඕනෑ, කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රදේශයක් වුවත් මා නියෝජනය කරන කොලොන්නාව කොට්ඨාශයේ පාසැල්වල අඩුපාඩුකම් සම්බන්ධව මට දින දෙකක් තිස්සේ වුවත් කථා කළ හැකි බව.

කොලොන්නාව කොට්ඨාශයේ පාසැල් 18 ක් තිබෙනවා. මේ පාසැල් දහ අටේ අඩුපාඩුකම් අද ඊයේ සිට පැවත එන ඒවා නොවෙයි. ඒවා මෙම රජය යටතේ හෝ පසුගිය රජය යටතේ සිට පවත්නා අඩු පාඩු නොවෙයි. ඊටත් එපිට කාලවල සිට තිබුණු ආණ්ඩු—1948 න් පසු තිබූ සෑම ආණ්ඩුවක්ම--මේ අධ්‍යාපන ප්‍රශ්නයට වගකිව යුතුය කියා මා සිතනවා. පාසැල් දියුණු කිරීම සඳහා අද අපට මුදල් විශාල ප්‍රමාණයක් යොදවන්නට බැරිකමක් තිබෙනවා. අද ගම්බදව පමණක් නොවෙයි ප්‍රාදේශීය මට්ටමින් සෑම දෙමව්පියකුම බලාපොරොත්තු වන්නේ තමන්ගේ ළමයා ආනන්ද විද්‍යාලයට, නාලන්ද විද්‍යාලයට නැත්නම් රාජකීය විද්‍යාලයට ඇතුළත් කර ගන්නටයි. ඒ සමගම, ආනන්ද, නාලන්ද, රාජකීය වැනි විද්‍යාලවල වුවමනාවට වඩා වැඩි සංඛ්‍යාවක් ගුරුවරු ඉන්නවා. ඒ ගැන මට වඩා හොඳින් තමුන්නාන්සේ දන්නවා ඇති. සමහර ගුරුවරු තමන් නොකඩවා එකම පාසැලේ අවුරුදු 25 ක් සේවය කළාය කියා 25 ස් වන සාංවත්සරික උළෙල පැවැත්වූ අවස්ථා ගැනත් මා දන්නවා. අද කොලොන්නාව කොට්ඨාශයේ දුප්පත් ළමයින්ට උගන්වන්නට ගුරුවරුන් අඩුයි. ආනන්ද, නාලන්ද, රාජකීය වැනි කොළඹ උසස් විද්‍යාලවලට පත්ව එන ගුරුවරු කවදාවත් කල්පනා කරන්නේ නැහැ වෙනත් ප්‍රදේශවලට යන්නට. ඒ මක්නිසාද? ඒ අයට ඒ තැන්වල සියළුම පහසුකම් තිබෙන නිසයි. කොළඹ උසස් විද්‍යාලවල සිටින ගුරුවරුන් අඩු වශයෙන් අවුරුදු පහකට වරක්වත් මාරු කර වෙනත් ප්‍රදේශවලට යවනවා නම් ඒ ප්‍රදේශවල පවත්නා අසහනකාරී තත්ත්වය නැති වෙයි කියා මා සිතනවා.

තවත් කාරණයක් ගැන මා තමුන්නාන්සේගේ අවධානය යොමු කරවන්නට සතුටුයි. එය සෑම දේශපාලන පක්ෂයකම සැලකිල්ලට යොමු විය යුතු කරුණක්. ගුරුවරුන් මාරු කිරීම සම්බන්ධව අද විශාල අසහනකාරී තත්ත්වයක් තිබෙනවා. නොයෙකුත් දේශපාලන පක්ෂ ගුරුවරුන් මාරු කරන්නට එපාය කියනවා. ඒවාගේම නොයෙකුත් පත්‍රත් ගුරුවරුන් මාරු කරන්නට එපාය, ගුරුවරුන් මාරු කිරීමෙන් කරදර ඇති වෙනවාය, අසහනකාරී තත්ත්වයන් ඇති වෙනවාය, ළමයින්ට කරදර ඇති වෙනවාය කියනවා. එය මා පිළි ගන්නවා. මා මේ අවස්ථාවේදී සියලුම දේශපාලන පක්ෂවලින් එක්තරා ඉල්ලීමක් කරන්නට සතුටුයි. ඒක මගේ පෞද්ගලික අදහසක්. සෑම දේශපාලන පක්ෂයක්ම ගුරුවරුන් සම්පූර්ණයෙන්ම ඒ ඒ පක්ෂ වලින් මුදා හැරිය යුතුය කියා මා කියනවා. දේශපාලනයක් කරන්නේ නැතිව ගුරුවරුන්ට නිදහස් පුරවැසියන් හැටියට ජීවත් වෙන්නට ඉඩහරින්න. මේ ගුරුවරු කියන්නේ සම්භාවනීය පිරිසක්. අප හැමෝටම ගුරුවරුන් ඉන්නවා. අප හැමෝම ගුරුවරුන්ට සලකනවා. ගුරුවරු දේශපාලනයට අත ගසන්නට ගිය නිසයි, අද මුළු රටම මේ විනාශකාරී තත්ත්වයට මුහුණ පා සිටින්නේ. ගුරුවරයකු දේශපාලනය කරනවා නම් ඔහුට ශිෂ්‍යයාගෙන් නියම ගෞරවය ලැබෙන්නේ නැහැ. ගුරුවරුන් දේශපාලනය නොකළ යුතුය කියන විට ඔවුන්ගේ අයිතිවාසිකම්වලට කරදරයක් හිරිහැරයක් පැමිණුනොත් ගන්නා පියවර කුමක්දැයි අසන්නට පුළුවනි. මා ඒකටත් පිළිතුරු දෙන්නම්. දේශපාලනය අත්හැර මොනම දේශපාලන පක්ෂයකටවත් බැඳීමක් ඇති කර නොගෙන, ගුරුවරුන්ට තමන්ගේ වෘත්තීය අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම සඳහා සියලුම ගුරුවරුන්ගේ නිදහස් වෘත්තීය සමිතියක් ඇති කර ගන්නට පුළුවනි. එමගින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පාසල් සංවර්ධනය සඳහා සෑම මන්ත්‍රී කොට්ඨාශයකම නියමු ක්‍රමයක්

ලංකාවේ බොහෝ පාසැල්වල ඇති ගුරු හිඟයත් අසහනකාරී තත්ත්වයත් සම්පූර්ණයෙන්ම තුරන් කර ගන්නට පුළුවන් වේය කියාත් මා සිතනවා.

අද මොකක්ද වී තිබෙන්නේ ? එක රජයක් බලයට පත් වෙනවා. එම රජය යටතේ පළාතේ මන්ත්‍රීවරයාට විරුද්ධව වැඩ කළ ගුරුවරු වෙනත් ප්‍රදේශවලට මාරු කරනවා. ඒ රජයත් එහෙමයි. මේ රජයත් එහෙමයි. අනාගතයේදී ඇති වන රජයත් එහෙමයි. ඉතින් ගුරුවරු මොකද කරන්නේ ? කුමන හෝ දේශපාලන පක්ෂයක එල්ලෙනවා. මගේ පළාතේ එක්තරා ගුරුවරයෙක් සිටියා. ඔහු පත්‍රිකාවක් නොවෙයි පොතක් ගැහුවා. මෙයා කියා තිබෙනවා, ජේ. ආර්. ජයවර්ධන ඒකාධිපතියෙක් ය, එයා බලයට පත් වුණොත් නවත් fප්‍රැන්කෝ කෙනෙක් වේවිය කියා. ඉතින් මට පුළුවන්ද, මේ පුද්ගලයා මගේ කොට්ඨාශයේ මගේ භාරයේ තබා ගන්න. ඒ නිසා මම එයා මාරු කර යැව්වා. ඉන්දියාවට නොවෙයි, මේ ලංකාවේම වෙනත් ප්‍රදේශයකට. ඉතින් එයා ඒ ප්‍රදේශයට ගියත් කරන්නෙ ඒකයි. ගුරුවරුන් ය කියන මේ සම්භාවනීය පිරිස, අනාගත පරපුර හදන පිරිසක්. වැදගත් පිරිසක්. එවැනි සම්භාවනීය පිරිසක් ආරක්ෂා කිරීම අපේ යුතුකමක්. ඒ නිසා ගුරුවරුන් දේශපාලනයට වැද්ද නොගැනීමට හැම දේශපාලන පක්ෂයක් තීරණයක් අරගෙන තමුන්ගේ සේවයට සම්බන්ධ අයිතිවාසිකම් සඳහා පොදු සාධාරණ වෘත්තීය සමිතියක් ආරම්භ කරන්නට ඔවුනට ඉඩ සැලසුවහොත් දේශපාලන පලිගැනීම් වශයෙන් ගුරුවරුන් මාරු කිරීමේ ප්‍රශ්නයක් කවදාවත් ඇති වෙන්නට ඉඩක් නැති බව මම ප්‍රකාශ කරන්න කැමතියි. එයින් ගුරුවරුන්ට කරදරයකුත් නැහැ. ළමයින්ට කරදරයකුත් නැහැ. දෙපාර්තමේන්තුවට ප්‍රශ්නවලට මුහුණ පාන්නට වෙන්නෙත් නැහැ.

ඊළඟට පාසල්වල ත්බෙන බංකු පුටු මේස ආදිය ආරක්ෂා කිරීම පිළිබඳව වචනයක් කියන්න තිබෙනවා. අපේ පාසල්වල සියයට 90 කම වගේ මුරකරුවන් නැහැ. ඉතින් පාසැල් කටයුතු අවසන් වූවාට පසුව, ඒ ප්‍රදේශයේ සිටින චන්ඩි හා කසිප්පුකාරයන් එකතු වී, බේබද්දන් එකතු වී රාත්‍රියේ නොයෙකුත් දූෂණ වැඩ වලට පාසල් ගොඩනැගිලි පාවිච්චි කරනවා. මම දැක්කා ළඟදී දෙපාර්තමේන්තුවෙන් ලිපියක් එවා තිබෙනවා, මුරකරුවන් නැති පාසල්වලට මුරකරුවන් පත්කර ගන්නය, ඒ සඳහා රුපියල් සියයක දීමනාවක් දෙනවාය කියා. මම තමුන්නාන්සේගෙන් අහන්න කැමතියි, කවදාවත් රුපියල් සියයක් අරගෙන මුරකරුවෙක් වශයෙන් කළ යුතු සේවය කරන්නට මිනිහෙකුට පුළුවන් වේවිද කියා. ඒ මොකද රුපියල් සියයකින් මිනිසෙකුට ජීවත් වෙන්න බැහැ. ඒ මිනිහා, දවල් කොහේ හෝ වැඩ කර රාත්‍රියට ඇවිත් පාසලේ බුදියාගෙන ඉඳල යාවි. ඒ නිසා දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වන සේවය ඉෂ්ට වෙන්නෙ නැහැ. අද මුරකරුවන් නැතිකමින් නොයෙකුත් බඩු බාහිරාදිය නැති වෙනවා, විද්‍යා උපකරණ නැති වෙනවා.

මේ ආදී සියලු කරුණු ගැන කල්පනා කර බලන විට, බදුල්ලේ ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කර ඇති මේ යෝජනාව ගැන අපි එතුමාට ස්තුතිවන්ත විය යුතුයි. අපි මේ සම්භාවනීය ගුරුවරුන් පිරිස ආරක්ෂා කරන්නට ඕනෑ නම්, සෑම දාම ආණ්ඩු වෙනස් වන අවස්ථාවලදී ගුරුවරුන් එහාට මෙහාට මාරු කිරීම වළක්වන්නට ඕනෑ නම්, දේශපාලන පක්ෂවලින් ඉවත් වී තමුන්ගේ වෘත්තීය අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීම සඳහා නිදහස් වෘත්තීය සමිතියකට එක් වන ලෙස ගුරු පිරිසෙන් ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

ටී. රාසලිංගම් මහතා (උඩුප්පිඩ්ඩි)
(திரு. த. இராசலிங்கம்—உடுப்பிட்டி)
(Mr. T. Rasalingam—Uduppiddi)

கௌரவ சபாநாயகர் அவர்களே, முக்கியமான ஒரு பிரேரணையைப் பற்றி எனது கருத்தைக் கூறச் சந்தர்ப்பம் அளித்தமைக்காக முதலில் எனது நன்றியைத் தெரிவித்துக் கொள்ளுகிறேன். இந்நாடு சுதந்திரம் அடைந்த காலத்திலிருந்து காலத்துக்குக் காலம் கல்வித் துறையில் ஏற்பட்ட மாற்றங்களை அவதானிக்கும் பொழுது, நகர்ப்புறப் பாடசாலைகளுக்கும் கிராமப்புறப் பாடசாலைகளுக்கும் சமமான அந்தஸ்தைக் கொடுத்து,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වී. රාසලිංගම් මහතා]

கிராமிய கல்வித் தரத்தை உயர்த்த வேண்டுமென்ற கொள்கை எல்லா ஆட்சியாளர்களிடமும் இருந்து வந்தபோதிலும் செயன்முறையில் முரண்பட்ட நடவடிக்கைகள்தான் மேற்கொள்ளப்பட்டு வந்துள்ளன என்பதை நாம் அவதானிக்கக் கூடியதாக இருக்கிறது. கௌரவ கன்னங்கர அவர்கள் இந்நாட்டின் பல பகுதிகளிலும் ஐம்பது மத்திய மகா வித்தியாலங்களை அமைத்து அவற்றினூடாக சிறந்ததொரு கல்விச் சேவையைக் கிராமப் புறங்களுக்கும் அளிக்க வேண்டுமென்று கொண்ட நோக்கம் பெரும் வெற்றியளித்த போதிலும் காலப் போக்கிலே பார்க்கும் பொழுது நாட்டில் உள்ள சகல பாடசாலைகளும் றோயல் கல்லூரியின் தரத்துக்கு கொண்டுவரப்பட வேண்டும் என்று எல்லாக் கல்வி அமைச்சர்களும் கூறிய கருத்துக்கள் வெற்றிபெறுததைக் காண்கிறோம்.

கல்விச் சேவை, கல்வி அபிவிருத்தி ஆகியவற்றின் மூலம் கிராமப் புறங்களிலிருந்து எழும் மாற்றங்கள்தாம் சமூக மாற்றங்களைக் கொண்டுவர முடியும். அந்த சமூக மாற்றங்கள்தாம் பொருளாதார மாற்றங்களைக் கொண்டுவர முடியும். ஆகவே, இவை எல்லாவற்றிற்கும் அடிப்படை கிராமியக் கல்வி முன்னேற்றம்தான். இந்த மாற்றங்கள் கிராமங்களிலிருந்துதான் ஆரம்பிக்க முடியும். அதை எவரும் மறுக்க முடியாது.

இன்று கிராமப்புறப் பாடசாலைகளுக்கும் நகர்ப்புறப் பாடசாலைகளுக்கும் இடையே உள்ள வித்தியாசங்களை நோக்குமிடத்து உண்மையிலே நாம் வேதனைப்பட வேண்டும். எங்களுக்குக் கட்டடம் அல்ல முக்கியம். ஆசிரியர்கள், உபகரணங்கள், ஆசிரியர்களுக்கு வேண்டிய பயிற்சிகள் ஆகியவை தாம் எங்களுக்கு முக்கியம். காலத்துக்குக் காலம் ஆசிரியர்களுடைய வசதியை மட்டும் பாராமல் மாணவர்களின் முன்னேற்றத்தையும் கருத்திற்கொண்டு அதற்கேற்ற முறையில் நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டியது கல்வி அமைச்சரின் கடமையாகும். ஆனால், இன்றுள்ள சூழ்நிலையைப் பார்க்கின்றபொழுது, பிள்ளைகளுடைய கவனமும் பிள்ளைகளுடைய கல்வி வளர்ச்சியும் ஒதுக்கப்பட்டு ஆசிரியர்களின் வசதியோ திணைக்களத்திலுள்ள ஊழியர்களின் வசதியோதான் முக்கியமாகக் கவனிக்கப்படுகிறது. எனவே பிள்ளைகளின் கல்வி முக்கியமா அல்லது ஆசிரியர்களின் அல்லது திணைக்கள ஊழியர்களின் வசதிகள் தான் முக்கியமா என்பதை நாம் முதலில் அறிந்து கொள்ளவேண்டும்.

கிராமப் புறங்களிலேயுள்ள ஆசிரியர்களின் பற்றுக்குறையை நாம் எந்த வகையிலே தீர்க்க வேண்டுமென்ற ஒரு கேள்வி இங்கேயுள்ள சகல அங்கத்தவர்களாலும் எழுப்பப்பட்டிருக்கிறது. கிராமப்புறங்களுக்கு ஆசிரியர்களைத் தருவதில் என்ன கஷ்டங்கள் இருக்கின்றன என்று கேட்கின்ற பொழுது 'காடர்' இல்லை என்று சொல்லுகிறார்கள். அகில இலங்கை ரீதியாக ஆசிரியர் பற்றுக்குறை இன்று ஒரு பொதுப் பிரச்சினையாக இருக்கின்றது. ஆசிரியர் நியமனங்களை மிகத் துரிதமாக அமுல் நடத்த வேண்டுமென்று கல்வி அமைச்சரவர்களைக் கேட்கின்றபொழுது அவர் 'காடர்' இல்லை என்று சொல்லுகிறார். 'காடரா' அல்லது ஆசிரியர்களா முக்கியம் என்பதை இந்தக் கௌரவ சபை உணர்ந்துகொண்டு இதற்குரிய நடவடிக்கைகளை மேற்கொள்ளவேண்டியது மிகவும் அவசியமானதாகும்.

கல்விச் சேவையோடு நீண்ட காலமாகத் தொடர்புகொண்டிருந்தவன் என்ற வகையிலே கிராமப்புற ஆசிரியர்களைப் பொறுத்தவரையிலே அவர்களுக்கிருக்கின்ற விடுதிகளும் ஒரு பெரும் தடையாக இருக்கின்றன. கிராமப் புறங்களிலே இன்று ஆசிரியர்களைக் கண்டுபிடிப்பது கஷ்டம்; அதிபர்களைக் கண்டுபிடிப்பது கஷ்டம். பதிற்கடமை பார்க்கின்ற அதிபர்களாகவும் ஆசிரியர்களாகவும் தான் அங்கே காணப்படுகின்றார்கள். இருந்தாலும் அவர்கள் எல்லோரும் கிராமப் புறங்களுக்குச் செல்லுகின்றபொழுது, வீட்டு வாடகை என்ற ஒரு பெரும் பேய் அவர்களை விரட்டியடிக்கிறது. ஏனென்றால் அந்தக் கிராமங்களிலே 5 ரூபாய் அல்லது 10 ரூபாய்க்கு மிகவும் வசதியான வீடுகளை வாடகைக்குப் பெறக்கூடியதாகவிருக்கின்றபொழுது பாடசாலைகளிலே அமைந்திருக்கின்ற அரசாங்க பணிமனைகளுக்கு 17 சதவீதம் அவர்கள் வாடகை கொடுக்க வேண்டிய ஒரு பெரும் கொடுமை அங்கேநிலவுகின்றது. ஆகவே கிராமப்புறங்களிலேயுள்ள வாடகை விகிதங்களுக்கேற்ற முறையிலே அப்பாடசாலைகளிலுள்ள ஆசிரியர் விடுதிகளின் வாடகைகளும் சீராக்கப்பட வேண்டியது மிகவும் அவசியமாகும்.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

கிராமப்புறப் பாடசாலைகளைத் திணைக்களப் பரிசோதகர்கள் உரிய முறையிலே பரிசோதனை செய்துவந்தால் நம்பிக்கையாகக் கல்வித் தரத்தைக் கூட்டலாம் என்பதிற் சந்தேகமேயில்லை. வசதியீனத்தின் மத்தியிலே, குறிப்பாக வட பிரதேசத்தைப் பார்க்கின்றபொழுது அங்கேயுள்ள ஊர்காவற்றுறைத் தொகுதி பருத்தித்துறையின் கிழக்குப் பகுதி, கிளிநொச்சித் தொகுதியிலேயுள்ள இரணைதீவு கவுதாரிமுனை போன்ற இடங்கள், முல்லைத்தீவு, வவுனியா, மன்னார் போன்ற இடங்களை நாங்கள் பார்க்கின்றபொழுது, அங்கே சொல்ல முடியாத கஷ்டங்களை நாங்கள் காணக் கூடியதாக இருக்கிறது. இது காலவரையிலே 27 மாணவர்களுக்கு ஓர் ஆசிரியர் என்று இருந்த நிலை மாறி இடைக்காலத்திலே 20 மாணவர்களுக்கு ஓர் ஆசிரியர் என்ற நிலை ஏற்பட்டு, இன்று 36 மாணவர்களுக்கு ஓர் ஆசிரியர் என்ற நிலைமைக்கு மாற்றுவது கல்விப் பிரச்சினையைத் தீர்க்கமாட்டாது. கல்வி அமைச்சைப் பொறுத்த அளவில் மாணவர்—ஆசிரியர் விகிதம் 35 : 1 என்ற முடிவு ஆசிரியர் பற்றாக்குறையை நீக்க உதவும் என்றாலும் நாட்டில் வாழும் இலட்சக் கணக்கான மாணவர்களின் தேவையையோ, கல்விச் சேவையையோ அது பூர்த்தி செய்யாது.

வட பிரதேசத்தைப் பொறுத்த மட்டில் அண்மையில் நடைபெற்ற ஆசிரியர் நியமனத்தைப் பார்க்கும் பொழுது ஒன்றைக் குறிப்பிட வேண்டும் : ஒவ்வொரு பாராளுமன்ற அங்கத்தவருக்கும் தமது தொகுதியிலுள்ள ஆசிரியர் பற்றாக்குறையை நீக்கும்பொருட்டு பதினாறு ஆசிரியர்களை வழங்குவதென்று வாக்குறுதியளித்த கல்வி அமைச்சர், எதிர்க்கட்சி அங்கத்தவர்களுக்கு அரைவாசிப் பேரை, அதாவது எட்டுப் பேரைத்தான் தந்தார். ஆனால், அந்த எட்டுப் பேருக்குக்கூட இதுவரை நியமனம் கொடுக்கப்பட்டதாகத் தெரியவில்லை 35 : 1 என்று பார்த்தாலும் எமது தொகுதியில் 1,500 ஆசிரியர்களின் பற்றாக்குறை இருக்கின்றது. இந்நிலையில் ஒரு தொகுதிக்கு பதினாறு ஆசிரியர்கள் வழங்கிய கல்வி அமைச்சர் அவர்கள் எமக்கு அதில் அரைவாசியைத் தந்தாலும் அவர்களுக்குக்கூட இற்றைவரை நியமனம் கொடுக்கப்படவில்லையென்பதைக் கவலையோடு எடுத்துக்காட்ட விரும்புகிறேன்.

அதுமட்டுமல்ல, வட பிரதேசத்தில் ஊர்காவற்றுறை, கிளிநொச்சி, பருத்தித்துறை கிழக்கு ஆகிய பகுதிகளில் எத்தனையோ ஓர் ஆசிரியர் பாடசாலைகள் இருக்கின்றன. முதலாம் வகுப்பிலிருந்து பத்தாம் வகுப்பு வரை உள்ள பாடசாலையில் அவர்தான் அதிபர், அவர்தான் விஞ்ஞான ஆசிரியர், அவர்தான் சமூகவியல் ஆசிரியர், அவர்தான் பாடசாலையின் காவலாளி. 150 பிள்ளைகள் வரையுமுள்ள ஒரு பாடசாலையில் ஓர் ஆசிரியர் மட்டும் முதலாம் வகுப்பிலிருந்து பத்தாம் வகுப்பு வரை சமாளிக்க முடியுமென்றால் நாட்டிலுள்ள பாடசாலைகளில் ஆசிரியர் பற்றாக்குறை என்ற பேச்சுக்கே இடமில்லை; அப்படியானால், கல்விச் சேவையில் சீர்திருத்தமே தேவையில்லை என்று நாம் கருத வேண்டி இருக்கிறது. இந்த நிலையைச் சீர்படுத்தி இந்த ஓர் ஆசிரியர் முறையை உடனடியாக நீக்க கல்வி அமைச்சர் அவர்கள் நடவடிக்கை எடுக்க வேண்டும் என்று கேட்டுக்கொள்கிறேன்.

இன்று இந்தச் சபையில் கல்வி அமைச்சர் அவர்கள் இருந்திருந்தால் அவருடைய கவனத்துக்கு நாம் இவற்றைக் கொண்டு வந்து உடனடியான பதிலையும் பெறக்கூடியதாக இருந்திருக்கும். ஆனால், இச்சந்தர்ப்பத்தில் அவர் இங்கு இல்லை. வட பிரதேசத்தைப் பொறுத்த மட்டில் விசேஷ பயிற்சி பெற்ற ஆசிரியர்கள்கூட ஆசிரிய கலாசாலையிலிருந்து வெளியானவுடன் வெளிப் பிரதேசங்களுக்கு அனுப்பப்படுகிறார்கள். இந்த ஆசிரியர்களை நாம் கிராமப் புறங்களுக்கு அனுப்பவேண்டும். அப்படி அவர்களைக் கிராமப்புறங்களுக்கு அனுப்ப வேண்டுமானால் நாம் அவர்களின் குறைகளை ஆராய்ந்து அவற்றை நீக்கக்கூடிய நடவடிக்கைகளை எடுக்க வேண்டும். அவ்விதம் செய்து அவர்களை அங்கு அனுப்பி வைத்தால் நாம் அந்தப் பிரதேசங்களில் ஆசிரியர் பற்றாக்குறையை நீக்கக்கூடியதாக இருக்கும்.

இது மட்டுமல்ல, தோட்டப் பாடசாலைகளைப் பொறுத்த வரையில் அவர்கள் தங்கள் செலவிலேயே ஆசிரிய பயிற்சிக் கலாசாலைக்குச் சென்று இரண்டு ஆண்டுகள் தமது செலவிலே படித்து பின் அரசாங்க சேவையில் தங்களை ஈடுபடுத்திக் கொள்ளும் வழக்கம் சென்ற ஆண்டு வரையிலே, அதாவது 1977 ஆம் ஆண்டு வரையிலே இருந்து வந்தது. அவர்கள்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. රාසලිංගම් මහතා]

பயிற்சிக் கலாசாலையிலிருந்து புறப்பட்டதும் தை, மாசி மாதங்களுக்கிடையில் நியமனக் கடிதங்களைப் பெற்றுர்கள். கடந்த ஜனவரி மாதம் 21 ஆம் தேதி நாங்கள் கல்வி அமைச்சரவர்களைப் பேட்டி கண்டு இவ்வாசிரியர்களுடைய நிலைமையைப் பற்றியும் கிராமப் புறக் கல்விச் சேவையை நீக்குகிற நோக்கத்தைக் குறித்தும் பண்டிதர்களுடைய நியமனங்கள் சம்பந்தமாகவும் பேசினோம். அப்பொழுது பண்டிதர்கள் ஒன்பது பேரை நியமிப்பது சம்பந்தமாக அவர்களுடைய நியமனங்களை உறுதிப்படுத்துவதாகக் கூறிய கல்வி அமைச்சர் இதுவரை எமக்கு ஒருவிதமான பதிலையும் தராதது குறிப்பிடக் கூடியதாகும்.

இந்த நாட்டில் கல்வி அபிவிருத்தியடைய வேண்டுமானுல், முன்னேற்றமடைய வேண்டுமானுல், நகரப் புறங்களிலே இருந்து அவற்றை அடைய முடியாது. உண்மையான கல்வி மாற்றம் ஏற்பட வேண்டுமானுல் இந்த நாட்டிலே வாழுகின்ற எதிர்காலப் பிரஜைகளாகிய குழந்தைகளுடைய உள்ளத்தைச் சீர்ப்படுத்தி பக்குவமாக்கக்கூடிய முறையிலே அதனை ஆரம்பிக்க வேண்டும். அத்தகைய சீர்திருத்தங்களை ஒவ்வொன்ருக கிராமங்களிலிருந்துதான் மேலுக்குக் கொண்டு வர வேண்டுமென்பது உலகம் அறிந்த உண்மையாகும். இந்த நாட்டிலே வாழுகின்ற கிராம மக்களுடைய கிராமிய கல்வித் தரத்தை உயர்த்துவதன் மூலமாகத்தான் நாட்டினுடைய கல்வி உயரும். நாட்டினுடைய கல்வி உயர்ந்தால்தான் நாட்டு மக்களுடைய பண்பாடு உயர்ந்தால்தான் அவர்களுடைய கருத்து விஸ்தரிக்கும். அவர்களுடைய கருத்து விஸ்தரித்தால்தான் நல்லெண்ணம் ஏற்படும். நல்லெண்ணம் ஏற்பட்டால் நாட்டிலுள்ள மக்கள் அமைதியாகவும். சகோதரத்துவத்துடனும் பிரச்சினைகளை விளங்கி, அந்தப் பிரச்சினைகளுக்குப் பதிலைக் காணக் கூடியவர்களாக இருந்து கண்ணியமான முறையிலே, கண்ணியமாக நாம் வாழ வழி அமையும். கௌரவ கல்வி அமைச்சர் அவர்கள் இதற்கு உரிய கவனத்தைக் கிராமப் புறங்களின் கல்வி அபிவிருத்திக்காகக் கூடுதலாகச் செலுத்த வேண்டும் என்று கேட்டுக் கொள்ளுகிறேன்.

**ආර්. එම්. කරුණාරත්න මහතා** (ඌව-පරණගම)

(திரு. ஆர். எம். கருணுரத்ன—ஊவ-பரணகம)

(Mr. R. M. Karunaratne—Uva-Paranagama)

ගරු කථානායකතුමනි, බදුල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩී. වින්සන්ට් ඩයස් මහතා) විසින් ඉදිරිපත් කර ඇති මෙම යෝජනාව ගැන අපගේ සතුට ප්‍රකාශ කරන අතර, මා මතක් කරන්නට කැමතියි. ප්‍රතිපත්තියක් වශයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සෑම මැතිවරණ කොට්ඨාශයකම මධ්‍යම මහා විද්‍යාල දෙක බැගින් ඇති කිරීමට කටයුතු කරන බවට පසුගිය අයවැය ලේඛන විවාද අවස්ථාවේදී අධ්‍යාපන ඇමතිතුමා විසින් ප්‍රතිඥාවක් දුන් බව. එසේම එය ක්‍රියාත්මක කරන බව ලංකාවේ නොයෙක් ප්‍රදේශවලදී එතුමා කියා තිබෙනවා. නමුත් මෙතැන තිබෙන ප්‍රධානතම ප්‍රශ්නය රටේ මුදල් තත්ත්වය අනුව සෑම ආසනයකම මධ්‍ය මහා විද්‍යාල ඇති කිරීමට කොපමණ කලක් ගතවේද යන්නයි. එනිසා මෙය ඉතා වැදගත් ප්‍රශ්නයක් ලෙස සැලකිල්ලට භාජනය කළ යුතුව තිබෙනවා. විමධ්‍යගත අය වැයටතේ ලැබෙන මුදල්වලින් මේ කාර්ය කරන්නට අපට පුළුවන්කමක් නැහැ. ඒ නිසා වෙනත් සංවිධානයකින් හෝ ජාත්‍යන්තර සහයෝගිතාවයක් මත ලබා ගන්නා ආධාරයකින් හෝ ලංකාවේ සෑම ආසනයකම මධ්‍ය මහා විද්‍යාල ආරම්භ කිරීම අපේ පාර්ලිමේන්තු කාලය තුළදීම කරන ලෙස ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. එසේ කළොත් එය ඉතා වැදගත් කටයුත්තක් වෙනවා.

අපි ප්‍රතිපත්තියක් වශයෙන් මෙය පිළිගෙන තිබුනත් එය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වෙන්න වෙන්නම ගම්බද ප්‍රදේශවල සිටින දරු දැරියන්ට නියම අධ්‍යාපනයක් ලබා ගන්නට බැරි තත්ත්වයක් ඇති වෙනවා. මා සිතනවා නගරබද තරුණ තරුණියන් සමග විභාගවලට පෙනී සිටියම්කිසි සාමාර්ථයක් ලබා ගන්නට නුවර එළිය අධ්‍යාපන දිස්ත්‍රික්කයේත්, අනිකුත් ගම්බද ප්‍රදේශවලත් ඉගෙනීම කරන තරුණ තරුණියන්ට අපහසුය කියා. නුවර එළිය දිස්ත්‍රික්කයේ පන්ලක්ෂයක් ජන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තාවගෙන් 1975 අවුරුද්දේ දී විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු විද්‍යා පීඨයට තේරුණේ එක ශිෂ්‍යයකු පමණයි. නමුත් මැතිවරණ කොට්ඨාශ 6 ක් තිබෙනවා. එහෙම නම්, මොන විධියේ අධ්‍යාපන තත්ත්වයක් නුවරඑළියේ තිබෙනවාද කියා කල්පනා කර බලන්න. සෑම මැතිවරණ කොට්ඨාශයකම මධ්‍ය මහා විද්‍යාල එක දෙක ආදී වශයෙන් තිබෙනවා. සාමාන්‍ය විද්‍යාලත් තිබෙනවා. ඒ වාගේම මහා විද්‍යාලත් තිබෙනවා. නමුත් ඒ සෑම එකකටම ප්‍රධාන ප්‍රශ්නය වී තිබන්නේ පංති කාමරත්, උපකරණවත් නොවෙයි, උගැන්වීමට ගුරුවරුන් නැති කමයි.

පසුගිය මාස දෙක තුන ඇතුළත ලංකාවේ නොයෙක් ප්‍රදේශවල ගුරුවරුන් මාරු කිරීම් සිදුවුණා. නමුත් නුවරඑළිය දිස්ත්‍රික්කය ගැන කල්පනාකර බලනවිට ඒ අන්දමට ගුරුවරුන් මාරුවී ආ බවක් පෙනෙන්නට නැහැ. ගුරු මාරුවීම් සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ තිබෙන යම් යම් දුර්වලතා නිසා අපට මේ තත්ත්වයට මුහුණ දෙන්නට සිදුවී තිබෙනවා. එනිසා ගරු කථානායකතුමනි, මෙයට පසුව ගුරු මාරුවීම් කෙරෙන අවස්ථාවලදී යම්කිසි ගුරුවරයකු යම්කිසි ස්ථානයකට මාරු කරනු ලැබුවහොත් ඒ සමගම ඔහුගේ වැටුප් ලේඛනයත් ඒ මාරු කරනු ලැබූ පාසලට හෝ ඒ මාරු කරනු ලැබූ දිස්ත්‍රික්කයට හෝ යැවීමට වැඩ පිළිවෙළක් සකස් විය යුතුයි. එසේ නොකළොත්, ඔහු වැඩ කළ පාසලෙන්ම වැටුප් ලැබෙනවා නම්, මාරුවීම් ක්‍රියාත්මක වන්නේ නැහැ. ඒ ගුරුවරයා ඒ පාසලේම නවතිනවා. කොළඹ දිස්ත්‍රික්කයේ සිටින දහස් ගණනක් ගුරුවරුන් මාරු කරනු ලැබුවත් ඔවුන් වෙනත් දිස්ත්‍රික්කවලට යන්නේ නැහැ, ඔවුන්ට සේවය කරන පාසලෙන් වැටුප් ලැබෙනතාක් කල්. මේ තත්ත්වය මගහැරවීමට යම්කිසි වැඩ පිළිවෙළක් යෙදුවොත් අපේ දිස්ත්‍රික්කවල තිබෙන ගුරු හිඟය සෑහෙන දුරකට අඩුකර ගන්න පුළුවන් වෙන බව ප්‍රකාශ කරමින් මට මේ අවස්ථාව ලබා දීම ගැන ගරු කථානායකතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ඉන්ද්‍රදාස හෙට්ටිආරච්චි මහතා (හොරණ)**

*(திரு. இந்திரதாச ஹெட்டி ஆரச்சி—ஹொரண)*

(Mr. Indradasa Hettiarachchi—Horana)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශයට සම්බන්ධ මෙම ප්‍රශ්නය බදුල්ලට මෙන්ම, හොරණ ආදී අනිකුත් ආයතනවලටත් බලපාන බව මා අමුතුවෙන් ප්‍රකාශ කළයුතු නැහැ. මහවැලි ගඟ යෝජනා ක්‍රමයෙන් අප අදහස් කරන්නේ. මහවැලි ගඟ වියළි ප්‍රදේශයට හරවා ඒ වියළි ප්‍රදේශ දියුණු කිරීමටයි. එසේම මේ යෝජනාවෙන් අප අදහස් කරන්නේ කොළඹ තිබෙන අධ්‍යාපන ක්‍රමය නමැති මේ මහා ගංගාව නොදියුණු ප්‍රදේශවලට හරවා ඒවායේ අධ්‍යාපන තත්ත්වය වැඩි දියුණු කිරීමටයි. එය ඉතාමත්ම කාලෝචිත වැඩ පිළිවෙළක් ය යනු මගේ හැඟීමයි. 9,000 කටත් වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවක් හොරණ නගරයේ අධ්‍යාපනය ලබනවා. ඒ ගණන නගරයේ ජනගහණයටත් වඩා වැඩියි. අධ්‍යාපන පහසුකම් කෙසේ වෙතත්, අඩු ගණනේ පාසැලකට ක්‍රීඩා පිටියක් වත් ලබා ගන්නට බැරි තත්ත්වයක් තමයි එහි පවතින්නෙ. තව දහසක් පමණ වූ මෙම ශිෂ්‍ය පිරිසට ලැබිය යුතු පහසුකම් සලසා දුන්නොත් හොරණ නගරයෙන් දැන් කොළඹට ඇදී එන ශිෂ්‍යයන් එහිම රඳවා ගන්න පුළුවන් බව විශේෂයෙන් මතක් කළ යුතුයි. බස් රථවලින් අද පාසල් සිසුන් විශාල සංඛ්‍යාවක් කොළඹ විද්‍යාලවලට එනවා.

ඇල්ලකන්ද වත්ත පාමුල තිබෙන ඉඩමක ක්‍රීඩා භූමියක් හදාගෙන එක්තරා පාසලක ළමයින් සෙල්ලම් කරනවා. ඔවුන්ට නියම විධියට සකස් වූ ක්‍රීඩා පිටියක් නැතිකම නිසා එතැන ගස් මුල් උඩින් කඩුළු පණින්න ගිහින් ශිෂ්‍යයන් තුවාල කර ගත් අවස්ථා මා නොයෙක් වර දැක තිබෙන බව මතක් කරන්නේ කනගාටුවෙන්. හොරණ ආසනයේ ද සොයිසා විද්‍යාලයේ පුටු මේස ආදිය ඇත්තෙ නැහැ. එහෙත් ඊට යාබද කොළඹ දිස්ත්‍රික්කයට අයත් ආසනයේ පාසල අංග සම්පූර්ණ තත්ත්වයක පවතිනවා. මේ පරතරය එතැනින්ම පෙනෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉන්ද්‍රදාස හෙට්ටිආරච්චි මහතා]

ගුරු හිඟය ගැන විශේෂයෙන් සැලකිල්ල දැක්විය යුතුයි. ගම්බද පාසල්වල විද්‍යාගාර නොමැති නිසා අසරණ දරුවන්ට නියම අධ්‍යාපනයක් ලබා ගන්නට අවස්ථාවක් නැතිව ගොස් තිබෙන බව මතක් කරන්නේ කනගාටුවෙන්. තම දරුවන්ට නියම අධ්‍යාපනයක් ලබා දෙන්න පුළුවන්කම තිබෙන්නෙ කොළඹ පාසලකට එව්වොත් පමණයි, යන හැඟීම සෑම දෙමාපියන් තුළම වගේ තිබෙනවා. ගම්බද පාසල්වල අඩුපාඩු සම්පූර්ණ කර දෙනවා නම් ඒ අදහස නැති කරන්න පුළුවන්. සෑම පාසලකම 10 වෙනි ශ්‍රේණිය තෙක් අධ්‍යාපනය ලබා දීමට විධිවිධාන යෙදිය යුතුයි. ඒ සම්බන්ධයෙන් අධ්‍යාපන ඇමතිතුමා විශේෂ උනන්දුවක් දක්වන නිසා මේ කාලය තුළ ඒ ප්‍රශ්නය නිරාකරණය වෙයි කියා මා විශ්වාස කරන අතර මේ යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බදුල්ලේ ගරු මන්ත්‍රීතුමාට මා ස්තුතිවන්ත වෙනවා.

**ජී. වී. පුංචිනිලමේ මහතා** (රත්නපුර)
*(திரு. ஜீ வி. புஞ்சிநிலமே—இரத்தினபுரி)*
(Mr. G. V. Punchinilame—Ratnapura)

ගරු කථානායකතුමනි, බදුල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩී. වින්සන්ට් ඩයස් මහතා) ඉදිරිපත් කර තිබෙන්නෙ වැදගත් යෝජනාවක්. රත්නපුරේ තිබුණේ උසස් පාසල් දෙකක් පමණයි. පසුගිය හත් අවුරුද්ද තුළ ගෙන ගිය පරිපාලනය යටතේ ඒ පාසල් දෙකේ තත්ත්වය නැත්තටම නැති වී ගියා. ඉන් එකක් ශිෂ්‍යයන් සඳහා වූ සීවලී මහා විද්‍යාලය. අනික ශිෂ්‍යාවන් සඳහා වූ පර්ගියුසන් බාලිකා මහා විද්‍යාලය. මේ විද්‍යාල දෙක බොහොම අමාරුවෙන් එක්තරා තත්ත්වයකට ගෙනැවිත් තිබුණු විද්‍යාල දෙකක්. නව රජය බලයට පත් වුණායින් පසුව කලින් මෙම බාලිකා විද්‍යාලයේ හිටපු විදුහල්පතිතුමිය නැවත පත් කරගෙන ඒ පාසල නව සැලැස්මක් යටතේ උසස් තත්ත්වයකට පත් කරගෙන එන විට අධ්‍යාපන අමාත්‍යාංශයේ කවුදෝ ඒ මුල්ගුරුතුමිය පහත වැටී තිබෙන පාසල් නගාසිටුවීම සඳහා පත් කර තිබෙනවා. ඉතා අමාරුවෙන් එක්තරා උසස් මට්ටමකට මෙම විද්‍යාලය පත් කළ ඒ මුල් ගුරුතුමිය හිටි අඩියේ මේ විධියට එතැනින් වෙනස් කිරීම ගැන මා කනගාටුවෙනවා.



**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
(Mr. R. Premadasa)

I move,

"That the Debate be now adjourned."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

ඊට අනුකූලව විවාදය කල් තබන ලදී.

එතැන් සිට විවාදය 1978 මැයි මස 3 වන බදාදා පවත්වනු ලැබේ.

*இதன்படி விவாதம் ஒத்திவைக்கப்பட்டது. விவாதம் 1978 மே 3, மீளத் தொடங்கும்.*

*The Debate stood adjourned accordingly*

*Debate to be resumed on Wednesday, 3rd May 1978.*

## කල් තැබීම

## ஒத்திவைப்பு

## ADJOURNMENT

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர் பிரேமதாச)*
(Mr. R. Premadasa)

I move,

"That the Assembly do now adjourn."

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*வினா எடுத்தியம்பப்பெற்றது.*

*Question proposed.*

**පී. ගනේෂලිංගම් මහතා** (පදිරිප්පු)
*(திரு. பீ. கணேசலிங்கம்—பட்டிருப்பு)*
(Mr. P. Ganeshalingam—Paddiruppu)

Mr. Speaker, I gave notice of these questions to the Hon. Acting Minister of Agriculture & Lands, but he is not here.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කා. පො. ඉරත්නම් මහතා**
*(திரு. கா. பொ. இரத்தினம்)*
(Mr. K. P. Ratnam)

I hope the Hon. Prime Minster will take note of it.

**පී. ගනේෂලිංගම් මහතා**
*(திரு. பீ. கணேசலிங்கம்)*
(Mr. P. Ganeshalingam)

My first question is this. Is the Minister of Agriculture & Lands aware that farmers in the Batticaloa District are being exploited by middlemen who purchase paddy from them at the rate of Rs. 28 a bushel which is very much below the guaranteed price? The purchasing managers of the multi-purpose co-operative societies are not purchasing any paddy. They wait at the Paddy Marketing Board stores, write the advice note, and collect the transport charges and the commission from the Paddy Marketing Board. The paddy purchased by the middlemen are surrendered to the Paddy Marketing Board. According to the statistics collected by the Government Agents, almost 50 per cent of the purchasing managers appointed by the multi-purpose co-operative societies are not purchasing any paddy, but daily they are surrendering paddy to the Paddy Marketing Board stores. They wait at the gate, collect the paddy brought by the middlemen, write the advice note, and surrender the paddy.

When the Minister recently came to Batticaloa he promised to send ten lorries to Batticaloa, but only there lorries were sent. Out of these three lorries, two lorries broke down and only one roadworthy lorry is transporting paddy. As a result, all the stores in the area are full, and unless this paddy is transported out the farmers will not be in a position to surrender paddy to these stores. Due to this congestion, corruption is setting in in the Paddy Marketing Board stores: the watchers at these stores demand Rs. 10 for a load of paddy to be taken into the stores, and the weighing labourers in turn demand money. The Paddy Marketing Board



storekeepers, because they are scared of the Bribery Squad, do not demand cash now but they demand paddy. For each consignment of paddy they take one gunny bag of paddy. All this has happened because there is no proper purchasing system.

Recently the Government decided to appoint agents to purchase paddy, and we nominated agents to the Government Agents. Now the Government Agent says that he is not in a position to appoint these agents because he has not received any instructions from the Minister. If the reason for not appointing these agents is that they wont to collect the loans granted to the cultivators, why cannot the Minister allow the cultivators to surrender paddy direct to the Paddy Marketing Board instead of going through the multi-purpose co-operatives? The farmer could be paid for transport and there would be no need for the Government to pay handling charges or commission to the multi-purpose co-operative societies at 75 cents a bushel.

My second question is this. Is the Minister of Agriculture & Lands aware that the off-ration rice purchased by the multi-purpose co-operative societies is being sold to businessmen who in turn dispose of this to the millers? The millers, without doing any milling, surrender this rice to the Food Controller. This is a vicious cricle. They do not collect any paddy from the Paddy Marketing Board stores; they only surrender rice to the Food Controller. This has become a mere paper transaction, and the millers collect the commission for milling and transporting! This vicious circle only serves to make the statistics go hay-wire. We can maintain statisties on paper but actually we do not know how much paddy is purchased, how much paddy is milled, and how much rice is distributed. It is only a volume of paper transactions.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. ගනේෂලිංගම් මහතා]

The Government should set a target in regard to the purchase and distribution of rice. The whole system will be thrown out of gear if what is happening at present is not stopped. I do think this is a very important matter for the Government to look into.

I am very sorry that the Hon. Acting Minister is not here even though I gave notice of this question.

**අනුර බණ්ඩාරනායක මහතා (නුවර එළිය මස්කෙලිය දෙවන)**
*(திரு. அனுர பண்டாரநாயக்க—நுவரெலிய-மஸ்கெலிய இரண்டாம் அங்கத்தவர்)*
(Mr. Anura Bandaranaike—Second Nuwara Eliya-Maskeliya)

ගරු කථානායකතුමනි, අද විශ්ව විද්‍යාල වල ඇති වී තිබෙන ඉතාමත්ම භයංකාර තත්ත්වය ගැන මෙම ගරු සභාවේදී ප්‍රශ්න කරන්නට සිදු වී තිබෙනවා. මා අද දින මේ ප්‍රශ්නය මතු කරන බව දැනුම් දී තිබියදීත් ගරු අධ්‍යාපන ඇමතිතුමා හෝ නියෝජ්‍ය ඇමතිතුමා හෝ මෙම ගරු සභාවට නොපැමිණීම ගැන මා කනගාටු වෙනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

සාමාන්‍යයෙන් අද දින රැස්වීම කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කරන්නට තිබෙන්නේ සවස 8 ටයි. එහෙත් කලින් බලාපොරොත්තු නොවූ අන්දමට දැන් කල් ඇතිව මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමාට මෙහි පැමිණීමට නොහැකි වී තිබෙනවා.

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர் பிரேமதாச)*
(Mr. R. Premadasa)

මම උත්තර දෙන්නම්.

**අනුර බණ්ඩාරනායක මහතා**
*(திரு. அனுர பண்டாரநாயக்க)*
(Mr. Anura Bandaranaike)

ගරු කථානායකතුමනි, පසුගිය සුමාන දෙක තුන තුළ විශ්ව විද්‍යාල මණ්ඩපවලට මැරවර කණ්ඩායම් ඇතුළු වී විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ට ඉතාමත්ම දරුණු විධියට පහර දී තිබෙනවා. ආණ්ඩුවට අයත් කිසිම පුවත් පතක මේ ගැන සඳහන් වෙලා නැහැ. මම උදාහරණ දෙකක් සඳහන් කරන්නට කැමතියි.

මාර්තු මාසයේ 29 වැනිදා කොළඹ මණ්ඩපයේ ඇති වූ සිද්ධියක් මුලින්ම කියන්නම්. ඇහැලියගොඩ දන්දෙනියේ බන්දුලසේන කොළඹ මණ්ඩපයේ තුන් වැනි වසරේ ඉගෙන ගන්නා ශිෂ්‍යයෙක්. මොහු මාර්තු 29 වැනිදා මණ්ඩපය තුළ සිටින අතර උදේ වරුවේ සිටම මණ්ඩප දොරටුව ළඟ මැරවරයන් රැස් වී ප්‍රකෝපකාරී වචන කියමින් ශිෂ්‍යයන්ට ගසමින් ශිෂ්‍යයන් ආරාවුලකට පටලවා ගන්නට උත්සාහ කළා. තේ පානය සඳහා එදින සවස 4 ට බන්දුලසේන සහ මනතුංග යන ශිෂ්‍යයන් දෙදෙනා බම්බලපිටියට ගොස් ආපසු එන අතර මැරවරයන් කීප දෙනකු ඔවුන් දෙදෙනාට අසභ්‍ය වචනයෙන් බනිමින්, පහර දෙමින්, අංක 193 දරන බස් රථයට ඔවුන් බලයෙන් ගොඩ කරවාගෙන එම රථය තුළදීද පහර දී තිබෙනවා. පසුව ඔවුන් සිරිකොත මන්දිරය ළඟින් බස්වා ගත් මැරවරයෙක් සිරිකොතේ දී වෙනත් පිරිසකට ඔවුන් භාර දී පිට වී ගොස් තිබෙනවා. සිරිකොතේදී පැය දෙකක් පමණ ප්‍රශ්න කොට ඔවුන් මුදා හැර ඇති අතර ආපසු ගමනේදී සවස 7 ට පමණ බන්දුලසේන බම්බලපිටිය පොලීසියට පැමිණිලි කර තිබෙනවා.

මේ ශිෂ්‍යයන් සිරිකොතට ගෙන යන්නේ මොකටදැයි අපට තේරෙන්නේ නැහැ. මීට පෙරත් මේ රටේ ආණ්ඩු ගණනාවක් තිබුණා. ඒ කිසිම ආණ්ඩුවක පාලන කාලයකදී මේ විධියට මැරවරයින් දමා ශිෂ්‍යයන්ට පහර දීබලහත්කාරයෙන් ඔවුන් රජයේ වාහනවලට දමාගෙන පක්ෂ කාර්යාලවලට ගෙන ගොස් නැහැ. එහෙත් දැන් එවැනි දේ සිදු වෙනවා. මේක මුළු රටටම නින්දාවක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කල් තැබීම

මාර්තු මාසයේ 29 වැනිදා සහ 30 වැනිදා සෞන්දර්ය අධ්‍යාපන ආයතනයේ ශිෂ්‍යයන් තුන් දෙනකට අර බන්දුලසේනට වාගේම පහර දී ආණ්ඩුවේ වාහනවල දමා ගෙන සිරිකොත මන්දිරයට ගෙන ගොස් තිබෙනවා. අද වන තුරු ඒ තුන් දෙනාට කුමක් වුණාදැයි අප දන්නේ නැහැ. අප්‍රේල් 1 වැනිදා මේ ප්‍රශ්නය "ජනදින" පත්‍රයේ සඳහන් වෙලා තිබෙනවා. අගලවත්තේ හිටපු මන්ත්‍රී ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මහතා මේ ප්‍රශ්නය මතු කර තිබෙනවා. [බාධා කිරීමක්] මේ අවස්ථාවේ මා කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (වීරසිංහ මල්ලිමාරච්චි මහතා) සමග වාදයකට එන්නට ලැස්ති නැහැ. මා දන්නවා එතුමාත් සාධාරණ ලෙස කල්පනා කරන මන්ත්‍රීවරයකු බව. එතුමා මෙවැනි වැඩ ප්‍රතික්ෂේප කරනවා ඇත කියල මා හිතනවා. ආණ්ඩුව කරගෙන යන මෙවැනි වැඩවලට ඒ ගරු මන්ත්‍රීතුමා ඇතුළු සාධාරණ ලෙස හිතන ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් විරුද්ධ වෙනවා ඇතැයි මා හිතනවා.

ඔය මැරවරයන් පාවිච්චි කර තිබෙන්නේ ආණ්ඩුවේ වාහන. ඒ වාහනවල අංක මා ළඟ තිබෙනවා. 6 ශ්‍රී 343 ඉසුසු කාර් එක ලංගමයට අයත් එකක්. මාර්තු මාසයේ 29 වැනිදා මැරවරයන් කොළඹ මණ්ඩපයට ගෙනවුත් තිබෙන්නේ මේ වාහනයෙනුයි. 5 ශ්‍රී 8103 ඉන්ටනැෂනල් ජීප් මොඩල් මෝටර් රථයත් ලංගමයේ වාහනයක්. ඒ වාහනයෙනුත් එදාම කොළඹ මණ්ඩපයට මැරවරයන් ගෙනවුත් තිබෙනවා. 6 ශ්‍රී 9614 පර්ජෝ 504 වාහනයෙන් මාර්තු මාසයේ 18 වැනිදා කොළඹ සෞන්දර්ය අධ්‍යාපන ආයතනයට මැරවරයන් ගෙනවුත් තිබෙනවා. මේ වාහනය කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ආධුනිකත්ව මණ්ඩලයට අයත් එකක්. 4 ශ්‍රී 9283 වොක්ස්වාගන් වාහනය ලෝහ භාණ්ඩ සංස්ථාවට අයත් එකක්. මාර්තු මාසයේ 18 වැනිදා ඒ වාහනයෙන් කොළඹ සෞන්දර්ය අධ්‍යාපන ආයතනයට මැරවරයන් ගෙනවුත් තිබෙනවා.

ආණ්ඩුවේ හොරණෑව වී ඇති "දිනමිණ" පත්‍රය මේ තත්ත්වය ගැන ඇත්ත කියා තිබීම ගැන මා සතුටු වෙනවා. මෙය මහ පුදුමයක්. 1978 මාර්තු 30 වැනි බ්‍රහස්පතින්දා 'දිනමිණ' පත්‍රයේ මෙහෙම පළ වී තිබෙනවා.

"ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ කොළඹ මණ්ඩපයේ අංශ කිපයකට ඊයේ අලුයම කඩා වැදුණු පොලිස් නිලධාරීන් පන්සිය දෙනෙකුගෙන් පමණ යුත් කණ්ඩායමක් එහි අවි ආයුධ හෝ පුපුරණ ද්‍රව්‍ය තිබේදැයි සම්පූර්ණ පරීක්ෂණයක් පැවැත්වූහ. එවැනි කිසිවක් එහි දී පොලිසියට සොයා ගැනීමට නොහැකි විය."

උදේ පාන්දර පොලීසියෙන් තුන් හාරසියයක් ගිහින් පැය ගණනක් පරීක්ෂා කර තිබෙනවා බෝම්බ තිබෙනවාද කියා. එහෙත් එහි බෝම්බ තිබුණු බවට අද වන තුරු කිසිම ආරංචියක් ලැබී නැහැ. අපට ලැබී තිබෙන ආරංචිවල හැටියට එහි බෝම්බ හෝ වෙනත් කිසිම ආයුධයක් තිබී නැහැ. එහෙත් අධ්‍යාපන ඇමතිතුමා මොකක්ද කිව්වේ? 1978 මාර්තු 31 වැනිදා "සිලෝන් ඩේලි මිරර්" පත්‍රයේ පළ වී තිබෙනවා ගරු අධ්‍යාපන ඇමතිතුමා මේ සම්බන්ධව කළ කථාවක වාර්තාවක්.

Sir, I will read from the "Ceylon Daily Mirror" of 31st March 1978:

"BOMBS FOUND IN CAMPUS ENOUGH TO FIGHT A WAR, SAYS NISSANKA

Bombs and weapons found in the residential universities were enough to fight a war and that was one reason why Government decided to close halls of residence at all university campuses."

I am asking the Government to state how many bombs were found. According to the "Dinamina", no bombs have been found.

**ජී. වී. පුංචිනිලමේ මහතා**
*(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)*
(Mr. G. V. Punchinilame)

There have been in other campuses. You are speaking about Colombo only.

**අනුර බණ්ඩාරනායක මහතා**
*(திரு. அனுர பண்டாரநாயக்க)*
(Mr. Anura Bandaranaike)

Why are you getting excited? This is a matter for the Minister of Education. Let him say how many bombs were found and where they were found.

5—ඒ 41637 (79/05)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

The news paper report may be wrong.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

I am very glad you are saying that your newspapers are not saying the truth.

ජී. වී. පුංචිනිලමේ මහතා
(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)
(Mr. G. V. Punchinilame)

The newspapers are free to say anything.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

ගරු කථානායකතුමනි, මෙය කියන විට අපේ රත්නපුරේ ගරුමන්ත්‍රීතුමා (ජී. වී. පුංචිනිලමේ මහතා) හුඟක් කලබල වී තිබෙනවා. මේවා කියන විට එතුමාට අමාරු වක් තිබෙනවා. ඒ ගැන කිසිවක් කියන්න මා කැමති නැහැ. අද මා මෙම ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා. තමුන්නාන්සේලා මේ විධියේ භයංකාර තත්වයක් විශ්ව විද්‍යාල වල ඇති කිරීම මේ රටේ ශිෂ්‍ය පරපුරටම ඇති කළ විශාල ප්‍රශ්නයක්. ඒ නිසා උදේ සිට රෑ වන තුරුම ධර්මිෂ්ඨ යයි කියා ගන්නා මේ ආණ්ඩුවෙන් අපි ඉල්ලා සිටින වා මේ පිළිබඳව ස්වාධීන පරීක්ෂණයක් පවත්වන්නය කියා.

There are retired Supreme Court judges who are very respected and highly admired in this country. Appoint one of those persons to inquire. This Government is appointing commissions at the drop of a hat. So, why not appoint a commission of inquiry ?

ගරු කථානායකතුමනි, මෙවැනි කොමිෂමක් පත් කර කරුණාකර මෙහි භයංකාර තත්ත්වය ගැන සොයා බලන හැටියට මා විශේෂ ඉල්ලීමක් කරනවා.

අවසාන වශයෙන් සඳහන් කරන්න කැමතියි, අපට ආරංචියක් ලැබී තිබෙනවා අප්‍රේල් 24 වැනිදා මේ විශ්ව විද්‍යාලය නැවත විවෘත කරන්න යනවා කියා. ශිෂ්‍ය යින් වෙනුවෙන් මා ඉල ලා සිටිනවා, විශ්ව විද්‍යාලය නැවත විවෘත කරන දවසට මේ ශිෂ්‍යයින්ට මැරවරයින් පිළිබඳව ප්‍රශ්නය කට මුහුණ පෑමට සිදු නොවන පරිදි ඔවුන්ට පොලිස් ආරක්ෂාව ලබා දෙන්නය කියා.

ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා (උඩුදුම්බර)
(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க—உடு தும்பற)
(Mr. A. M. R. B. Attanayake—Ududumbara)

විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් මැරු අය කොහොමද ඔවුන් වෙනුවෙන් කථා කරන්නේ ? ඔවුන් ගැන කථා කරන්න මේ අයට කිසිම අයිතියක් නැහැ. ලංකාවේ විශ්ව විද්‍යාල නැතුවවද උපාධි ගන්න "ඔක්ස්ෆර්ඩ්" ගියේ ? ලංකාවේ විශ්ව විද්‍යාලවල පස් නොපාගපු අය කොහොමද විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් ගැන කථා කරන්නෙ ?

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

උඩුදුම්බර මන්ත්‍රීතුමා කුලප්පු නොවී මා කියන දේ අහන්න.

ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා
(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)
(Mr. A. M. R. B. Attanayake)

තමුන්නාන්සේලාගේ පරපුරේ කිසිම කෙනෙක් ලංකාවේ විශ්ව විද්‍යාලවල පස් වත් පාගලා නැහැ. ලංකාවේ විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් ගැන කථා කරන්න ඕනෑ අපියි.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

ගරු කථානායකතුමනි, මේ තත්ත්වය ඉතාම භයංකාර නිසා මේ තත්ත්වය ගැන සොයා බලා අපට වාර්තාවක් දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එස්. ඩී. බණ්ඩාරනායක මහතා (ගම්පහ)**
*(திரு. எஸ். டி. பண்டாரநாயக்க—கம்பஹா)*
(Mr. S. D. Bandaranayake—Gampaha)

ගරු කථානායකතුමනි, මට පෙර කථා කළ නුවරඑළිය-මස්කෙළිය දෙවන මන්ත්‍රීතුමා සඳහන් කළ පරිදි තරුණ පරපුරෙත්, ශිෂ්‍යයෙන් අතරෙත් ඉතාමත්ම නොසන්සුන් තත්ත්වයක් අද පවතිනවා. මේ ප්‍රශ්නය ගැන පටු දේශපාලනයෙන් තොරව, රටක්, ජාතියක් වශයෙන් පුළුල් ලෙස කල්පනා කර බලන්න ඕනෑ. මන්ද? මේ රටේ අනාගත පරම්පරාව මේ තරුණ කොටස් නිසයි. දැන් විශ්ව විද්‍යාල සියල්ලක්ම වසා දමා තිබෙනවා. ඒ වාගේම අභ්‍යාස විද්‍යාලත් වසා දමා තිබෙනවා. මෙය ඉතාමත්ම බැරෑරුම් තත්ත්වයක්. අධ්‍යාපන ඇමතිතුමා පත්‍ර මාර්ගයෙන් නොයෙකුත් ප්‍රකාශන කරනවා. මේවා සත්‍යද අසත්‍යද කියන්න මා දන්නේ නැහැ. නමුත් මෙවැනි ප්‍රකාශනවලින් වෙන්නේ ප්‍රශ්නය තව තව අවුල් වීම මිස විසඳීමක් නොවෙයි. එම නිසා මෙහිදී මා ගරු අගමැතිතුමාට මතක් කරන්න සතුටුයි—අහේතුවකට මෙන් ගරු ජනාධිපතිතුමා මේ ගරු සභාවේ නැහැ—මේ කාරණය සම්බන්ධයෙන් නොපමාව පියවර ගන්නා ලෙස. ඇත්ත වශයෙන්ම විශ්ව විද්‍යාලවල සහ අභ්‍යාස විද්‍යාලවල නියෝජිත පිරිස් කැඳවා ඒ අයගේ ප්‍රශ්න සම්බන්ධයෙන් අපක්ෂපාතව විමසා බලා සුදුසු පියවරක් නොපමාව ගන්නා මෙන් ගරු අගමැතිතුමාගෙනුත් ගරු ජනාධිපතිතුමාගෙනුත් ඉල්ලා සිටින්න කැමතියි.

තුල්හිරියෙ ප්‍රශ්නය සම්බන්ධයෙන් දැන් කථා කරන්න මම සතුටු නැහැ. කෙසේ වුණත් ඒ සම්බන්ධයෙනුත් අධ්‍යාපන ඇමතිතුමා ප්‍රකාශන වගයක් කර තිබුණා. ගරු කථානායකතුමනි, මා කලින් සඳහන් කළ පරිදි මේ තරුණ කොටස් කැඳවා මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් පැහැදිලි පියවරක් ගන්නා ලෙස ඉල්ලා සිටින අතර ඉන් පසුව අවශ්‍ය නම් මට පෙර කථා කළ මන්ත්‍රීතුමා සඳහන් කළ පරිදි කොමිෂන් සභාවක් හෝ පත් කර මේ ප්‍රශ්නය ගැන සොයා බලන්නට පුළුවනි.

කල් තැබීම

රක්ෂා විරහිත තරුණයන්ට රුපියල් පණහක් දීමේ වැඩ පිළිවෙළත් කඩිනම් කරන ලෙස ඉල්ලා සිටින අතර නිරහාර යෙන් නිදහස් කර ඇති සහෝදරයින්ට තමන් කලින් යෙදී සිටි රක්ෂා ලබා දීමට හෝ කිසියම් පියවරක් ගත්තොත් මා සිතන හැටියට දැන් පවතින නොසන්සුන් භාවය බොහෝ දුරට අඩු වන්න පුළුවනි. එම නිසා මේ කාරණා සම්බන්ධයෙනුත් නොපමාව පියවර ගන්නා ලෙස ඉල්ලා සිටින්න කැමතියි.

**ජී. වී. පුංචිනිලමේ මහතා**
*(திரு. ஜீ. வி. புஞ்சிநிலமே)*
(Mr. G. V. Punchinilame)

ගරු කථානායකතුමනි, පසුගිය සිරිමා බණ්ඩාරනායක මැතිණියගේ රජය සියලුම වතු රාජසන්තක කළාට පසු නොයෙකුත් ආයතන පිහිටුවා ඒ වතුවල පාලනය භාර දුන්නා. එයින් එකක් තමයි දිස්ත්‍රික්ක සමුපකාර වතු සංවර්ධන මණ්ඩලය. මෙම මණ්ඩලයේ, රත්නපුර ප්‍රදේශය භාර ගත්තේ එතුමියගේ නෑදෑයකු වන රත්නපුර හිටපු මන්ත්‍රීතුමාගේ සහෝදරයයි. එසේ භාර ගෙන ඒවායේ පාලනය කොයි අන්දමට ගෙන ගියාද කියා රත්නපුර ප්‍රදේශය හරහා යන ඕනෑම කෙනෙකුට පෙනී යනවා ඇති. තේ ගස් උඩින් ලෝක පාලු වැල් වැවිලා. රබර් ගස්වල අතු ටික කපලා කඳ පමණයි ඉතුරු වී තිබෙන්නේ. මේ අන්දමට වතු කාබාසිනියා කර දමා තිබෙනවා. කොහොම වුණත් වතුවල කම්කරුවන් ඉපයූ මුදල් වලින් අර්ථසාධක අරමුදල් අඩු කර ගෙන තිබෙනවා. 1976 සහ 1977 වර්ෂවලදී, ආණ්ඩුව විසුරුවා හරින තුරු අර්ථසාධක අරමුදලට කපා ගෙන තිබුණා. දැනට මේ වතුවල පාලනය භාර ගෙන තිබෙන්නෙ රාජ්‍ය වැවිලි සංස්ථාවයි. අපි පෙරේද, දිසාභාර ප්‍රාදේශීක කළමනාකාර මහතා කැඳවා ගෙන වත්තකට ගිහින් පරීක්ෂණයක් කළා. ඒ කම්කරුවන් සියලු දෙනාගෙන්ම අවුරුදු දෙකක කාලයක් තිස්සෙ අර්ථසාධක අරමුදලට මුදල් කපා ගෙන තිබුණත් එවකට ප්‍රාදේශීය කළමනාකරු වශයෙන් සිටි හිටපු මන්ත්‍රීතුමාගේ සහෝදරයා, හිටපු අගමැතිණියගේ බෑනා ඒ මුදල් සේවා අර්ථසාධක අරමුදල් කාර්යාලයට බැඳලා නැහැ.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කල් තැබීම

[ජී. වී. පුංචිනිලමේ මහතා]

අපේ ආණ්ඩුව බලයට පත් වී දැන් අවුරුද්දක් පමණ ගත වී තිබෙනවා. මේ අහිංසක කම්කරුවන්ගේ මුදල් එම වතු පාලනය කළ යම් යම් අය තමන්ගේ පෞද්ගලික ගිණුම්වලට බැර කරගෙන තිබෙනවා. එම නිසා, වහාම මේ අයට නඩු දමා හෝ වෙන මොන දෙයක් කර හෝ, ලක්ෂ ගණනක් වන මේ මුදල් සමාජවාදයේ නාමයෙන් ගසා කෑ අයගෙන් ආපසු ලබාගෙන **දුප්පත් කම්කරුවන්ට ලබා දීමට, කම්කරු** අර්ථසාධක අරමුදලට ඒවා යෙදවීමට කටයුතු කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
*(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)*
(Mr. A. M. R. B. Attanayake)

ගරු කථානායකතුමනි, අධ්‍යාපනයට සම්බන්ධ ඉතාම වැදගත් කාරණයක් ගරු අධ්‍යාපන ඇමතිතුමා වෙත යොමු කිරීමට මා අදහස් කරනවා. අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් දිස්ත්‍රික්ක මට්ටමෙන් හා විමධ්‍යගත මට්ටමෙන් නැටුම් උපකරණ, සංගීත භාණ්ඩ, විද්‍යා උපකරණ හා නොයෙක් පොත්පත් ආදිය ඒ ඒ දිස්ත්‍රික්කවල පාසල්වලට සපයනවා. කොළඹ ප්‍රධාන ශාඛාවෙන් මේ උපකරණ ඒ ඒ දිස්ත්‍රික්කවල ශාඛාවලට බාර දුන් විට ඒ ශාඛා මගින් ඒවා ඒ ඒ විද්‍යාලවලට—පාසල්වලට—බෙදා හරිනවා.

ගතානුගතිකව පැවත ආ මේ බෙදා හැරීමේ ක්‍රමයෙහි දැන් විශාල වෙනසක් කළ යුතුව තිබෙනවා. ඊට හේතුව මේකයි. ප්‍රධාන මධ්‍යස්ථානයෙන් කිසියම් ප්‍රාදේශීය මධ්‍යස්ථානයකට මෙම උපකරණ බාර දුන් විට ඒවා හැමදාමත් එකම පාසල් ගණනාවකට පමණක්, එකම ලැයිස්තුවකට පමණක් වෙන් වන තත්ත්වයක් අවුරුදු ගණනාක් තිස්සේ පැවැතිගෙන ඇවිත් තිබෙනවා. අපි උදාහරණයක් වශයෙන් 'මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානය ගනිමු. එතැනට ප්‍රධාන ශාඛාවෙන් ලැබෙන මෙම උපකරණ හැමදාමත් ලැබෙන්නේ එකම පාසල්වලටයි. නොලැබෙන පාසල්වලට මේවා කවදාවත් ලැබෙන්නේ නැහැ. ඇත ගම්බද පාසල් සම්පූර්ණයෙන්ම මෙහි දී අමතක කර දමා තිබෙනවා. මේ තත්ත්වය නිසා දැන් මෙම උපකරණ නිසි පරිදි බෙදා හැරීම ඒවා බාර ගබඩාකරුවන්ට ගැටළුවක් වී තිබෙනවා. හැම අවුරුද්දේම මේවා ලැබී තිබෙන්නේ එකම පාසල් කොටසකට පමණයි. දැන් මේ තත්ත්වය වහාම නැති කරන්නට ඕනෑ.

මෙය නැති කිරීම සඳහා නිලධාරීන්ගේ තනතුරුවල වෙනසක් වහාම කරන්නට ඕනෑ. සෑම දිස්ත්‍රික්කයක්ම තිබෙන ප්‍රධාන අධ්‍යාපන කාර්යාලයට සම්බන්ධිත සැපයීම් නිලධාරියකු මේ සඳහා පත් කරන ලෙස මා ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. සැපයීම් නිලධාරියකු පත් කළ විට, තම ප්‍රදේශයේ මෙම උපකරණ ලැබෙන නොලැබෙන පාසල් මොනවාදැයි හරි හැටි සොයා බලා මේවා නිසි පරිදි, සාධාරණ පරිදි බෙදා හැරීමට ඔහුට පුළුවන්කමක් ඇති වෙනවා. මෙතෙක් තිබුණු තත්ත්වය අනුව සමහර නිලධාරීන් තම තමන්ගේ හිතවත්කම් උඩ, තම දූ පුතුන් උගන්වන පාසල්වලට පමණක් බොහෝ විට මෙම උපකරණ බෙදා දී තිබෙනවා. සැපයීම් නිලධාරියකු සිටින විට ඔහුට වගකීමක් පැවරෙනවා. ඔහු අමාත්‍යාංශයට වගකියන්නට ඕනෑ. එම නිසා සෑම ප්‍රධාන කාර්යාලයකම මෙම උපකරණ සාධාරණ අන්දමින් බෙදා හැරීම සඳහා සැපයීම් නිලධාරියකු හැකි පමණ ඉක්මනින් පත් කරන ලෙස මා ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මෙය විශේෂ කාරණයක් වශයෙන් සැලකිල්ලට ගන්නා ලෙසත් මා ගරු ඇමතිතුමාගෙන් ඉතා කරුණාවෙන් ඉල්ලනවා.

තවත් අමතර කාරණයක් ඉදිරිපත් කිරීම සඳහා මට තව විනාඩි පහක පමණ කාලයක් ගරු කථානායකතුමාගෙන් ලැබේයයි මා විශ්වාස කරනවා. නුවරඑළිය මස්කෙළියේ දෙවන ගරු මන්ත්‍රීතුමා (අනුර බණ්ඩාරනායක මහතා) විශ්වවිද්‍යාල සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. මේ විශ්වවිද්‍යාල ප්‍රශ්නය අද ඊයේ ඇති වූ එකක් නොවෙයි. විශ්වවිද්‍යාල පටන් ගත් දා සිට සෑහෙන කාලයක් ගත වන තුරු ඒවා නිවී සැනසිල්ලේ පැවතිගෙන ආවා. එහෙත්, වාමාංශික දේශපාලන ධම් මේ රටේ පැතිරෙන්නට පටන් ගන්නා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඊින් පසු ඒ දේශපාලනඥයන් මේ රටේ විශ්ව විද්‍යාල තමන්ගේ අතකොළු බවට පත් කර ගන්නට කටයුතු කළා. අද එය ඉතාම ලස්සණට පෙනී යන කාරණයක්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විශේෂයෙන් මේ කාරණය අවබෝධ කර ගන්නට ඕනෑ. තුනක් තිබිලා එයින් දෙකක් බිම වැටිලා අනෙක් එකෙන් අට දෙනෙක් දැන් මෙහි ඇවිත් සිටිනවා. සම සමාජ, කොමියුනිස්ට් උදවිය අද මෙහි නැහැ. මේ ප්‍රශ්නවලට උත්තර දීමට ඒ අය මෙහි සිටියා නම් මා බොහෝම සන්තෝෂ වෙනවා.

ජනාධිපති උතුමාණන් එම පදවියට පත් වූ දවස මේ රටේ ඉතිහාසයේ ඉතාම සාධම් බර දිනයක්. ජනසම්මත වාදය අනුව සම්පූර්ණ විධායක බලතල ඇති ජනාධිපතිවර යකු මේ රටේ පළමුවැනි වරට පත් වූ ඒ දිනය මේ රටේ උතුම්ම දිනයක්. ඒකට විරුද්ධව විශ්ව විද්‍යාලයේ කොමියුනිස්ට්, සමසමාජ, ශ්‍රී ලංකා කණ්ඩායමේ උදවිය ඉල්ලීමක්—ඩිමාන්ඩ් එකක්—සකස් කර ගත්තේ නැද්ද? ඒ පනතට විරුද්ධව, ගරු ජනාධිපතිතුමාගේ පත්වීමට විරුද්ධව අප්‍රසාදය පළ කිරීමේ තීරුවක් ඔය උදවිය ගේ සටහනේ තිබුණේ නැද්ද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මන්ත්‍රීවරුන්ගේ අදහස් එතන තුන් හතර දෙනෙක් ක්‍රියාත්මක කරන්න පටන් ගත්තා. ඒකයි වුණේ.

නුවරඑළිය මස්කෙළිය දෙවන ගරු මන්ත්‍රීතුමාට (අනුර බණ්ඩාරනායක මහතා) මම එකක් කියන්න කැමතියි. කැත මට්ටමට, නින්දිත විදියට, මේ රටේ අනාගතය බාර දෙන්න තියෙන දූදරුවන් නැති කර, ඒ ශිෂ්‍යයන්ගේ මළකඳන් උඩින් ගමන් කර, තමන්ගේ රදළ වාදය හා රදළ පන්තිය රැක ගන්න උත්සාහ කරන්න තවත් හිතේ තියෙනවා නම් කරුණාකර ඒ අදහස අත්හරින්නය කියන එකයි, ඒ. සාධාරණ සමාජයක් දෙස ඇත්වත් තමන්ගේ ඇස් හැර බලන්නැයි මම ඒ අයගෙන් ඉල්ලා සිටිනවා. එතුමා විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් වෙනුවෙන් කතා කරනවා. ගරු එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමා පිටස්තර විශ්ව විද්‍යාලයකට ගිහින් උපාධියක් ලැබුවා. ඒ යුගයේ ලංකාවේ විශ්ව විද්‍යාල අධ්‍යාපනයක් තිබුණේ නැහැ. කෙසේ වෙතත් එතුමාගේ ඇනුම තුළින් 1956 දී ලංකාවේ යම්කිසි සමාජ පෙරළියක්, වැඩ කොටසක් සිදු වුණාය කියා මම හිතනවා. අද මෙතුමා ගෙන් මම අහනවා, ඒ වාගේම මෙතුමා ගේ ඉතිරි සහෝදර පිරිසගෙන් මම අහනවා, ඒ වාගේම මෙතුමාගේ පරම්පරා වෙන් මම අහනවා, එක් කාරණයක්. ලංකා විශ්ව විද්‍යාලය ආරම්භ කළාට පස්සෙයි, මේ වගෙ අය ඉස්කෝලෙ ගිහිල්ල තියෙන්නේ. ඇයි, මෙතුමාගේ පරම්පරාවේ කෙනෙකුට ලංකා විශ්ව විද්‍යාල යේ පස් පාගන්න බැරි වුණේ, කියන ප්‍රශ්නයයි, මම ඒ අයගෙන් අහන්නෙ. ඇයි, ඒ අය උපාධි පාස් වෙන්න ඔක්ස්ෆර්ඩ් හොයාගෙන ගියේ? අද දේශපාලන බිමට ඇවිල්ලා විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් තමන්ගේ ආයුධ බවට පත් කරගන්න කතා කරනවා.

**අනුර බණ්ඩාරනායක මහතා**
*(திரு. அனுர பண்டாரநாயக்க)*
(Mr. Anura Bandaranaike)

වෙළඳ ඇමති ලලිත් ඇතුලත්මුදලි මහත්මයා කොහේද ඉගෙන ගත්තෙ?

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
*(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)*
(Mr. A. M. R. B. Attanayake)

ඒක ප්‍රශ්නයක් නොවෙයි.

**අනුර බණ්ඩාරනායක මහතා**
*(திரு. அனுர பண்டாரநாயக்க)*
(Mr. Anura Bandaranaike)

ඇයි නැත්තෙ? ඔයගොල්ලො අතරත් වැරදි තියෙනවා.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
*(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)*
(Mr. A. M. R. B. Attanayake)

මෙතන විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් වෙනුවෙන් කතා කරන්න මෙතුමාගේ පරම්පරාවට ගැවුණු පුද්ගලයෙකුටවත් අයිතියක් නැහැ. උඩුදුම්බර මන්ත්‍රීවරයාට ඒ අයිතිය තියෙනවා. මම ඒ බව කියනවා, ආඩම්බ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. එච්. ආර්. බී. අත්තනායක මහතා]

රෙන්. මේ අය සුමාන දෙකෙන් තුට්ටු දෙකේ උපාධි ගන්න ඔක්ස්ෆර්ඩ් යනවා. අර පිලිකන්නේ තියෙන ලංකා විශ්ව විද්‍යාලයට ඇතුල් වෙන්නේ නැහැ. නමුත් දැන් විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් වෙනුවෙන් කතා කරනවා. එදා විශ්ව විද්‍යාල ශිෂ්‍යයා මරා දැම්මේ තමුන්නාන්සේගේ පරම්පරා වේත් තමුන්නාන්සේගේ පක්ෂයේත් මිනිස්සු. එදා තමුන්නාන්සේලා කතා කළේ නැහැ, විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් වෙනුවෙන්. එදා අර පේරාදෙනියේ විශ්ව විද්‍යාල ශිෂ්‍යයා මරා දාපු වෙලාවේදී මේ කාඩ්බෝඩ් වීරයා කොහේද හිටියේ? එදා මේ අය විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් වෙනුවෙන් කෑ ගැහුවෙ නැහැ. එදා විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ට නොවෙයි, මෙයාගෙ ආදරේ තිබුණේ. අම්මටයි. තමන්ගෙ අම්මත් අම්මගෙ ආණ්ඩුවත් රැක ගන්න එදා කෑ ගහපු පුද්ගලයා අද කෑ ගහනවා. විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් වෙනුවෙන් කාටද ඔය වැදි බණ කියන්නෙ?

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

වැදි බාසාව තේරෙන්නෙ තමුන්නාන් සෙට විතරයි.

ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා
(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)
(Mr. A. M. R. B. Attanayake)

වැද්දන් තුළ තියෙන දුගුණධර්ම තමුන්නාන්සේ තුළ නැහැ. එම නිසා මේ විශ්ව විද්‍යාල ප්‍රශ්නය සාධාරණ ජාතික හැඟීම් මට්ටමකින් මතු කරන්න සිදු වෙලා තියෙනවා. විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්, රටේ වගකීමක් භාර ගතයුතු පිරිසක්; රටේ වැදගත් පිරිසක්, රටේ බුද්ධිමත් පිරිසක්. වැදගත් තීන්දුවලට බැසගතහැකි පිරිසක්. ඒ උදවියගේ ආකල්ප තුවාල කරන්න එපා. යම් යම් දේශපාලන මතිමතාන්තර අනුව කටයුතු කර—

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

තමුන්නාන්සේ ආණ්ඩුව නමයි, තුවාල කරන්නෙ.

ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා
(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)
(Mr. A. M. R. B. Attanayake)

ඇයි, තමුන්නාන්සේට අද ඔතරම් වේදනාවක්? ඇයි තමුන්නාන්සේ ලංකා විශ්ව විද්‍යාල ශිෂ්‍යයෙක් වශයෙන් ඇතුළත්වෙලා සටන මෙහෙයෙව්වෙ නැත්තෙ? ඒ වෙලාවෙ කොඳු ඇටේ තිබ්බෙ නැහැ. [බාධා කිරීම්] ඇයි, තමුන්නාන්සෙගෙ ආණ්ඩුව තියෙද්දි ඇතුළත් නුනෙ? විදේශ විනිමය ලක්ෂ ගණන් වියදම් කරලා ඔක්ස්ෆර්ඩ් ගියා.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

විදේශ විනිමය ශතයක්වත් වියදම් කළේ නැහැ.

ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා
(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)
(Mr. A. M. R. B. Attanayake)

එහෙනම් කාගෙන්ද වියදම් කළේ? [බාධා කිරීම්.]

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

තමුන්නාන්සෙගෙ තාත්තගෙන්.

ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා
(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)
(Mr. A. M. R. B. Attanayake)

මම හිතනවා, එතුමා ඔයතරම් කැත නැහැයි කියා.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

කැත? ඒ ගැන උඩුදුම්බර ජනතාව දන්නවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
*(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)*
(Mr. A. M. R. B. Attanayake)

උඩුදුම්බර හරක් බැඳපු. කොල්ලගෙ තත්ත්වයට තමුන්නාන්සෙ පත් වෙලා නෙ.

**අනුර බණ්ඩාරනායක මහතා**
*(திரு. அனுர பண்டாரநாயக்க)*
(Mr. Anura Bandaranaike)

උඩුදුම්බර ආසනයෙ මැතිවරණයක් තිබ්බොත් තමුන්නාන්සෙ කපෝති.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
*(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)*
(Mr. A. M. R. B. Attanayake)

අපි අපේ චරිත පවිත්‍රවයි, තියාගෙන ඉන්නෙ. මේ අත උස්සල පන්සිල් රකින මන්ත්‍රීවරයෙක් වශයෙනුයි, මේ උඩුදුම්බර මන්ත්‍රීවරයා ඉන්නෙ. මේ උඩුදුම්බර මන්ත්‍රීවරයා, නුවරඑළිය-මස්කෙළිය දෙවන මන්ත්‍රීවරයා විදියට හරක් පට්ටි පාලනය කරන්න ගිය පුද්ගලයෙක් නොවෙයි. [බාධා කිරීම්.]

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

මොකක්ද, මේ වාදයේ තේරුම? තමුන්නාන්සේ මොකක් ගැනද කථා කරන්නේ?

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
*(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)*
(Mr. A. M. R. B. Attanayake)

මා කථා කරන්නේ විශ්ව විද්‍යාල අධ්‍යාපනය පිළිබඳවයි; විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් පිළිබඳවයි. [බාධා කිරීම්] විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් පිළිබඳව කථා කරන්න තරම් තත්ත්වයක් ඇති, ගුණධර්ම ඇති, ඒ පිළිබඳ යම්කිසි ආකල්පයක් ඇති කර ගත හැකි තත්ත්වයක පුද්ගලයකු කථා කළා නම් ඉවසන්න තිබුණා, කථානායකතුමනි. ඒ තත්ත්වයෙන් පිරිහී ගිය, ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ පස් පාගා නැති පරම්පරාවක මිනිසුන්, පවුල් වාදය රැක ගන්න පිටරටවලට ආවැඩූ පුද්ගලයන් ඇයි, මේ විධියට ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය ගැන කථා කරන්නේ කියන එකයි, ප්‍රශ්නය. [බාධා කිරීම්] පෙළපාළි යන්න ශිෂ්‍ය යන් එකතු කරනවා. [බාධා කිරීම්] එම නිසා ඒ මන්ත්‍රීතුමාගෙන් මා කාරුණිකව ඉල්ලා සිටිනවා අම්මාගේ, තාත්තාගේ, සහෝදරියගේ පවුල් වාදය රැක ගන්න විශ්ව විද්‍යාල පාවිච්චි කරන්න උත්සාහ නොකර, නියම දර්ශනයක් මත විශ්ව විද්‍යාල මෙහෙයවන්න වහාම අප සමග එකතු වන්නය, ධර්මිෂ්ට සමාජයක් සඳහා උගත් පන්තිය මෙහෙයවන්න දැන්ම අප සමග එකතු වන්නය කියා. [බාධා කිරීම්] ඒ මන්ත්‍රීතුමා අම්මාට අත්තනගල්ල රැක දෙන්න ගත් වැයම කොපමණදැයි අප දන්නවා. ඒ වාගේම එතුමා නුවරඑළිය-මස්කෙළිය අසුන රැක ගැනීම සඳහා ගෙන ගිය බෝම්බ ව්‍යාපාරත් අප දන්නවා. වැරදිලාවත් විශ්ව විද්‍යාල පැත්තේ යන්න එපාය කියා මා එතුමාට අවවාද කරනවා, [බාධා කිරීම්] ළමයින්ට බෝම්බ ව්‍යාපාර උගන්වන්න— [බාධා කිරීම්]

**අනුර බණ්ඩාරනායක මහතා**
*(திரு. அனுர பண்டாரநாயக்க)*
(Mr. Anura Bandaranaike)

තමුන්නාන්සේ ඡන්ද කොට්ඨාශයට අඩිය තබන්නේ නැහැ. දැන් මහ ලොකු වට මෙතැන ඇවිත් කයිවාරු ගහනවා. තමුන්නාන්සේට මිණිපේ පැත්තටවත් යන්න බැහැ.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
*(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)*
(Mr. A. M. R. B. Attanayake)

එදා රෑ දොළහට තමුන්නාන්සේ මගේ කොට්ඨාශයට හොස් පැනලා ආවා.

**අනුර බණ්ඩාරනායක මහතා**
*(திரு. அனுர பண்டாரநாயக்க)*
(Mr. Anura Bandaranaike)

අපට පුළුවනි, ඕනෑම වෙලාවක ඡන්ද කොට්ඨාශවලට යන්න.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
*(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)*
(Mr. A. M. R. B. Attanayake)

ඇයි, රෑ යන්නේ? එන්න, දවල් කාලයේ.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**අනුර බණ්ඩාරනායක මහතා**
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

තමුන්නාන්සේත් අර රැල්ලට ගහ ගෙන ආ මන්ත්‍රීවරයෙක්. අද උඩුදුම්බර අතුරු මැතිවරණයක් තිබ්බොත් තමුන්නාන්සේ පරදිනවා.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)
(Mr. A. M. R. B. Attanayake)

තමුන්නාන්සේ හසලක පාරේ වැටී සිටියා, බීලා. එවැනි පුද්ගලයෙක් නේද මේ කථා කරන්නේ? [බාධා කිරීම්]

**අනුර බණ්ඩාරනායක මහතා**
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

අභූත චෝදනා කරන්න එපා,
Hon. Speaker, he must withdraw his statement that I have been to Hasalaka once to address a meeting against this good gentleman.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)
(Mr. A. M. R. B. Attanayake)

තමුන්නාන්සේ ගෝල්ෆේස් එකට ගිහින්—[බාධා කිරීම්] විදුරුවට ගැහුවා, බීලා වෙරි වෙලා. එවැනි පුද්ගලයෙක් තමයි මේ.

**අනුර බණ්ඩාරනායක මහතා**
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

I rise to a point of Order, Sir. The hon. Member is making an allegation that I was found drunk on the Galle Face Green. What is he talking about? He must withdraw it. I insist that he should wihtdraw it.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

උඩුදුම්බර මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේට බැහැ, එහෙම කථා කරන්න.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)
(Mr. A. M. R. B. Attanayake)

ඇයි, එහෙම නම් නුවරඑළිය-මස්කෙළිය දෙවැනි මන්ත්‍රීතුමා මට නින්දා කළේ? ඒ අනුව තර්ක ශාස්ත්‍රයට අනුකූලව මට සිද්ධ වුණා, ඒ විධියට කථා කරන්න. ඒ මන්ත්‍රීතුමා තර්ක ශාස්ත්‍රය හදාරා තිබෙනවාදැයි මා දන්නේ නැහැ. කථානායකතුමනි, මා දැන් කථාව අවසන් කරන්නයි, බලාපොරොත්තු වන්නේ. අවසාන වශයෙන් අපේ විශ්ව විද්‍යාලවලින් ජාතියට සේවයක් වේවා, අවස්ථාවාදී දේශපාලනඥයන්ගෙන් විශ්ව විද්‍යාල ශිෂ්‍ය පරම්පරාව නිදහස් වේවායි ප්‍රාර්ථනා කරමින්—

**අනුර බණ්ඩාරනායක මහතා**
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

ජයවේවා!

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)
(Mr. A. M. R. B. Attanayake)

—විශ්ව විද්‍යාලවල පස් පාගන්න අයිතියක් නැති අයට එහි යාමට අවසර නැති වේවා යනුවෙන් ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

එය නොවෙයි, ප්‍රශ්නය. මන්ත්‍රීවරයකුට විරුද්ධව ඔප්පු කරන්න බැරි චෝදනාවක් එල්ල කිරීම වැරදියි.

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)
(Mr. A. M. R. B. Attanayake)

ඇයි, එතුමාත් මට චෝදනා කළේ?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඒ මන්ත්‍රීතුමා බීලා වැටී හිටියා යයි කීවා නේද? ඒ කොහේද?

**ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා**
(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)
(Mr. A. M. R. B. Attanayake)

එතුමා හසලක එසේ වැටී හිටියා. [බාධා කිරීම්]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

එහෙම කියන්න බැහැ. එය ඇත්තක් වුණත් එහෙම කියන්න බැහැ. එහෙම කියන්න නම් වෙනම යෝජනාවක් ගෙනෙන්න ඕනෑ.

ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා
(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)
(Mr. A. M. R. B. Attanayake)

ඇයි එහෙම නම් එතුමා මට කිවේ ?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඒ මන්ත්‍රීතුමා එවැනි චෝදනාවක් කළා නම් එයත් වැරදියි. ඒ අවස්ථාවේදීම ඔබ තුමාට තිබුණා ඒ ගැන රීති ප්‍රශ්නයක් මතු කරන්න. [බාධා කිරීම්]

ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා
(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)
(Mr. A. M. R. B. Attanayake)

මගේ කොට්ඨාශයේ ආයතනවල මුර සේවාවන් හරියට ක්‍රියාත්මක වෙනවාදැයි බැලීම සඳහා රෑ 12 වන් කොට්ඨාශයේ සංචාරය කරන මන්ත්‍රීවරයෙක් මම. ඒ මන්ත්‍රීතුමාට බැහැ, හයෙන් පස්සේ එළියට බහින්න.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

නිකම් පිස්සු කථා කියන්න එපා.

ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා
(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)
(Mr. A. M. R. B. Attanayake)

තමුන්නාන්සේයි, පිස්සු කථා කියන්නේ.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

තමුන්නාන්සේ මිණීපේ කළ ඒවා කියනවා නම්, වෙලාවක.

ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා
(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)
(Mr. A. M. R. B. Attanayake)

කියන්නකො බලන්න. උඩුදුම්බර මන්ත්‍රීතුමා වාගේම ජනතාවත් පවිත්‍රයි. දුෂ්ට මති මතාන්තරවලින් උඩුදුම්බර අපවිත්‍ර කරන්න එපා.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

He is talking rubbish.

ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා
(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)
(Mr. A. M. R. B. Attanayake)

එය සිංහලයෙන් කියන්න.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

තමුන්නාන්සේ කථා කරන්නේ පිස්සු විකාර.

ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා
(திரு. ஏ. எம். ஆர். பி. அத்தநாயக்க)
(Mr. A. M. R. B. Attanayake)

තමුන්නාන්සේයි, පිස්සු විකාර කියවන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දැන් නවත්වන්න, දෙපැත්තම, [බාධා කිරීම්]

එම්. ඒ. අබ්දුල් මජීඩ් මහතා
(ஜனாப் எம். ஏ. அப்துல் மஜீத்)
(Mr. M. A. Abdul Majeed)

The hon. Member for Paddiruppu (Mr. P. Ganeshalingam) raised a question regarding the purchase of paddy by the agents of the Paddy Marketing Board, that is, the multi-purpose co-operative societies. On this question my Minister had a conference at the kachcheri at which I myself and hon. Members, including the hon. Member for Paddiruppu, were present. At this conference my

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. ඒ. අබ්දුල් මජීඩ් මහතා]

Minister made the Government Agent the co-ordinating officer, and we have relased all officers of our Ministry at the district level, from the field level staff to the staff officers, to go to the Land Commissioner's Department and the Agrarian Services Department. The Government Agent has been made the co-ordinating officer, and arrangements have also been made to ensure that all purchasing points of the multi-purpose co-operative societies, that is, the points at which they purchase from the farmers, are supervised daily by these officers and daily reports are sent to the Government Agent. I will take up this question with the Government Agent immediately.

The hon. Member also said that the Government Agent has reported that 50 purchasing points are not buying paddy direct from the farmers. It is a very serious allegation. The Government Agent is empowered to take immediate action at the field level. The multi-purpose co-operative societies come under the Hon. Minister of Food, and I will take this matter up with him and ensure that the multi-purpose co-operative societies function properly and buy the paddy from the farmers. At the conference my Minister told the Members of Parliament that if they were not satisfied with the purchasing points they could recommend to the Government Agent private individuals for appointment as agents. If you have given the names I will certainly attend to it tomorrow in my office.

The other matter raised by the hon. Member was that rice obtained by consumers from the Co-operatives is being sold by them to the rice millers. I do not think that the poor peasants who take their rice, at least the free ration, sell it because they need it for their consumption. In any case I will go into the matter, and if that has happened I will take remedial action.

**පී. ගනේෂලිංගම් මහතා**
*(திரு. பி. கணேசலிங்கம்)*
(Mr. P. Ganeshalingam)

The multi-purpose co-operative societies draw the rice and sell it to the middlemen. They do not distribute it through the branches because they have the right to sell to anyone. That rice gets back to the rice millers. The millers, instead of milling paddy and handing it over to the Food Control stores, buy this rice and hand it over to the Food Control stores.

**එම්. ඒ. අබ්දුල් මජීඩ් මහතා**
*(ஜனாப் எம். ஏ. அப்துல் மஜீத்)*
(Mr. M. A. Abdul Majeed)

When the consumer buys the rice he has to surrender his coupon.

**පී. ගනේෂලිංගම් මහතා**
*(திரு. பி. கணேசலிங்கம்)*
(Mr. P. Ganeshalingam)

This is off-ration rice.

**එම්. ඒ. අබ්දුල් මජීඩ් මහතා**
*(ஜனாப் எம். ஏ. அப்துல் மஜீத்)*
(Mr. M. A. Abdul Majeed)

I will take this matter up with the Minister of Food and ensure that the co-operative functions properly. It is really his function to ensure that.

Yesterday, I believe, the Member for Ratnapura raised a matter regarding the increase in the price of poultry feed. The position is this. The last revision of poultry feed prices had been done in 1974, and the prices maintained up to the present price revision are those fixed at that time. Since then the prices of raw materials have increased considerably. However, the Oils and Fats Corporation had been selling poultry feed at the original subsidized prices and as a result had been running at a heavy loss.

The proposal to raise the price of poultry feed was referred to the Cabinet, which in turn directed that this be taken up with the national Prices Commission. The National

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කල් තැබීම

Prices Commission agreed to this price increase from 4th April 1978. The new poultry feed prices just cover the cost of production. If these prices were not increased the Oils and Fats Corporation would have to be subsidized to the tune of Rs. 56 million per year.

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
(Mr. R. Premadasa)

ගරු කථානායකතුමනි, විශ්ව විද්‍යාල පිළිබඳව නැගූ ප්‍රශ්නය සම්බන්ධයෙන් මා කියන්න කැමතියි. මේ මුළු ප්‍රශ්නය ගැනම අපි සලකා බැලිය යුත්තේ පක්ෂයෙන් පක්ෂයට චෝදනා කිරීමේ විලාශයෙන් නොව, පොදු ජාතික ප්‍රශ්නයක් හැටියට සලකාගෙන බව. මේ අවස්ථාවේදී මෙම ගරු සභාවේත්, ගරු සභාව තුළින් මුළු රටේත් අවධානය යොමු කළ යුතු කාරණයක් තිබෙනවා. රටේ ඇතැම් කොටස් තුළ ඇතිවී තිබෙන නොදුමුණු වැඩ පිළිවෙල ගැන තමුන්නාන්සේගේ අවධානය යොමු කළ යුතුව තිබෙනවා. ඊයේ ගරු කථානායකතුමා මේ ගරු සභාවේ සියලුම පක්ෂ නායකයින් කැඳවා ඉතාමත් වැදගත් කාරණයක් කෙරෙහි අපගේ අවධානය යොමු කෙරෙව්වා. ගම්පහ ගරු මන්ත්‍රීතුමාත් (එස්. ඩී. බණ්ඩාරනායක මහතා) පක්ෂ නායකයින් සමග එම සාකච්ඡාවට සහභාගි වුණා.

ගරු කථානායකතුමනි, මේ රටේ සාමය ආරක්ෂා කිරීමේ වගකිම භාරව තිබෙන ආයතනය විසින් ඇතැම් දාමරික ක්‍රියා සම්බන්ධයෙන් තමුන්නාන්සේගේ අවධානය යොමු කරවා තිබෙන බව තමුන්නාන්සේ අපට කිව්වා. කොයි තරම් දුරට මේ තත්ත්වය පැතිර තිබෙනවාද කිව්වොත්, බෝතල් මූඩි වැනි සුළු දෙයකින් මනුෂ්‍යයෙක් නැත්නම් මිනිසුන් කීප දෙනෙක් විනාශ කර දැමීමේ විෂකර දේ පුදුම දක්ෂතාවයකින් නිෂ්පාදනය කර ඒ මගින් ජීවිත හානි කරන මහා භයානක දාමරික තත්ත්වයක් තිබෙන බව තමුන්නාන්සේ අපට කියා සිටියා. තමුන්නාන්සේ ඒ කාරණය එසේ සැල කළේ මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන්ගේ පමණක් නොව මේ ගරු සභාවේ රැස්වීම් බලන්නට එන පොදු මහජනතාවගේ ආරක්ෂාව ගැන කල්පනා කිරීමෙනුයි. ඒ වගේම රට තුළ මෙවැනි දාමරික තත්ත්වයක් ඇති වුණොත්, ජනතාවගේ ජීවිත ආරක්ෂාව කෙරෙහි අපගේ තිබෙන උනන්දුව ගැන කල්පනා කරන විට, මේ තත්ත්වය සුළු වෙන් තකන්න පුළුවන් දෙයක් නොවෙයි. මෑත කාලයේදී මොනතරම් භයානක අපරාධ සිදු වී තිබෙනවාද කියා තමුන්නාන්සේත් දන්නවා ඇති. මේ ගැන රජයේ අවධානය යොමුවී තිබෙනවා. මෙහි ඉතිහාසය ගැන අපි ටිකක් සොයා බලන්න ඕනෑ. මේක ත්‍රස්තවාදී වැඩපිළිවෙලක්ය කියා කිසිම දේශපාලන පක්ෂයකට චෝදනා කරන්න අපි කැමති නැහැ. මංකොල්ලකෑම්. මිනී මැරීම්, යාන වාහන නවත්වා මිනිසුන්ට අඩන්තේට්ටම් කිරීම ආදී දේවල් ත්‍රස්තවාදී වැඩය, ත්‍රස්තවාදී ව්‍යාපාරය නැවතත් පැන නැඟ තිබෙනවාය කියා සමහර අය කියනවා විය හැකියි. දේශපාලන වශයෙන් එවැනි චෝදනාවක් කිරීම සාධාරණය කියා මම නම් කල්පනා කරන්නෙ නැහැ. ඔය ඔක්කොම දාමරික වැඩ කරන්නේ ජනතා විමුක්ති පෙරමුණේ අයය කියා දේශපාලන වශයෙන් චෝදනා කිරීම සුදුසුය කියා මම නම් හිතන්නේ නැහැ. නමුත් අපි අමතක කරන්න නරකයි, මෙවැනි දාමරික කොටස් තම තමන්ගේ ප්‍රයෝජනය පිණිස මෙවැනි දේවල් කරන බව. මෙවැනි දේවල් පැන නැගීමට හේතුව මොකක්ද?

පසුගිය අවුරුදු 7 තුළ තත්ත්වය ගැන අපි සිතා බලමු. මම මේ උත්සාහ කරන්නේ පසුගිය ආණ්ඩුවට දේශපාලන වශයෙන් පහර ගැසීමක් කරන්නට නොවෙයි. නමුත් පියවරෙන් පියවරට මේ රටේ විනය, සාමය, නීතිය, රීතිය සම්පූර්ණයෙන්ම නැති වන ආකාරයට යම් යම් පියවරවල් ගෙන තිබෙන බව මට පෙන්වා දෙන්න පුළුවනි. මම මේ ගරු සභාවේ කාලය වැඩියෙන් මිඩංගු කරන්න කැමති නැහැ. Legislative Enactments of Ceylon. විශේෂයෙන්ම Penal Code ඒ වගේම Criminal Procedure Code වල—දණ්ඩ නීති සංග්‍රහයේ—තිබෙනවා මොන මොන අපරාධවලට ඇප දෙන්න පුළුවන්ද. මොන මොන අපරාධවලට ඇප නොදිය යුතුද,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ප්‍රේමදාස මහතා]

මොන මොන අපරාධවලට හිරේ යවන්න පුළුවන් ද, නැත්නම් බරපතල වැඩ ඇතිව හිරේ යවන්න පුළුවන් ද, නිදහස් කරන්න පුළුවන් ද, අවවාද කරන්න පුළුවන් ද කියා. ස්ත්‍රී දූෂණ, මිනී මැරුම්, මිනී මැරීමට තැත් කිරීම්, කුමන්ත්‍රණය කිරීම්, මංකොල්ල කෑම්, යම් යම් අයට හානි කිරීම් ආදී වැරදි ගැන එහි අපූරුවට දක්වා තිබෙනවා. හිටපු අධිකරණ ඇමතිතුමා අළුත්ම අධිකරණ පනත් ගෙනැවිත් ඇප නොදිය හැකි වැරදි වලට—non-bailable offences ඇප දිය හැකි තත්ත්වයක් ඇති කළ බව තමුන්නාන්සේ දන්නවා. අද කැබිනට් මණ්ඩලය තීරණය කළා, දරුණු අපරාධ කරන උදවියට උසාවිය මගින් නඩු විභාග කර ඒ නියමිත දඬුවම් දීමේ ක්‍රමයක් යළිත් ඇති කරන්නට. නැත්නම් සාමකාමී පුරවැසියන්ට මේ රටේ ජීවත් වෙන්නට බැරි වෙනවා. මේ ධාමරික කොටස් සෑම තැනම අර්බුදකාරී තත්ත්වයන් සොයනවා. අර්බුදකාරී තත්ත්වයන් තුළින් තමයි. ඒ ධාමරික වැඩ පිළිවෙල ගෙන යන්නේ. ශිෂ්‍යයන් කුපිත වී සිටිනවා නම් වෘත්තීය සමිති ව්‍යාපාර කුපිත වී සිටිනවා නම් ඒ දෙස මේ උදවිය බලා ගෙන ඉන්නවා. දේශපාලන පක්ෂවල මතභේදයක් ඇති වී ඒ ගැන හඬ නගන අවස්ථාවක් ආවොත් ඒ දෙස බලා ගෙන සිට ඒ අස්සට රිංගන මේ ධාමරික කොටස් එතැන යම් අපරාධයක් කළාම බොහෝ විට චෝදනාව එල්ල වන්නේ මුලින් අර ඝෝෂාව කළ අයටයි.

1971 අප්‍රේල් කැරැල්ල සම්බන්ධවත් මා එය කියනවා. දේශපාලන වශයෙන් යම්කිසි හැඟීමක් ඇතිව ජාතික විමුක්ති පෙරමුණ ඒ අයගේ දර්ශනය අනුව යම් පියවරවල් ගන්නා වෙන්නට ඇති. නමුත් ඒ තුළටත් රිංගා ගත් ඇතැම් කොටස් ඒ අවස්ථාවෙනුත් ප්‍රයෝජන ගත්තා. අර ජාතිභේද කෝලාහල ඇතිවුණේ 1958 දී නේද? ඒ අවස්ථාවේදී මා සියැසින්ම දුටු සිද්ධියක් මතක් කරන්නම්. ද්‍රවිඩ උදවියගේ කඩ සාප්පු කඩා දමමින් ද්‍රවිඩ උදවිය සිටින ප්‍රදේශවල සිංහල උදවියගේ ජීවිත හානි කරමින් විශාල කලබැගෑනියක් ඇති වූ ඒ අවස්ථාවේදී මා වෙල්ල වීදිය හරහා එමින් සිටියා. එක්තරා මනුෂ්‍යයෙක් ලොකු පිත්තල ලාම්පුවක් කරේ තියාගෙන "පර දෙමළු මරන්න ඕනෑ" ය කිය කියා එනවා මා දුටුවා. එය මා හොඳට දැක පුරුදු මුහුණක්. මා වාහනය නවත්වා ටිකක් කිට්ටු වී බැලුවාම මේ මා හඳුනන ආදුරුප්පු වීදියෙ රාසයිය නොවැ. "තමුසෙ කොහොමද දෙමළු මරන්නෙ. තමුසෙත් ඒ එක්කෙනෙක් නේද" කියා මා ඇසුවාම, "නැහැ, සර්, මේ දොරක් ඇරල තිබුණ, ඒ නිසා මම මේක අරගෙන යනව" කිව්වා. ඒ මනුෂ්‍යයා කළේ ජාතිභේදවාදී වැඩක් ද? ඒක ජාතිවාදී ප්‍රශ්නයක් නොවෙයි. ඒක මංකොල්ල කෑමක්. එම නිසා කුමන දේශපාලන පක්ෂයක් වුවත් මතක තබා ගතයුතු දෙයක් තිබෙනවා. දේශපාලන පක්ෂයක් වශයෙන් හෝ වේවා වෘත්තීය සමිති වශයෙන් හෝ වේවා අපි යම් වැඩ පිළිවෙළක් ආරම්භ කළොත් ඒ අස්සට රිංගන්නට මාන බලන පිරිසක් ඉන්නවා. අපි එදා නොයෙකුත් සත්‍යග්‍රහ ව්‍යාපාර ආරම්භ කළ අවස්ථාවේදීත් ඒ තත්ත්වය ඇතිවුණා.

අපේ ව්‍යාපාරය තුළට රිංගා ගත් ඒ උදවිය අප අතටම අසුවුණා. මේ ගෙන යන්නේ සාමකාමී අහිංසාවාදී ව්‍යාපාරයක් බව ඒ අයට පෙන්නුම් කරමින් අපි බොහොම ප්‍රවේසමෙන් ඒ අවස්ථාවේදී ක්‍රියා කළා. අවස්ථාවෙන් ප්‍රයෝජනය ගෙන ඒ සමහරු කඩ සාප්පු කඩා මුදල් හම්බ කරන්නට උත්සාහ කළා. බොරුවට අපට හිතවත් බව පෙන්වමින් අපේ පාට ඇඳගෙන මත්පැන් බී වෙරිමතින්, "ඔහොම නොවෙයි. මෙහෙම කරන්නට ඕනෑ, අරහෙම කරන්නට ඕනෑ" ආදී වශයෙන් ඉදිරිපත් වූ කී දෙනෙකු අප සමග නොමනාප වී ඉවත්ව ගියාද? මා මෙම කාරණය කියන්නේ සියළුම දේශපාලන පක්ෂ වලටයි. කවුරුත් එය මතක තබා ගන්නට ඕනෑ. පසුගිය දිනවල පාසැල් පවා වසා දමන්නට අපට සිද්ධ වුණා. ඇත්ත වශයෙන්ම රටේ මහජන මතයක් ඇති කරන්නට ඕනෑ කරන කාරණයක් ගැන රැස්වීම් පවත්වා විවේචනා කර ඊට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරන ව්‍යාපාර ගෙන යාම වරදක් නැහැ. එය ජනසම්මත වාදය තුළ තිබෙන්න ඕනෑ. එවැනි විවේචන අවශ්‍යයි. නමුත් ඔය අස්සට කොටසක් රිංගනවා තමන්ගේ ධාමරික අදහස් උදහස් මුදුන් පමුණුවා ගන්නට. නොබෝදා ලැබුණු තොරතුරු අනුව අපට දැනගන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නට ලැබුණා, ශිෂ්‍යයින්ගේ යම් අසහනකාරී කාරණයක් උද්ගත වූ අවස්ථාවකදී ඔවුන් කුපිත කර, ඔවුන් පාරට බස්සා, ඊට පස්සේ ඒ ඔවුන් කුපිත කරවූ උදවියම අර ශිෂ්‍යයන්ට ගල් පහරක් ගසා ඒ ශිෂ්‍යයන් කලබල වූ විට පොලිසිය තුවක්කු ගෙනැවිත් වෙඩි තිබ්බම අන්න අර මරණය උඩින් වෙනත් ක්‍රමයකින් ලබාගන්නට බැරි වාසියක් දිනා ගැනීමේ ව්‍යාපාරයක් තිබුණ බව. අපි එදා එවෙලේම මොකක්ද කළේ? දින කීපයක් පාසල් වසා තැබුවා. එවැනි පිළියම් අවස්ථානුකූලව අපි යෙදුවා.

විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් ගැනත්, තරුණ පරපුර ගැනත්, අපේ රජය තුළ තිබෙන්නේ පසුගිය රජය තුළ තිබුණ ආකල්පය නොවන බව මම අවධාරණයෙන් ප්‍රකාශ කරනවා. අපි ශිෂ්‍යයන් ගැනත්, තරුණයන් ගැනත් විශේෂ විශ්වාසයක් ඇති පිරිසක්. අපට ඕනෑ කරනවා, ඔවුන්ගේ අදහස්, ඔවුන්ගේ මත, ඔවුන්ගේ විවේචන. ඔවුන් තමයි, අනාගතයේ මේ රටේ නායකත්වයට පත් වන්නට සිටින්නෙ. අපි ලෑස්තියි, ඔවුන්ට සෑම රැකුලක්ම දෙන්න. නමුත් ඔවුන්ගේ යම් යම් අසහනයන් නිසා, මම කලින් සඳහන් කළා වාගේ, යම් යම් දාමරික පිරිස් එයින් ප්‍රයෝජන ලබා ගන්නට යන බව අපට පෙනී ගියොත් අපට සිද්ධ වෙනවා. ඒ සඳහා ගතයුතු පියවරවල් ගන්න.

විශ්ව විද්‍යාල සම්බන්ධයෙන් එහෙම වුණොත් මම තමුන්නාන්සේට ප්‍රකාශ කරන්න කැමතියි, අකමැත්තෙන් වුනත් විශ්ව විද්‍යාල වහලා ඒ සඳහා යම් යම් පිළියම් කරන්න සිද්ධ වන බව. ඒ අනුව ගත යුතු පියවරක් තමයි අපි ගත්තේ, උසස් අධ්‍යාපනය සඳහා වෙනම අමාත්‍යාංශයක් පිහිටුවීමෙන්. ඒ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් හැටියට, අධ්‍යාපන ඇමතිතුමා යටතේම ආචාර්ය ස්ටැන්ලි කල්පගේ මහතා පත් කර තිබෙනවා. තරුණ පරපුර ගැනත් උසස් අධ්‍යාපනය ගැනත් අපේ තිබෙන සැලකිල්ල, වුවමනාව තමුන්නාන්සේලාට එයින් පෙනෙනවා ඇති. අපට ඔවුන්ගේ අදහස් උදහස් දැනගැනීම අවශ්‍යයි. යම් අසාධාරණයක් අයුත්තක් වී තිබෙනවා නම් ඊට සාධාරණත්වය ලබා දී ක්‍රියා කරන්නට අපට පුළුවනි. නමුත් අපි ලෑස්ති නැහැ, ඔවුන්ගේ කර පිටින් මේ රටේ කලබැගෑනි ඇති වෙනවා දකින්නට; මේ රටේ කලබැගෑනි ඇති කරනවා දකින්නට. මම ඒ පොරොන්දුව දෙන්න කැමතියි. හිතන්න එපා අපි ඔවුන් හතුරන් හැටියට සලකනවාය කියා. නැහැ. අපේ තරුණ පරම් පරාව අපට තිබෙන උතුම් වස්තුවක්. අපි ඒ අය ආරක්ෂා කරන්න ඕනෑ. අපි කල්පනා කරන්නේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශෙෂ වෙනසක් ඇති කරන්නයි. රට පුරාම උසස් අධ්‍යාපනයට පහසුකම් ඇති කරන්නට අපි බලාපොරොත්තු වෙනවා. ගෙදර සිට අවුත් විශේෂඥ අධ්‍යාපනය ඔවුන්ට ලබාගන්නට පුළුවන් ක්‍රමයක් ඇති කරන්නයි, අපි බලාපොරොත්තු වෙන්නෙ. හරියට මේ බැරැක්ක වාගේ ඒවා වලට වැටී රටත් ගමත් අතර තිබූ සම්බන්ධය හා ආකල්පය වෙනස් කරගෙන, වෙනම ලෝකයක ජීවත් වෙන විදියේ වගකීමෙන් තොර හැඟීම් ඔවුන් තුළින් ඉවත් කරන්න ඕනෑ. අපේ රටේ ශිෂ්‍යයන් වේවා, කම්කරුවන් වේවා, සෑම කොටස්ම නිරන්තරයෙන් සමාජයත් සමග අපි සම්බන්ධ වී ඇදී බැඳී ජීවත් වෙනවාය කියන හැඟීම ඔවුන් තුළ ඇති කරන්න ඕනෑ.

විශේෂයෙන්ම මේ කාරණය ගැන ගම්පහ ගරු මන්ත්‍රීතුමාත් (එස්. ඩී බණ්ඩාරනායක මහතා) කථා කළා. පොදු හැඟීමකින් යුක්තවයි, එතුමා කථා කෙළේ. ඒ මොකද? එතුමා එයින් බැට කාලා තිබෙන එක්කෙනෙක්. එතුමා දන්නවා, මොන කරුණක් නිසාද කියා, එතුමාට සිද්ධ වුණේ පසු ගිය රජය කාලයේ හිරේ විලංගුවේ වැටී ඉන්න. සී. ජේ. සී. උසාවියේ නඩු විභාගය බලන්න මමත් ගියා. ඔය අද එතුමාට හිතවත්කම් පාන කවුරුවත් එදා ඇවිත් සිටියේ නැහැ. එතුමා එය දන්නවා. ඒ කාලෙ ඉඳලමයි, අපි මේ ගැන සැලකිල්ලක් දැක්වූයේ. 1971 අප්‍රේල් කැරල්ලේ තේරුම මොකක්ද කියා අවබෝධ කර ගන්නට අපි හොඳටම උත්සාහ කළ කණ්ඩායමක්. මේ සභාවේ ඔවුන් වෙනුවෙන් අපි කථා කළා. හිතන්න එපා අපි ඒ උත්සාහය අත්හැර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙනවාය කියා, බලයට අ වා පස්සෙ. අපි විරුද්ධ පක්ෂයේ සිටින විට තිබුණ ආකල්පයමයි, මේ ගැන දැනුත් අප තුළ තිබෙන්නෙ. එය මේ රටේ සමාජ අසාධාරණයට විරුද්ධව ඇති වුණු වැඩ පිළිවෙලක් බව අපි පිළිගන්නවා. ඔවුන්ට ත්‍රස්තවාදීන්ය දූමරිකයන්ය කියා පැත්තකට කර කොන්කර තිබෙනවා. එහෙම පැත්තකට කරන්න කාරියක් නැහැ. එනිසයි, අපි ඔවුන් සියලුදෙනාවම නිදහස් කළේ. මා දන්නවා ඔවුන්ගෙන්, අතැම් උදවිය නැවතත් අවි ආයුධ අතට ගන්නට කල්පනා කළ බව. ජන සම්මතවාදීව කරුණු ඉදිරිපත් කරන්න ඔවුන්ට නිදහස ලැබෙන්නේ නැතිනම්, ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කරන්න ඔවුන්ට අවස්ථාවක් ලැබෙන්නේ නැතිනම් ඔවුන් වෙන මොනවා කරන්නද? ඔවුන් අද පෙරමුණට ඇවිල්ලා සිටිනවා. රැස්වීම් පවත්වනවා. නමුත් අපෙන් කිසිම බාධාවක් නැහැ. ඔවුන් සාමාජිකයින් බඳවා ගන්නවා; පන්ති පවත්වනවා; අපෙන් කිසිම බාධාවක් නැහැ. අපි පොලීසියට කියා තිබෙනවා දාමරිකකම් නොකරනවා නම්, සාමයට විරුද්ධව කැරලි ගැසීමට සූදානම් නැති නම්, ඔවුන්ගේ බලාපොරොත්තුව සාධාරණ මහජන මතයක් ඇති කරන්නට නම් ඔවුන්ටත් අනිකුත් සෑම පුරවැසියකුටම තිබෙන නිදහස තිබෙන්නට ඕනෑ බව. අපට වාර්තා ලැබෙනවා, ඔවුන් සාමාජිකයන් බඳවා ගැනීම් සම්බන්ධයෙන් හා ඔවුන් පවත්වන රැස්වීම් සම්බන්ධයෙන්. නමුත් ඒවා ගැන අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. ජන සම්මතවාදී රටක එහෙම ඒවාට ඉඩ තිබෙන්නට ඕනෑ. ඒවා නැතිකරලා, ඒවා පාග දමල රටක් පාලනය කරන්නට බැහැ. ජන සම්මතවාදය තුළින් කොයි පක්ෂයටත් අපි ඒ අවස්ථාව සලසා දෙනවා.

අපි පෙළපාළි යාම් තහනම් කළේ වෙන දෙයක් නිසා නොවෙයි, එයින් පොදු දේපොළවලට, පොදු ජන ජීවිතයට, පොදු ජනතාවගේ හැදියාවට සිදු වන අපරාධය නිසයි. මා කලිනුත් මේ කාරණය කී බව ගරු කථානායකතුමනි, තමුන්නාන්සේ දන්නවා. මා තවත් එක් දෙයක් මේ ගරු සභාවට මතක් කරන්නට ඕනෑ. එනම්, අපි විරුද්ධ පක්ෂයේ සිටියදී එක ආකල්පයකුත්, ආණ්ඩු පක්ෂයේ සිටිද්දී තවත් ආකල්පයකුත් වශයෙන් ආකල්ප දෙකකින් ක්‍රියා නොකරන බව. අපි යෞවන ප්‍රශ්න දිහා බලන්නෙ එදා විරුද්ධ පක්ෂයේ සිටියදී බැලූ ආකල්පයෙන්මයි. ඔවුන්ට අප ඉඩ දී තිබෙනවා ඔවුන්ගේ නව ආකල්ප අනුව සංවිධානය වී වැඩ කරගෙන යන්න. නමුත් අපි රටේ විනය ගැනත් කල්පනා කරන්න ඕනෑ. විශ්ව විද්‍යාලවල, පාසල්වල විනය ගැනත් කල්පනා කරන්න ඕනෑ. පොදු ජන ආරක්ෂාව ගැන බැලීම රජයේ විශේෂ යුතුකමක්. නුවරඑළිය-මස්කෙලිය දෙවන ගරු මන්ත්‍රීතුමා (අනුර බණ්ඩාරනායක මහතා) ප්‍රකාශ කළා සමහර වාහනවලින් යම් යම් දාමරික කොටස් යම් යම් තැන්වලට ගෙන ගියාය කියා. එතුමා සමහර වාහන ගැන සඳහන් කළා. මා කැමතියි ඒ කී තොරතුරු ගැන පොලීසියට දන්වීමට. ඒ තොරතුරු ගැන සොයා බැලීමට අපි ලෑස්තියි. නමුත් එතුමා එයින් දේශපාලන ප්‍රයෝජනයකුත් ගන්නට උත්සාහ කළා, "සිරිකොත" මන්දිරයෙන් මේ දාමරිකයින් එක එක තැන්වලට ගෙන ගියාය කීමෙන්.

**අනුර බණ්ඩාරනායක මහතා**
*(திரு. அனுர பண்டாரநாயக்க)*
(Mr. Anura Bandaranaike)

මා කියා සිටියේ විශේෂයෙන්ම ශිෂ්‍යයින් වාහනවලින් සිරිකොත මන්දිරයට ගෙන ගියාය කියායි. මා සිරිකොතෙන් දූමරිකයින් ගෙන ගියාය කිව්වේ නැහැ.

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
(Mr. R. Premadasa)

කවදාවත් අපි එහෙම ඒවා කළේ නැහැ. අපේ පක්ෂය ත්‍රස්තවාදී වැඩ පිළිවෙළකට, දූරිකා වැඩ පිළිවෙළකට රුකුල් දෙන පක්ෂයක් නම් බලයට එන්න 1977 වන තුරු ඉන්න වුවමනා නැහැ. 1971 දීම තිබුණා, අපට බලයට එන්න. මම මේ මන්ත්‍රීතුමාගේ මෑණියන්ටම කිව්වා ඔබතුමියගේ ජීවිතය ආරක්ෂා වුණේ යූ. එන්. පී. එකේ කොල්ලෙක් නිසාය කියා. කම්කරු තරුණයෙක්. ඔහු ගෙනත් දුන් ඔත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කල් තැබීම

තුව උඩයි, එතුමිය බේරුණේ. මා කියන්නේ ගම්පහ මන්ත්‍රීතුමා (එස්. ඩී. බණ්ඩාර නායක මහතා) වාගේ කරුණු ඉදිරිපත් කරනවා නම්, එය ප්‍රයෝජනවත් වෙන බවයි. මේ අවස්ථාවේදී මා සූදානම් නැහැ, වෙනත් දේශපාලන පක්ෂයකට පහරක් ගහන්න. නමුත් මා මේ අවස්ථාව ප්‍රයෝජනයට ගන්න කැමතියි, කොයි දේශ පාලන පක්ෂයක වුවත් පොදු විනය ගැන විශේෂ සැලකිල්ලක් ඇති කරන්න.

අපේ පක්ෂයේ නායකතුමා, ජනාධිපතිතුමා විපක්ෂයේ නායකයාව සිටියදී ඇතැම් සාමාජිකයින් යම් යම් වැරදි ක්‍රියා කර අසුවුණාම ඔවුන් පන්නා හැර තිබෙනවා. ඒ සමහර උදවිය තමුන්නාන්සේලා වැළඳ ගත්තා. මා ඒ උදවියගේ නම් කියන්න කැමති නැහැ. තමුන්නාන්සේගේම මැණියන් මෙතැන ඉඳගෙන ඩඩ්ලි සේනානායක මහතාට චෝදනා කළා, කෝට්වේ එක්තරා පුද්ගලයෙක් තමුන්නාන්සේ තබාගෙන ඉන්නවා; මහා භයානක දාමරිකයෙක් ඇයි තබාගෙන ඉන්නේ කියා. ඩඩ්ලි සේනානායක මහතා ඒ අවස්ථාවේ දී කිව්වා, මා දන්නා තරමින් නම් එයා එහෙම නොවෙයි කියා. අන්තිමට මොකද වුණේ? අන්න මිනිහත් එක්ක එකට වේදිකාවේ. ඒකයි මම කියන්නෙ.

**අනුර බණ්ඩාරනායක මහතා**
*(திரு. அனுர பண்டாரநாயக்க)*
(Mr. Anura Bandaranaike)

ඩඩ්ලි සේනානායක මහත්මයා කිව්ව ඒවා විශ්වාස කරලයි ගත්තෙ.

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
(Mr. R. Pemadasa)

වැඩේ වෙලා තියෙන්නෙ, මස්කෙළියේ ගරු දෙවෙනි මන්ත්‍රීතුමන්ලා විශ්වාස කරන්නෙ මළවුන් විතරයි. ඩඩ්ලි සේනානායක මහත්මයා ජීවත්ව සිටියදී කිව්ව ඒවා විශ්වාස කළේ නැහැ.

They always worship and believe the dead. The living they hate and abuse. You will remember the abuse they hurled at Mr. Dudley Senanayake. They now say they believed Mr. Dudley Senanayake's word. But on the day the Vote of Condolence was moved on the death of Mr. Dudley Senanayake, none of them got up and said a single good word about him.

ඩඩ්ලි සේනානායක මහත්මයාගේ වචනය භාර ගත්තලු. ඒ ආණ්ඩුව ලජ්ජ වෙන්න ඕන. එතුමාගේ අභාවය පිළිබඳව ඒ පක්ෂයේ එක නායකයෙක්වත් නැගිට කථා කළේ නැහැ. නියෝජ්‍ය ඇමතිවරයෙක් කථා කළා, මින්නේරියෙන්. මොකක්ද ඔහු කළ කථාව කියා, හැන්සාඩ් වාර්තාව කියවා බලන්න. මම කියනවා, මැරුණාට පසුවටත් උන්නැහේට තමුන්නාන්සේලා සැලකුවෙ නැහැ කියා. ඒ කථාව කියවා බැලුවාම ඒක පැහැදිලි වෙනවා. දේශ පාලන වාසියට පමණක් නිකම් තර්ක ඉදිරි පත් කරල වැඩක් නැහැ. එහෙම තර්ක කරනවා නම් ඒ වගේ දහයක් අනික් අයටත් කියන්න පුළුවන්. මම පුද්ගලයාගේ නම සඳහන් කරන්නෙ නැහැ. එදා ඒ අගමැතිනිය මෙතැන සිට කිව්ව එකවත් මම පිළිගත්තෙ නැහැ. මම ඒක අදත් පිළිගන්නෙ නැහැ. ඒ පුද්ගලයා ඒ කිව්ව තරම් දුර්වල පුද්ගලයෙක් නොවෙයි. කාගෙත් දුර්වලකම් තිබෙනවා, මා නැහැ කියන්නෙ නැහැ. දේශපාලන වාසිය තකා මේවා වෙනස් කරන්නෙ ඇයි?

සූරියප්පෙරුම මහත්මයා තමුන්නාන්සේ ගැනත් මැණියන් ගැනත් කිව්ව දේවල් මම කියන්න ඕනෑද? අද මොන වද කියන්නෙ?

**අනුර බණ්ඩාරනායක මහතා**
*(திரு. அனுர பண்டாரநாயக்க)*
(Mr. Anura Bandaranaike)

එහෙම නම් රොනී ද මැල් මහත්මයා ජනාධිපතිතුමා ගැන කිව්ව දේවල් කොහොමද?

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
(Mr. R. Premadasa)

උන්නැහේ සමාව ගත්තා.

**අනුර බණ්ඩාරනායක මහතා**
*(திரு. அனுர பண்டாரநாயக்க)*
(Mr. Anura Bandaranaike)

සූරියප්පෙරුම මහත්මයාත් සමාව අර ගෙනයි ආවෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
(Mr. R. Premadasa)

එහෙම නම් වලව්වට ගිහින් සමාව ගන්න ඇත්තෙ.

මස්කෙළියේ දෙවෙනි ගරු මන්ත්‍රීතුමා උඩුදුම්බර ගරු මන්ත්‍රීතුමාට (ඒ. එම්. ආර්. බී. අත්තනායක මහතා) දැන් මෙතැනදී කිව්වෙ මොකක්ද? උඩුදුම්බර මන්ත්‍රීතුමාට දාවල් කාලයේ ඡන්ද කොට්ඨාශයට යන්න බැරිය කිව්වා. දැන් ඡන්දයක් තිබ්බොත් උන්නැහේගේ ඇපයත් නැති වෙනවා ය කිව්වා. බටහිර කොළඹ අතුරු මැතිවරණ කාලයේදී ගිහින් කිව්වෙ මොකක්ද? මේ තරම් ඉක්මණින් අප්‍රසාදයට පත් වුණු ආණ්ඩුවක් ලෝකයේ තවත් නැහැයි කිව්වා. බටහිර කොළඹට මොකද වුණේ? එතුමන්ලාගේ පක්ෂයේ අපේක්ෂකයා ඡන්ද හත්සිය ගණනක් අඩුවෙන් ගත්තෙ, මහා මැතිවරණයට වඩා.

**අනුර බණ්ඩාරනායක මහතා**
*(திரு. அநுர பண்டாரநாயக்க)*
(Mr. Anura Bandaranaike)

තමුන්නාන්සේලාට 7,800 ක් අඩු වුණා.

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
(Mr. R. Premadasa)

ගණන් හදන්න ඕනෑ නම් ලියා ගන්න.

ගරු කථානායකතුමනි, 1077 ජූලි මහා මැතිවරණයේදී ලංකාවේ වෙනත් ආසන වලට වඩා අඩුවෙන් තමයි බටහිර කොළඹ ආසනයේ ඡන්දදායකයන් ඡන්දය පාවිච්චි කෙළේ. අනික් ප්‍රදේශවල සියයට 87 ක් විතර පැමිණෙන විට එතැන ආවේ හැත්තෑවකුත් දශම ගණනයි. මේ ඡන්ද විමසීම කළේ 1975 ලැයිස්තුව අනුවයි. දැන් 1978 වර්ෂයේයි අතුරු මැතිවරණය පැවැත්වුණේ. මැතකදී ඇති වුණු ජාතිවාදී කලබල වලින් පසුව ජනතාව හුඟක් එහා මෙහා වුණා. මේක අතුරු මැතිවරණයක් නිසා හුඟ දෙනෙක් ඡන්ද පාවිච්චි කරන්න ගියේ නැහැ. ඒ නිසා ඡන්ද පාවිච්චි කළ සංඛ්‍යාව අඩු වූ බව පිළිගන්නට සිදු වෙනවා. අතුරු මැතිවරණයේදී ඡන්දය පාවිච්චි කළ අයගේ සංඛ්‍යාව ජූලි මාසයේ ඡන්ද පාවිච්චි කළ සංඛ්‍යාවට වඩා 5,000 කින් අඩු වුණා. ඒ අනුව බලන විට මුළු ඡන්ද ලැයිස්තුවේ ඇතුළත් සංඛ්‍යාවෙන් 18,000 ක් මෙවර ඡන්දය පාවිච්චි කිරීමට ආවෙ නැහැ. ඒ වගේම මෙවර ඡන්දය සඳහා ඉදිරිපත් වුණේ ආධුනිකයෙක්. තරුණයෙක්. ජීවිතයේ ප්‍රථමවරටයි තරඟයට ආවේ, මේ අනුර බැස්ටියන් මහත්මයා. එතකොට ඒ අනුර මේ මස්කෙළියේ දෙවැනි ගරු මන්ත්‍රීතුමා (අනුර බණ්ඩාරනායක මහතා) තරම්වත් අඳුනන කෙනෙක් නොවෙයි. ඔහු ප්‍රථම වතාවටයි, ඉදිරිපත් වුණේ. ඒ ආසනය කලින් තරඟ කෙළේ මේ රටේ ජනාධිපති වන්නට වරම් ලැබූ ජන නායකයෙක්. එහෙම නම් ඡන්ද ගණන 5,000 කින් අඩු වීම පුදුමයක් නොවෙයි. එහෙත් 14,000 කට කිට්ටු වන්නට ඡන්ද ගත්තා. මුලින් ගත් ඡන්ද ගණන 21,000 යි. නලින් ගුණරත්න මහතා තරඟයට ඉදිරිපත් වුණේ එක්සත් ජාතික පක්ෂයට විරුද්ධව නොවෙයි. කොළපාට ගසාගෙන "පක්ෂයට සලකනවා, නායකතුමාට ගරු කරනවා, මාව දැම්මෙ නැති එක විතරයි අඩුව" කියමින් තමයි, ඔහු ඇවිද්දේ. ඔහු ඡන්ද 2,400 ක් ගත්තා. ඒ 2,400න් 400 ක් ඔහුගේ පෞද්ගලික ඡන්ද විය හැකියි. අනික් ඒවා යූ. එන්. පී. ඡන්දයි. එතකොට 13,000 ගණනට ඒ 2,000 ත් එකතු වුණාම 15,000 ගණනක් වෙනවා. ඔය ඡන්ද 2,400 මස්කෙළිය ගරු මන්ත්‍රීතුමාලාගේ පැත්තට යනවා යයි එතුමා හිතනවාද? ඉතින් ඔය විධියට ගණන් හදලා බලන කොට ඔය තත්ත්වයයි, පෙනෙන්නේ.

මෙතැන තිබෙන ප්‍රශ්නය මේක නොවෙයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උදවියට කිසිම ඉවසිල්ලක් නැහැ. ඕනෑම අවස්ථාවකින් ප්‍රයෝජන ගන්නට ඒ අය ලෑස්තියි. 1971 අප්‍රේල් කැරල්ල පැවති අවස්ථාවේදී අපටත් ඔය විධියට ප්‍රයෝජන ගන්නට තිබුණා. එහෙත් අපි ඒක කෙළේ නැහැ. ඒ කැරල්ලට අපි උදව් කළා නම් ඇති වන තත්ත්වය තමුන්නාන්සේ දන්නවා. අපි ඒකට උදව් කෙළේ නැහැ. ඒ විතරක් නොවෙයි, මෙම ගරු සභාවට අවුත් එදා ආණ්ඩුව ඉදිරි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පත් කළ හදිසි අණපනත්වලට අපේ ඡන්දයත් දුන්නා. ආණ්ඩුවට අපි උදව් කළා. ඒ මිස අපි කැරැල්ලට උදව් කෙළේ නැහැ. කැරැල්ලට උදව් නොකර අපි ආණ්ඩුවට උදව් කළත් ගුවන් විදුලිය පාවිච්චි කරමින් අපට දොස් කිව්වා ; චෝදනා කළා. ආණ්ඩුවේ ඇමතිවරුන් අපට චෝදනා කළා. "ඩඩ්ලිගේ ආසනයෙන් මේක පටන් ගත්තා" යයි කිව්වා. ඔය මොනවා කිව්වත් අපි ඉවසුවා. ජන සම්මතවාදී පක්ෂයක් හැටියට අපි පියවරෙන් පියවර ක්‍රියා කරගෙන ගියා. එහෙත් අපට අද කනගාටු හිතෙන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉවසිල්ලක් නැති එක ගැනයි. අප දන්නා තොරතුරු අනුව කල්පනා කොට ක්‍රියා නොකළා නම් සාමය ආරක්ෂා කිරීමට ක්‍රියා නොකළා නම්, මේ වකවානුව තුළ, එදා වීරසූරිය ශිෂ්‍යයාට සිදු වූ දේ දහ දොළොස් දෙනකුට සිදු වන්නට ඉඩ තිබුණා. ඒ විධියට මළ කඳන් දැකීමට අප කැමති නැහැ. අප ලෑස්ති නැහැ, ඒක කරන්න. අපට මනුෂ්‍ය ජීවිත වටිනවා. අපි මනුෂ්‍ය ජීවිත ඉතා අගේ කොට සලකනවා. දේශපාලන වශයෙන් තමුන්නාන්සේලාගෙන් පොඩ්ඩක් බැණුම් ඇහුවාට අපට කමක් නැහැ. ජීවිත කීපයක් ආරක්ෂා කරන්නට පුළුවන් නම් අප මොන ආකාරයකින් හෝ ඒක කරනවා. ශිෂ්‍ය පරපුර කෙරෙහි තරුණ පරපුර කෙරෙහි විශ්වාසයක් නැතිව අපහාසයට ලක් කරන්නවත් අප ලෑස්ති නැහැ. මේ රටේ ජන සම්මතවාදී ප්‍රතිපත්ති අනුව ක්‍රියා කරන්නට ඔවුන්ට අයිතියක් තිබෙනවා. ඒ අතරම ඔවුන්ගේ හැදියාව ඔවුන්ගේ විනය අපට වුවමනා කරනවා. අප ඒ සඳහා පියවරවල් ගන්නවා. කිසිම දාමරික වැඩ පිළිවෙළකට උදව් කරන්නට අප ලෑස්ති නැති බව මෙම ගරු සභාවට මම කියනවා. කවුරුන් කළත්, මොන පක්ෂයකින් කළත් අපට ඒකට ඉඩ දෙන්නට බැහැ. මැතිවරණ කාලයේදීත් අප කිව්වේ ඒකයි.

මැතිවරණයෙන් පසුව කලබල ඇති වුණු බව තමුන්නාන්සේ දන්නවා. ඔය තරමින් ගියා ඇති. මැතිවරණ කාලයේ තමුන්නාන්සේගේ ආසනයේත්, අනික් ආසනවලත් ජනාධිපතිතුමාත්, මාත් අපේ කථාවල් අවසාන කෙළේ කොහොමදැයි තමුන්නාන්සේ දන්නවා ඇති. "මේ මැතිවරණයෙන් අපි දිනනවා. දිනූ දාට පසුවදා 1970 දී කළාක් මෙන් අපේ දේශපාලන විරුද්ධවාදීන්ගෙන් පලිගන්නට ක්‍රියා කරන්නට එපා" යනුවෙන් අපි කිව්වා. සමහරුන් ඊට විරුද්ධව යන්නට ඇති. ඒක වෙනම දෙයක්. එහෙත් අපි වේදිකාවක් වේදිකාවක් ගානේ ඒක කිව්වා. දැන් අපේ ව්‍යාපාර කඩාකප්පල් වන කොට "තමුසෙලා ඩිර්ම්ජ්ඨ වැඩියි" යනුවෙන් දැන් සමහරුන් අපට චෝදනා කරනවා. යුගයෙන් යුගය පාඩම් ඉගෙන ගෙන ඉදිරියට ගමන් කරන්නට අපට යුතුකමක් තිබෙනවා. කවුරුන්වත් කළාය කියා අපත් ඒකම කරන්නට වුවමනාවක් නැහැ. එහෙත් ඒක අපේ දුර්වලකමක් හැටියට භාර ගන්නට නරකයි. "කපුටන්ට අපේ ඔළුවට උඩින් පියාසර කරන්නට දෙනවා ; නමුත් ඔළුවේ කූඩු හදන්නට නම් ඉඩ දෙන්නේ නෑ" යනුවෙන් මා කියන්නේ ඒකයි. ඔව්, අපි ඒකට ඉඩ දෙන්නේ නැහැ.

අද සමහර දෙපාර්තමේන්තුවල කටයුතු කෙරෙන හැටි තමුන්නාන්සේ දන්නවා. මේ ගැන තමුන්නාන්සේට පැමිණිලි කරන්නටත් සිදු වී තිබෙනවා. හිටපු උදවියටම වැඩ කරගෙන යන්නට අප

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ප්‍රේමදාස මහතා]

ඉඩ හැරිය. ඔවුන් වැඩ කරන බව මුල් කාලයෙ පෙන්නුවා. එහෙත් වැඩ කරන්නේ නැහැ. සමහර දේවල් ක්‍රියාත්මක වන්නේ නැහැ. නුවරඑළියට ගිය වේලාවේදීත්, අනුරාධපුරයට ගිය වේලාවේදීත් මම ඒක දැක්කා. මේක අපේ දුර්වල කමක් හැටියට භාරගෙන තිබෙනවා. එයට ඉඩ දෙන්නට බැහැ. මේ ගරු සභාවේ සියලුම මන්ත්‍රීවරුන් මොන පක්ෂයකට අයිති වුනත් තමුන්නාන්සේලාගේ උනන්දුව තිබෙන්නට ඕනෑ පොදු දියුණුව සම්බන්ධවයි. අපට ඕනෑ කරන්නේ එයයි. විශේෂයෙන්ම විනය. අප සියලු දෙනාම මතක තබා ගන්නට ඕනෑ මොන පක්ෂයකට අයිතිව සිටියත් දාමරික වැඩ කටයුතු සම්බන්ධයෙන් කිසි විධියකින් උදව් උපකාර කරන්න නරකයි කියා. සමහරවිට කල්පනා කරන්න පුළුවන් මරණයක් දෙකක් ඇති කරගෙන ඒ මළ කඳන් උඩින් බලයට එන්නට පුළුවන්ය කියා. මා හිතන්නේ නැහැ, එය සාධාරණ එකක්ය කියා.

මා මුලින්ම කියාගෙන ආවා, මේ රටේ විනය පරිහානිය ඇති වන්නට මේ සභාව මඟින් සමහර නීතිරීති නැති කිරීම සම්බන්ධව. තමුන්නාන්සේලා ඇයි අද සාතන් උන්නැහේට වේදිකාවට එන්න නොදෙන්නේ? ෆීලික්ස් ඩයස් හිටපු මුදල් හා අධිකරණ ඇමතිතුමාට බටහිර කොළඹට නොමිනේෂන් නොදුන්නේ ඇයි? ඉල්ලුවේ නැද්ද?

**අනුර බණ්ඩාරනායක මහතා**
*(திரு. அனுர பண்டாரநாயக்க)*
**(Mr. Anura Bandaranaike)**
නැහැ.

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
(Mr. R. Premadasa)
ඇයි නැත්තේ?

**අනුර බණ්ඩාරනායක මහතා**
*(திரு. அனுர பண்டாரநாயக்க)*
(Mr. Anura Bandaranaike)
තමුන්නාන්සේ දන්නේ කොහොමද? අපේ නොමිනේෂන් ගැන?

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
(Mr. R. Premadasa)
It is a well known thing. Did he not seek nomination in July.

**අනුර බණ්ඩාරනායක මහතා**
*(திரு. அனுர பண்டாரநாயக்க)*
(Mr. Anura Bandaranaike)
No.

**ආර්. ප්‍රේමදාස මහතා**
*(திரு. ஆர். பிரேமதாச)*
(Mr. R. Premadasa)
He wanted to come to Colombo West.

මේ පාරත් එන්නයි හිටියේ. ඇයි එන්න නොදුන්නේ? දැන් මෙතුමා වේදිකාවක් ගානේ ගොස් කියනවා "අපේ පක්ෂයේ වැරදි වැඩ කළ එක්කෙනෙක්වත් අපි ගන්නේ නැහැ" කියා. බොහොම හොඳයි. එක්කෙනෙක් නේද ෆීලික්ස්?

Let him answer that question. Felix thinks you are the villain of the piece.

ඉලංගරත්නට එන්නට දෙන්නේ නැහැ. ඒ ගොල්ලන්ට එන්නට නොදීත් බැලුවා පුලුවන්ද කියා. ඒත් බැහැ. මහ ජනතාව දන්නවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Can you be proud of your performance at Attanagalla when we went to perform *satyagraha* ? I was one of the vitims.

දැන් මේතුමා කියනවා, ශිෂ්‍යයින් කාර් වලින් ගෙනැවිත් සිරිකොතට බැස්සුවා කියා. කාර්වල නොම්මරත් කිව්වා අහවල් අහවල් කාර්වලින් කියා. එමෙන්ම ඒ අය දාමරිකයින් නොවෙයි කියලත් එතුමා පිළිගත්තා.

He himself admitted that he never mentioned those people as being terrorists or criminals but as students. So, there is no charge against them.

එහෙත් මම කියනවා, He employed thugs at Attanagalla පාරවල්වලට ගස් කපා දැම්මා. අහන්න නියතපාල මහතා ගෙන් වේයන්ගොඩ රැස්වීමට යන විට නියතපාල මහතා වේයන්ගොඩ ස්ටේෂ මට මෙහා ගල් පාරවල් කකා සිටින විට කලගෙඩිහේනට ගොස් ඔහු එක්කරගෙන එන්න මට සිදුවුණේ නැද්ද කියා. ඊට පස්සෙ රැස්වීමට යන විට ගාමිණී ජය සූරිය මහතාගේ කාර්එකට උඩරාපොලදී ගැස්සෙව්වා. කවුද ඒවා කළේ? සිල් වන්තයෝද? දාමරිකයෝ නොවෙයිද? ඒ අයට කියන්නේ සිල්වන්තයෝ කියලා ද? අර සිරිකොතට බැස්සවූ ශිෂ්‍යයින් නම් දාමරිකයින් නොවෙයි කියන එක එතුමාම පිළිගත්තා. එහෙනම් අපේ සිරි කොතට දාමරිකයින් බැහැලා නැහැ. එහෙත් ගස් කපන අය නම් කලින් දවසේ පිටවී ගියේ හොරගොල්ල වලව් වෙන්. මගේ බෙන්ස් කාර්එක ගැන, ඒ බෙන්ස් කාර් එකේ ඉදලා එළියට පැමිණි ලොකු එක්කෙනා ගැන විස්තර කියන්නේ නැහැ.

I have a seperate file on the Attanagala doctrine.

මොකක්ද අගමැතිණිය මේ ස්ථානයේ ඉදගෙන කිව්වෙ? පිට පලාත්වල අයට අත්තනගල්ලට එන්න ඉඩ දෙන්නේ නැත කිව්වා.

The Prime Minister of the time had the audacity to come and say in this Assembly that outsiders could not come to Attanagalla. Supposing I take up the same position and say that outsiders cannot come to Hyde Park? Hyde Park is in my area. On the other hand, today I gave them permission to hold their rally at Havelock Park. What a big park it is!

මම අහනවා, ඇයි මේ තරම් ඉක්මනින් ඒ අතීතය අමතක කරන්නෙ කියා. තමුන්නාන්සේලා කළ ඒ වැරදිවලින් අද අප පාඩම් ඉගෙන ගෙන තිබෙනවා. තමුන්නාන්සේලා කළ වැරදි අප කර නැහැ. එහෙනම් අපට චෝදනා කරන්නෙ මොකද? වේදිකාවක් වේදිකා වක් ගානේ ගිහින් අපි අපරාධ කරනවා යයි කියන්නෙ මොකද? මොනවාද අප කළ අපරාධය? මේ රටේ අපරාධ වැළැක් වීමට ක්‍රියා කිරීමද අපරාධය? "ප්‍රේමවතී මනම්පේරිගේ මරණය ගැන මොනවා කරන්නද, විජේසූරිය කියන කෝපරල් කෙනෙක් නැත්නම් කර්නල් කෙනෙකුයි ඒක කළේ. ඒ මිනිහාගෙ තාත්තා යූ. ඇන්. පී. කාරයෙක්. පසුගිය මැති වරණයේදී එහෙම නොවෙද තමුන්නාන්සේලා කිව්වේ? ප්‍රේමවතී මනම්පේරිගෙ තාත්තා වෙන හොර ගැහැණියක් තබා ගෙන ඉන්නවා, වැල්ලවායේ. ඒ ළමයා මළේ ඒ මිනිහා හින්දයි. ඒ පවුල අත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ප්‍රේමදාස මහතා]

හැර දමා තිබුණා. ඒ මිනිහාව ගෙන ගියා, පසුගිය මැතිවරණයේදී නුවරඑළියෙ වේදිකාවලට.

No responsible Prime Minister or Government would have done that. They took a government servant all the way from Wellawaya to Nuwara Eliya in an attempt to disprove what I had been saying from public platforms.

ඒ නඩුවෙ කොපිය උසාවියෙවත් නැහැ. මම එය ඇටෝර්නි ජනරාල්වරයාගෙන් ඉල්ලුවාම කියනවා,

The file is missing. We are examining these cases to give some relief or redress to these families.

ප්‍රේමවතී මනම්පේරිගේ අම්මා ජීවතුන් අතර ඉන්නව. මල්ලිත් ඉන්නවා. මේ නියෝජ්‍ය ඇමතිතුමා කොලොන්නෙ ආසනයට ගිහින් කථාකරන විට මනම්පේරිගේ මල්ලිත් වේදිකාවට ඇවිත් කථා කළා. මම ඇහැව්වා මොකද තාත්තා ගිහිල්ලා තිබෙන්නෙ කියා. "තාත්තා හොඳින් හිටියා නම් මේ විපත වෙන්නෙ නැත" කියා ඔහු මට කිව්වා. ගරු කථානායකතුමනි, මනම්පේරිගේ මරණය සම්බන්ධයෙන් මොනවාද කළේ? උසාවියෙ නඩු පැවරුවෙ 'ඇත්ත' පත්‍රයෙ ඒ පුවෘත් තිය පළ වුණාට පස්සෙ නොවෙසිද? දැන් අපට දූෂිතකම් ගැන චෝදනා කරනවා. වත්තල තරුණයාට මොකද කළේ? ඒ ගැන මම විස්තර කරන කොට නුවරඑළිය මස්කෙළියෙ දෙවන මන්ත්‍රීතුමා (අනුර බණ්ඩාරනායක මහතා) මේ ගරු සභාවෙ සිටියාදැයි මම දන්නෙ නැහැ. කිසි වරදක් නොකළ ඒ

කල් තැබීම

තරුණයා ගෙනැවිත් පුළුවන් තරම් ගහලා ගහලා, නහයෙන් කටින් ලේ පෙරෙන තුරු ගහලා, මළමුත්‍ර යනතුරු ගහලා ඉන් පසුව මේසය ගෙන ඇඟ උඩින් තබා මේසෙ උඩ නැගලා පුළුවන් තරම් වද හිංසා දී සිහිසන් නැති වුණාම සිහිය එනතුරු ඉඳලා අර මේසය අනික් පැත්තට හරවා ලාච්චුව හැර, අර තරුණයාගේ ඇඳුම් සියල්ලක්ම ගලවා දමා ඔහුගේ රහස්‍ය අංග ලාච්චුවට තබන්නට කියලා තිබෙනවා. එහෙම තබද්දී එක පාරටම ලාච්චුව වහලා තිබෙනවා. වාසනාවකට මෙන් ලාච්චුවෙ කඩතොලු වක් තිබී ඔහුගේ ජීවිතය බේරා ගන්නට පුළුවන් වුණත් ඔහුගේ පෞරුෂත්වය එතැනින් ඉවරයි. අන්තිමට ලිපි ගොනුවෙ ලියා තිබෙන්නෙ—a case of mistaken identity.

මේ ගොල්ලන්. දෙන්න පුළුවන් වද හිංසා ඔක්කොම දුන්නා.

What did the hon. Second Member for Nuwara Eliya-Maskeliya (Mr. Anura Bandaranaike) do? The Police Department was under his mother. What action did he take?

අපි අද්‍රත් මොකද කරන්නෙ? අපි ඒ නීතිරීති වෙනස් කළා. ගරු කථානායකතුමනි, උසාවියකට ඉදිරිපත් කරන්නෙ නැතුව කිසිම කෙනෙකු තබා ගන්න බැරි බව තමුන්නාන්සේ දන්නවා ඇති. අන්න ඒ අත්දමටයි අපි වැඩ කර තිබෙන්නෙ. නමුත් ඒවා දුර්වලකම් හැටියට භාර ගන්න නරකයි. සමහර ප්‍රදේශවල දුම්රියට ඇතුළු වී මාල කඩා ගැනීම්, වද හිංසා කිරීම් වැනි නොයෙක් දූෂිත ක්‍රියා සිදු වන බව ඇත්ත. අප වෙනස් කළ නීතිරීතිවලින් ඇතැම් අය අයුතු ප්‍රයෝජන ලබා ගන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

උත්සාහ කරන බව පෙනී යනවා. රටේ සාමය ඇති කිරීම පිණිස කිසියම් පියවරක් ගත යුතුව තිබෙනවා. දේශපාලනය ගැන අපිට වාද විවාද කරන්න පුළුවනි; රණ්ඩු වෙන්න පුළුවනි; රැස්වීම් තබන්න පුළුවනි; ඡන්ද විමසන්න පුළුවනි. මේ සියල්ලක්ම කරන්න රටේ සාමය තිබෙන්න ඕනෑ. නමුත් මෙබඳු වේලාවකදී මෙබඳු දේවල්වලින් ප්‍රයෝජන ගන්න යාම වැරදියි.

විශ්ව විද්‍යාල වසා දැමීම, අභ්‍යාස විද්‍යාල වසා දැමීම අධ්‍යාපනයට කරන අපරාධයක් හැටියට නැතිනම් ඉගෙන ගන්නා ශිෂ්‍යයන්ට කරන හානියක් හැටියට සල කන්න ඕනෑ කරුණකි. අපි මේවා කරන්නෙ ඔවුන්ට ඇති ආදරයටයි. අපට ලැබෙන තොරතුරු අනුව ඒ අස්සට රිංගා ගෙන සිටිනවා, සමහර මැරවර කොටස්. ඒ ශිෂ්‍යයන් නොවෙයි. දේශපාලන අභිමතාර්ථයන් මුදුන් පත් කර ගැනීමට මාන බලන බාහිර පිරිස් ඒ තුළට රිංගා ගෙන සිටිනවා. එම නිසා අපට සිදු වෙනවා, කිසියම් වැඩ පිළිවෙලක් යොදන්නට. ගරු ජනාධිපතිතුමා මේ ගරු සභාවෙ නැතත් එතුමාගෙ මුළු කාලයම යොදන්නෙ, ප්‍රශ්න එකින් එක අරගෙන ඒවා සම්බන්ධයෙන් කිසියම් පියවර ගන්නටයි. අප මේ රටට වගකියන්නට ඕනෑ. අපේ පාලන කාලය අවසාන වී අප රට ඉදිරියට යන විට, 1977 දී තිබුණාට වඩා අමුතු ලංකාවක් අප නිර්මාණය කළායයි ජනතාවට කියන්නට අපට පුළුවන්කමක් තිබෙන්නට ඕනෑ. එසේ නැත්නම් ඇති වන තත්ත්වය මොකක්ද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් අපට කියන්නේ නැවිතත් මේ රටේ භයානක තත්ත්වයක් ඇති කොට පාදිසි නීතිරීති යොදා මේ රට හිරගෙයක් කරන්නද? ආයෙත් මේ රට ලේ විලක් කරන්නද? ජාති භේද වාදය ඇවිස්සීමෙන් සමහරුන් කළ විපත නමුත් නාත්සේලාට මතක නැද්ද? "ස්ටැන්ඩඩයිසේෂන්" එක ඇති කරන් නය කියමින් කරන්නට ගිය දේ මතක නැද්ද? නමුත් නාන්සේලා මෙහි ඇවිත් කතා කරන්න. අපේ අඩුපාඩුකම් පෙන්නන්න. එහෙත්, වගකීමක් ඇතුව එසේ කරන්න. අප විපක්ෂයේ සිටිනා විට කතා කළේ ඒ විධියටයි.

You can quote my speeches at any time. I have been speaking in the same trend. This is a vision in which we believe, and we are pursuing that.

එසේ නැතිව, විපක්ෂයේ සිටියදී එක දෙයකුත් මේ පැත්තටආ විට වෙනත් දෙයකුත් කීමේ ප්‍රතිපත්තියක් අපට නැහැ. විපක්ෂයේ සිටින විට ස්ට්‍රයික් කරපල්ලායි කීමත් මේ පැත්තට ඇවිත් පරිත්‍යාග කරපල්ලායි කීමත් අපේ පිළිවෙල නොවෙයි.

අප රටට සේවයක් කරන්නට ඕනෑ. එසේ කරන බවට අප පොරොන්දුවක් දී තිබෙනවා. විශේෂයෙන් උසස් අධ්‍යාපනයේ උසස් තත්ත්වයක් ඇති කොට යහපත් පුරවැසියන් තනා ගැනීමට අප කටයුතු කරනවා. උසස් අධ්‍යාපනය ලබන අයට යම් යම් අඩුපාඩුකම් තිබෙන්නට පුළුවනි. යම් යම් ප්‍රශ්න තිබෙන්නට පුළුවනි. සමහර ආයතන නොයෙක් විධියේ අසාධාරණකම් කරනවා ඇති. ඒ අපගේ කීමකට නොවෙයි. අපගේ පෙළඹවීමකින් නොවෙයි. සම්පූර්ණ ආයතනයක් විනාශ කරන්නට එක මනුෂ්‍යයෙක් ඇති. අපට ඒ ගැන වගකියන්නට බැහැ. අප ඒ ගැන නිසි පරිදි ක්‍රියා කරන්නට ඕනෑ. එසේ ක්‍රියා කරන විට එක් පිරිසක් ඊට විරුද්ධව ස්ට්‍රයික් කරයි. ඒ අයට ආධාර වශයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ප්‍රේමදාස මහතා]

තවත් පිරිසක් ස්ට්‍රයික් කරයි. කලබැගෑනියක් ඇති වෙ. එතනට දමරික පිරිසකුත් රිංගා ගනියි. එම නිසා ඉතාම සැලකිල්ලෙන් ක්‍රියා කරන්න අපට සිදු වී තිබෙනවා. අපේ රජයේ දර්ශනයත් වැඩ පිළිවෙලත් මේ අනුව පවත්වාගෙන යන බව ප්‍රකාශ කරන අතර, මේ කරුණු ටික කීමට මට අවස්ථාව ලබා දීම ගැන නුවර එළිය මිස්කෙළියේ දෙවැනි ගරු මන්ත්‍රීතුමටත් (අනුර බණ්ඩාරනායක මහතා) ගම්පහ ගරු මන්ත්‍රීතුමාටත් (එස්. ඩී. බණ්ඩාරනායක මහතා) මා විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා.

කල් තැබීම

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

*வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

**ජාතික රාජ්‍ය සභාව ඊට අනුකූලව, අ. භා. 5.25 ට 1978 අප්‍රේල් 6 වන බ්‍රහස්පතින්දා අ. භා. 2 වන තෙක් කල් ගියේ ය.**

*அதன்படி பி. ப. 5.25 மணிக்கு, பேரவை 1978 ஏப்ரில் 6, வியாழக்கிழமை பி. ப. 2 மணிவரை ஒத்திப் போடப்பட்டது.*

*Adjourned accordingly at 5.25 p.m. until 2 p.m. on Thursday, 6th April 1978.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 200/-කි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 175/-කි.) පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 2.50කි. තැපැල් ගාස්තුව ශත 90කි. කොළඹ 1, තැ.පෙ. 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දට පූර්ව දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබාගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

சந்தா : ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 200 - (திருத்தப்படாத பிரதிகள் ரூபா 175/-) ஹன்சாட் தனிப்பிரதி ரூபா 2.50 தபாற் செலவு 90 சதம். வருடாந்த சந்தா முற்பணமாக அத்தியட்சர், அரசாங்க வெளியீட்டலுவலகம், த. பெ. இல. 500, கொழும்பு 1 என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவெம்பர் 30 ந் தேதிக்குமுன் சந்தாப் பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 200/- (For uncorrected copies Rs. 175/-). A single copy of Hansard is available for Rs. 2.50. (Postage 90 cts.) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1. The fee should reach him on or before November 30 each year. Late applications for subscription will not be accepted.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org